| ගොවිසෙත | සුපිරි වාසනා | ලග්න වාසනාව | කෝටිපති කප්රුක | සංවර්ධන වාසනාව | ජයෝදා | ශනිදා වාසනාව | සුපර් බෝල් | ජාතික සම්පත | අද කෝටිපති | වාසනා සම්පත | දරූ දිරි සම්පත |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2020 - 09 - 02<br>දිනුම් වාරය - 2528<br>33 49 55 66<br>අක්ෂරය E | 2020 - 08 - 31<br>දිනුම් වාරය - 1531<br>07 09 18 55<br>සුපිරි අංකය -13 | 2020 - 09 - 03<br>දිනුම් වාරය - 2911<br>41 47 49 56<br>ලග්නය-තුලා<br>විශේෂිත අංක<br>රු 500 ත්‍යාග සඳහා-8563<br>රු 100 ත්‍යාග සඳහා-280 | 2020 - 08 - 21<br>දිනුම් වාරය - 614<br>05 52 70 71<br>ඉංග්‍රීසි අක්ෂරය- I | 2020 - 07 - 31<br>දිනුම් වාරය - 354<br>22 23 40<br>දෛව අංකය - 02<br>අක්ෂරය- L | 2020 - 08- 04<br>දිනුම් වාරය - 1678<br>01 06 36 52<br>අක්ෂරය-I | 2020 - 08 - 01<br>දිනුම් වාරය - 3345<br>26 45 56 62<br>අක්ෂරය - Y | 2020 - 09- 02<br>දිනුම් වාරය - 1203<br>13 43 44 64<br>අක්ෂරය - W | 2020 - 09-02<br>දිනුම් වාරය - 1051<br>6 4 8 3 9 6<br>අක්ෂරය -K | 2020 - 09 - 03<br>දිනුම් වාරය - 1030<br>22 52 69 76<br>අක්ෂරය - B<br>රු 500 ත්‍යාග සඳහා-2242<br>රු 100 ත්‍යාග සඳහා-815 | 2020 - 08 - 31<br>දිනුම් වාරය - 1609<br>20 45 50 66<br>අක්ෂරය - A | 2020 - 07 - 30<br>දිනුම් වාරය - 013<br>04 12 33 63<br>අක්ෂරය - U |

# පොලිස් මාංචු කුට්ටම් දෙකක් සමඟ අයියයි මල්ලියි අත්අඩංගුවට

**ඉංගිරිය මධ්‍යම සමූහ**
**ප්‍රියදර්ශනී කහවල**

පොලිස් දෙපාර්තමේන්තුව සහ බන්ධනාගාර දෙපාර්තමේන්තුව පමණක් භාවිතා කරන මාංචු කුට්ටම් දෙකක් සමග එකම පවුලේ සහෝදරයන් දෙදෙනකු අත්අඩංගුවට ගැනීමට ගල්කිස්ස කොට්ඨාස ක්ෂණික මෙහෙයුම් වැටලීම් ඒකකය පෙරේද (03) සමත්ව තිබේ.

පිළියන්දල, මාකන්දන, විජිතපුර නිවසක තිබී මේ මාංචු කුට්ටම් දෙක සොයාගෙන ඇති අතර, සැකකරුවන් සන්තකයේ තිබී ගංජා ග්‍රෑම් පහක්ද පොලිසිය විසින් සොයා ගෙන ඇත.

අත්අඩංගුවට ගන්නා ලද සොහොයුරන් දෙදෙනා වයස අවුරුදු 27 - 35 අතර පසුවන්නෝ වෙති.

ගංජා සම්බන්ධ මෙහෙයුමකට පොලිසිය විසින් සිදුකරන ලද මේ වැටලීමේදී සිදුකරන ලද වැඩිදුර විමර්ශනයකදී නිවෙසේ කාමරයක සඟවා තිබියදී මේ මාංචු කුට්ටම් දෙක පොලිසියට හමු වී ඇති අතර, ඒවා සැකකරුවන්ට ලැබුණු ආකාරය සම්බන්ධයෙන් පොලිසිය විසින් මේ වනවිට පරීක්ෂණ ආරම්භ කර තිබේ. ගල්කිස්ස කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී රොෂාන් ප්‍රේමරත්න මහතාගේ උපදෙස් පරිදි වැඩිදුර විමර්ශන ක්‍රියාත්මකය.

# රවී - අර්ජුන ඇතුළු 7කගේ රිට් පෙත්සම්වලට විරෝධතා දක්වන්න කල් දෙයි

**නෙල්කා මැදගෙදර**

මහ බැංකු බැඳුම්කර වෙන්දේසි දෙකක දී රුපියල් බිලියන 52කට අධික මුදලක් සාවද්‍ය පරිහරණය කළ බවට සැකපිට තමන් අත්අඩංගුවට ගන්නා ලෙස නියම කරමින් කොටුව මහේස්ත්‍රාත් අධිකරණය නිකුත් කර ඇති වරෙන්තු නියෝගය බල රහිත කරන ලෙස ඉල්ලා හිටපු මුදල් ඇමැති රවී කරුණානායක මහතා සහ පර්පචුවල් ට්‍රෙෂරීස් සමාගමේ අධ්‍යක්ෂ අර්ජුන ඇලෝසියස් ඇතුළු හත්දෙනකු ගොනු කළ රිට් පෙත්සම්වලට එරෙහි විරෝධතා ගොනු කිරීම සඳහා නීතිපතිවරයාට කල් ලබා දීමට අභියාචනාධිකරණය ඊයේ (4) තීරණය කෙළේය.

ඒ අනුව එම විරෝධතා සැප්තැම්බර් 14 වැනි ද හෝ ඊට පෙර ගොනු කරන ලෙස නියම විය.

මෙම පෙත්සම් අභියාචනාධිකරණ සභාපති විනිසුරු ඒ. එච්. එම්. ඩී. නවාස් සහ අභියාචනාධිකරණ විනිසුරු සෝභිත රාජකරුණා යන මහත්වරු හමුවේ ඊයේ (4) කැඳවිණි.

එහිදී නීතිපතිවරයා වෙනුවෙන් පෙනී සිටි නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් මිලින්ද ගුණතිලක මහතා පෙත්සම් සම්බන්ධ විරෝධතා ගොනු කිරීමට කල් ලබා දෙන ලෙස ඉල්ලා සිටියේය.

අධිකරණය එම ඉල්ලීමට අවසර දුන්නේය.

# ප්‍රවීණ චිත්‍රපට අධ්‍යක්ෂ ජයන්ත චන්ද්‍රසිරිගේ මාමණ්ඩිය අභාවප්‍රාප්ත වෙයි



විශ්‍රාමලත් පාඨශාලාචාරිනී මධුමණී හපුආරච්චි මහත්මියගේ දයාබර පියාණන් සහ ප්‍රවීණ චිත්‍රපට අධ්‍යක්ෂ ජයන්ත චන්ද්‍රසිරි මහතාගේ මාමණ්ඩිය වූ විශ්‍රාමලත් විදුහල්පති එච්.ඩී.මනුවෙල් ජෝශප් මහතා අභාවප්‍රාප්ත විය.

මාතලේ පුස්සැල්ලාව මහා විද්‍යාලය , අනුරාධපුර සිවලාකුලම මහා විද්‍යාලය , උස්වැටකෙයියාව මහා විද්‍යාලය, පමුණුගම මහා විද්‍යාලය, මත්තුමගල රතනපාල විද්‍යාලය හා කරුණාරත්න බෞද්ධ විද්‍යාලය ආදී විද්‍යාලවල දීර්ඝ කාලයක් ගුරු සේවයේ නියැලුණු ඒ මහතා මිය යන විට අනූවන වියේ පසුවිය.

සමාජ සේවකයකු සේම සමාජ ක්‍රියාකාරිකයකුද වූ මනුවෙල් ජෝශප් මහතා නිර්මලා ජෝශප්, මහේෂ ජෝශප්,තිල්මිණී ජෝශප්,මධුමණී දරුවන්ගේ දයාබර පියාණන් විය. ඔහු දිවංගත පාඨශාලාචාරිනී ජොස්පි ජෝශප් මහත්මියගේ දයාබර ස්වාමි පුරුෂයාය. දේහය පිළිබඳ අවසන් කටයුතු අද (05) ප. ව. 3.30ට පමුණුගම ශු. ජුසේ මුනිඳුන්ගේ දේවස්ථාන සුසාන භූමියේදී සිදු කෙරේ. දේහය 119 C, ඇලෙන් එගොඩ, පමුණුගම නිවසේ තැන්පත් කර ඇත.

# එජාපයට නව නායකයකු පත් වූ පසු රනිල් උත්තරීතර වෙන්නේ නෑ

**ශිරෝමි අබයසිංහ**

එක්සත් ජාතික පක්ෂයට නව නායකයෙකු පත්වූ පසු පක්ෂයේ උත්තරිතර නායකයා හෝ නායකත්ව මණ්ඩලයේ ප්‍රධානියා ලෙස කටයුතු කිරීමට පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතාගේ අදහසක් නොමැති බව පක්ෂ අභ්‍යන්තර ආරංචි මාර්ග සඳහන් කරයි.

නව නායකකු පත් වුවත් හිටපු නායකයා ඊට ඉහළ තනතුරක් දරනු ඇතැයි පළ වෙන වාර්තා සම්බන්ධයෙන් කරුණු දක්වමින් පක්ෂයේ ජ්‍යෙෂ්ඨයින් පිරිසක් සමග පෙරේද(03) සිය කාර්යාලයේදී පැවති සාකච්ඡාවකදී රනිල් වික්‍රමසිංහ මහතා මේ බව ප්‍රකාශ කර තිබේ.

අලුත් නායකයෙකු පත්වූ පසු තමා වෙන කිසිවෙකු නොව හිටපු නායකයා යැයිද පත්වෙන නව නායකයා ට ඉහළින් උත්තරීතරව සිටීමට හෝ නායකත්ව මණ්ඩල ප්‍රධානියා වීමට නම් මේ ලෝකේ සිට බැරිවේවි යැයිද රනිල් වික්‍රමසිංහ මහතා එහිදි පවසා තිබේ.

නායකත්වය බලාපොරොත්තු වන අය ඒ සඳහා කැම්පේන් කිරීම වැළැක්වීමට නොහැකි බවත් සමහරුන් ප්‍රසිද්ධියේ කරන දේ පක්ෂයට හානිකර බවත් ඔහු එහිදි පෙන්වා දී තිබේ.

නායකත්වය පොරයක් කර ගත්තොත් ජනතාවට එය විකාරයක් විය හැකි බවද නායකයා වීමට නොහැකි අය පක්ෂයේ වෙනත් ඉහළ තනතුරක් ලබා ගැනිමට උත්සාහ කළ යුතු බවද රනිල් වික්‍රමසිංහ මහතාගේ අදහස වී තිබේ. පක්ෂ ව්‍යවස්ථාවට අනුව නායකත්වයට පත්වීමට සිංහල බෞද්ධයකු වීම අනිවාර්ය නොවන බවත් අවශ්‍ය වන්නේ පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ හෝ විධායක මණ්ඩලයේ සාමාජිකයකු වීම පමණක් බවත් වික්‍රමසිංහ මහතා පෙන්වා දී තිබේ.

පසුබිම මෙසේ තිබියදී ඒවායේ සාමාජිකයකු නොවන හිටපු කතානායක කරු ජයසූරිය මහතා නායකත්වය සඳහා ඉදිරිපත් වන බවට ප්‍රකාශ කර ඇති අතර භික්ෂූන්, සරසවි ඇදුරන්, නීතිඥයින් ඇතුළු කණ්ඩායම් කිහිපයක්ම ඒ මහතා පක්ෂ නායකයා විය යුතු බවට විශේෂ ප්‍රවෘත්ති සාකච්ඡා කිහිපයක් ද පැවැත්වූහ.

කරු ජයසූරිය මහතා නායකත්වයට පත් විය යුතු බවට කෘත්‍යාධිකාරී මණ්ඩලයේදී යෝජනා කරනු ලැබුවේ හිටපු අමාත්‍ය රවි කරුණානායක මහතාය. ඒ අනුව රවි කරුණානායක මහතා නායකත්වය සඳහා තරග නොකරනු ඇති බවට බොහෝ දෙනාගේ අදහස වී තිබේ. කෙසේ වෙතත් රුවන් විජේවර්ධන, කරු ජයසූරිය හා වජිර අබේවර්ධන මහත්වරුන් අතර එ.ජා.ප නායකත්වය සඳහා දැවැන්ත වුවත් සීතල අරගලයක් පවතින බව පෙනෙන්ට තිබේ.

## 01 වැනි පිටුවෙන්...

### දූෂණ විරෝධී...

කැබිනට් සංදේශයක් යොමු කරමින් ස්ථාපිත කළ දූෂණ විරෝධී කමිටුව නීත්‍යානුකූල ආයතනයක් නොවන බවත්, එවන් අනීතික ආයතනයක් මගින් රාජපක්ෂවරුන් පමණක් ඉලක්ක කර නඩු පවරා ඇති බවටත්, කොමිසමේ සභාපති විනිසුරු හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු උපාලි අබේරත්න මහතා යොමු කළ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් හිටපු අගමැතිවරයා එසේ පැවසීය.

නෛතිකභාවයක් හිමි ආයතනයකට හෝ ස්වභාවික පුද්ගලයකුට පමණක් පැමිණිලි ඉදිරිපත් කළ හැකි බවට කොමිසම ඉදිරියේ පිළිගත් වික්‍රමසිංහ මහතා, දූෂණ විරෝධී කමිටුව එවන් නෛතික ආයතනයක් නොවන බැවින් පැමිණිල්ල ඉදිරිපත් නොකළ බවත් සඳහන් කළේය.

එම අවස්ථාවේ කොමිසමට ඉදිරිපත් කර තිබූ පැමිණිල්ලක සාක්ෂි සටහනක් පෙන්වා සිටි විනිසුරුවරයා දූෂණ විරෝධී කමිටු කාර්යාලය පැමිණිලි කර ඇත්නම් එය බොරුවක් දැයි වික්‍රමසිංහ මහතාගෙන් විමසීය.

ඊට පිළිතුරු දුන් වික්‍රමසිංහ මහතා නෛතික ආයතනයක් නොවන පුද්ගලයකුට නඩු පැවරිය නොහැකි බවත්, එම කමිටුවට ඉදිරිපත් කළ පැමිණිල්ලක් අමුණා ඇත්නම් එය සාධනීය බවත් සඳහන් කළේය.

### මංගල-ශානි...

යුද හමුද බුද්ධි නිලධාරි කර්නල් ෂම්මි කුමාරරත්න මහතා දේශපාලන පළිගැනීම් පිළිබඳ කොමිසමට කළ පැමිණිල්ල විභාග කිරීමෙන් අනතුරුව මෙම නොතීසිය නිකුත් කළේය.

මංගල සමරවීර හිටපු ඇමැතිවරයා තමන් ඇතුළු බුද්ධි නිලධාරීන්ට බලපෑම් කළ බවත්, කොටි සාමාජිකයින් අසාධු ලේඛනයට දැමීමෙන් තමන්ගෙන් දේශපාලන පළිගැනීම් කළ බවත්, බොරු නඩු පටලවා ඇති බවත් ෂම්මි කුමාරරත්න මහතා දීර්ඝ සාක්ෂියක් ලබා දෙමින් සඳහන් කළේය.

එක්නැලිගොඩ අතුරුදන් කළේ යැයි විමර්ශන කළ ශානි අබේසේකර මහතා තමන් ඇතුළු නිලධාරීන්ට තර්ජනය කරමින් ගෝඨාභය මහතාගේ අණ පරිදි ක්‍රියා කළ බවට බොරු සාක්ෂි ඉදිරිපත් කරන්නැයි විවිධ තර්ජන බලපෑම් කළ බව ද පැවසීය.

### බස්නාහිර පළාතෙන් ...

බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ නියෝග හා උපදෙස් පරිදි පෙරේද (3) උදේ 6 සිට ඊයේ (4) උදේ 5 දක්වා කාලයේ විශේෂ වැටලීම් සිදු කර මෙම අත්අඩංගුවට ගැනීම් සිදු කර ඇත.

ඒ අනුව සැකකරුවන් 177ක් සමග හෙරොයින් ග්‍රෑම් 660යි මිලි ග්‍රෑම් 618ක්, ගංජා කිලෝ 44යි ග්‍රෑම් 302යි මිලි ග්‍රෑම් 539ක් සමග සැකකරුවන් 75ක්, නීති විරෝධී මත් පැන් බෝතල් 825ක් සමග සැකකරුවන් 99ක්, ගෝඩා බැරල් 22ක් සමග සැකකරුවන් 7ක්, අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12යි මිලි ග්‍රෑම් 496ක් සමග සැකරුවන් 8ක් අත්අඩංගුවට ගෙන ඇත.

මීට අමතරව ගංජා මිශ්‍ර මාවා, මදන මෝදක ගුලි, දුම් කුඩු, රා, නීති විරෝධී සිගරට් සමග සැකකරුවන් 20ක් ද අත්අඩංගුවට ගෙන තිබේ.

මෙම වැටලීම් අතර මොරගහහේන පොලිස් ස්ථානය හෙරොයින් ග්‍රෑම් 500යි මිලි ග්‍රෑම් 650ක් සමග සැකකරුවකු සහ සැකකාරියක ද, වැලිකඩ පොලිස් ස්ථානයෙන් හෙරොයින් ග්‍රෑම් 20ක් සමග සැකකරුවකු ද, දෙහිවල පොලිස් ස්ථානයෙන් හෙරොයින් ග්‍රෑම් 19 මිලි ග්‍රෑම් 120ක් සමග සැකකරුවකු ද අත්අඩංගුවට ගෙන තිබේ.

### විස්සෙන් රට...

මෙම සංශෝධනයෙන් ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වග නොකියන, අධිකරණයේ මුක්තිය හිමි අයකු බවට පත්ව ඇති බව ද හෙතෙම පැවසීය.

දිසානායක මහතා මෙසේ පැවසුවේ ඊයේ (4) පක්ෂ මූලස්ථානයේ පැවති මාධ්‍ය හමුවක දීය.

ශ්‍රේෂ්ඨාධිකරණයේ අගවිනිසුරු ඇතුළු විනිසුරුවරුන්, අභියාචනාධිකරණයේ සභාපති ඇතුළු විනිසුරුවරුන් සහ නීතිපතිවරයා පත් කිරීමට ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සභාවට පැවරී තිබූ බලය ජනාධිපතිවරයා පවරා ගැනීම සහ කැබිනට් මණ්ඩලය පත්කිරීමේ බලය, විෂය පැවරීම, ඉවත් කිරීම මුළුමනින්ම ජනාධිපතිවරයා අතට ගෙන තිබීම ගෝත්‍ර යුගයේ ගෝත්‍ර නායකයා අතට සියල්ල පවරා ගැනීමට සමාන තත්ත්වයක් බව ද දිසානායක මහතා පැවසීය.

ජනාධිපතිවරයා අවංක නම් සිදු කළ යුතුව තිබුණේ තමන්ගේ ක්‍රියාවන්හි විනිවිදභාවය පවත්වා ගැනීම හා තමන්ව පරීක්ෂාවට භාජනය වීමට කැමැත්ත ප්‍රකාශ කිරීම වුවද නව සංශෝධනයෙන් පාර්ලිමේන්තුවට වග නොකියන, අධිකරණයේ මුක්තිය හිමි අයකු බවට පත් වී ඇති බව සඳහන් කළේය.

### දේශීය මුදලින්...

ඒ අනුව මාර්ග කිලෝමීටර් ලක්ෂයක් දියුණු කිරීමේ වැඩපිළිවෙළ යටතේ පළාත් සභාවලට අයත් සියලු මාර්ග සහ පළාත් පාලන ආයතනවලට අයත් තෝරා ගත් ප්‍රධාන මාර්ග වැඩි දියුණු කිරීමට තීරණය කර තිබෙන බව ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාව තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධන බළකායේ සභාපති බැසිල් රාජපක්ෂ මහතා පැවසීය.

ඒ මහතා මේ බව සඳහන් කළේ අරලියගහ මන්දිරයේ දී ඊයේ (4) පස්වරුවේ පැවැති මාර්ග කිලෝමීටර් ලක්ෂයක් පුනුරුත්ථාපනය කිරීම සම්බන්ධයෙන් වූ විශේෂ සාකච්ඡාවකට එක්වෙමිනි.

සෞභාග්‍යයේ දැක්ම වැඩපිළිවෙළ යටතේ මෙම වැඩපිළිවෙළ මහාමාර්ග අමාත්‍යාංශය සහ ග්‍රාමීය මාර්ග සහ අවශේෂ පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශයේ මෙහෙයවීම යටතේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය හා දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කෙරෙන අතර, මේ යටතේ පළාත් සභාවලට අයත් මාර්ග සියල්ල කාපට් කර යථා තත්ත්වයට පත්කිරීමට නියමිතය. ඊට අමතරව පළාත් පාලන ආයතනවලට අයත් මාර්ගවලින්, ප්‍රධාන මාර්ග දෙකක් එකතු කරන මාර්ග, ප්‍රධාන නගරවලට සම්බන්ධ වන මාර්ග වැනි විශේෂතා සහිත මාර්ග ද මේ යටතේ වැඩි දියුණු කිරීමට පියවර ගෙන ඇත.

මෙම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ දී ජලසම්පාදන මණ්ඩලය, විදුලිබල මණ්ඩලය වැනි ආයතන සමග සම්බන්ධ වී කටයුතු කිරීමේ වැදගත්කම පෙන්වා දුන් බැසිල් රාජපක්ෂ මහතා මාර්ග සකස් කිරීමේ ප්‍රමුඛතා ලැයිස්තුවක් එම ආයතනවලට ලබාදීම හරහා විටින් විට මාර්ග කැඩීම වෙනුවට මාර්ග සකස් කරන අවස්ථාවේදීම ජල සැපයුම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම ආදී කටයුතු අවසන් කර ගැනීමේ හැකියාව ඇතැයි ද පෙන්වා දුන්නේය.

මාර්ග සකස් කිරීමේ දී පරිසර හිතකාමී භාවය රැක ගැනීමට ප්‍රමුඛතාව ලබාදිය යුතු බව ද, එහි දී මාර්ග දෙපස රටට ගැළපෙන පරිසර හිතකාමී ප්‍රයෝජනවත් ගස් වර්ග පැළ කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු බවද පෙන්වා දුන් බැසිල් රාජපක්ෂ මහතා පැළ වර්ග තෝරා ගැනීමේ දී මී, කුඹුක් ආදී ගස් වර්ගවලට වැඩි අවධානයක් යොමු කරන ලෙස ඉල්ලීමක් කළේය.

මෙම අවස්ථාවට මහා මාර්ග ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු, රාජ්‍ය ඇමැති නිමල් ලන්සා මහත්වරු, පළාත් ආණ්ඩුකාරවරු ඇතුළු රජයේ සහ පළාත් සභා නිලධාරීන් රැසක් සහභාගී වූහ.

### ගුවන් යානා නොපැමිණීමෙන්...

ගුවන් තොටුපළ විවෘතව තබන අවස්ථාවල දී මාසය කට තෙල් ටැංකි දහක් පමණ ප්‍රවාහන කරන අතර, කොරෝනා වසංගත තත්ත්වය හමුවේ තෙල් දුම්රිය ධාවනය සීමා කිරීමෙන් දෙපාර්තුමේන්තුවට මෙම ආදායම් අහිමි වී ඇතැයි අතිරේක දුම්රිය සාමාන්‍යාධිකාරී (වාණිජ) වී. එස්. පොල්වත්තගේ මහතා පැවසීය.

සතියකට තෙල් ටැංකි 25ක් පමණ ප්‍රවාහනය කරන අතර, ගුවන් යානා වැඩිපුර පැමිණෙන අවස්ථාවල දී සතියකට තෙල් ටැංකි 35ක් පමණ රැගත් දුම්රිය ධාවනය කිරීමට සිදුවන බවත් ඔහු කීවේය.

මේ වන විට සතියකට තෙල් දුම්රිය ගමන්වාර 4කට පමණ සීමා වී ඇත.

### හකීම්ගෙන් ...

එමෙන්ම මේ වනවිට අධිකරණවල විභාග වන නඩු සම්බන්ධයෙන් රක්ෂිත බන්ධනාගාර ගත කර සිටින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ ශානි අබේසේකර මහතා ද පාස්කු කොමිසමේ පොලිස් ඒකකය වෙත පැමිණ සිටියේය.

කොමිසම කට දැනුම්දීමකට ප්‍රකාශයක් ලබා දීමට පැමිණ සිටි ඒ මහතා බන්ධනාගාර නිලධාරීන්ගේ දැඩි ආරක්ෂාව යටතේ කොමිසමේ පොලිස් ඒකකය වෙත පැමිණ ප්‍රකාශයක් ලබා දීමෙන් අනතුරුව යළි බන්ධනාගාරය වෙත රැගෙන ගියේය.

### නාකොටික් නිලධාරීන් ...

රුපියල් මිලියන 2945ක් වටිනා හෙරොයින් කිලෝ 294.490ක් අත්අඩංගුවට ගැනීමේ මෙම සිද්ධියට අදාළ ව අත්අඩංගුවට ගෙන සිටින සැකකරුවන් දෙදෙනා නිර්දෝෂී බව ද එම නීතිඥවරයා කොටුව මහේස්ත්‍රාත් රංග දිසානායක මහතා හමුවේ ඊයේ (4) කියා සිටියේය. මෙම මත්ද්‍රව්‍ය කළවම් කර එය මෙම සැකකරුවන් දෙදෙනා විසින් සිදු කළ බව හැඟවීම සඳහා ඔවුන් අත් අඩංගුවට ගත් බව මත්ද්‍රව්‍ය ජාවාරම සම්බන්ධයෙන් දැනට අත්අඩංගුවේ පසු වන පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයේ පොලිස් කොස්තාපල් උදර යන අයගේ ප්‍රකාශයේ සඳහන් බවට රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්රවරයා ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු දන්වා තිබෙන්නේ යැයි ද නීතිඥවරයා පැවැසීය.

මෙම සිද්ධියේ ප්‍රධාන නඩුව කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වන බවත්, එම සිද්ධිය සම්බන්ධයෙන් පොලිස් විශේෂ කාර්ය බළකායේ නිලධාරීන් පවා අත්අඩංගුවට ගෙන ඇති බවත් කියා සිටි ඒ මහතා, නීතිපති දෙපාර්තමේන්තුව වසර දෙකක් තිස්සේ උපදෙස් ලබා නොදෙන්නේ එහි සම්බන්ධතාවක් අනුව බවත් කියා සිටියේය.

මෙම කරුණු ඉදිරිපත් කරමින් සැකකරුවන්ට ඇප ලබා දෙන ලෙස ඒ මහතා මහේස්ත්‍රාත්වරයාගෙන් ඉල්ලා සිටි අතර, ඇප අයදුම්පතක් ඉදිරිපත් කරන ලෙස මහේස්ත්‍රාත්වරයා ඒ මහතාට දැනුම් දුන්නේය.

එමෙන්ම මෙම සිද්ධියට අදාළව අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාර ගත කර සිටින සැකකරුවන් දෙදෙනා තව දුරටත් ලබන සැප්තැම්බර් මස 18 වැනි ද දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කරන ලෙස කොටුව මහේස්ත්‍රාත් රංග දිසානායක මහතා නියෝග කළේය.

ස්කයිප් තාක්ෂණය ඔස්සේ බූස්ස බන්ධනාගාරයේ සිටි සැකකරුවන් දෙදෙනා නිරීක්ෂණය කළ මහේස්ත්‍රාත්වරයා මෙම නියෝගය සිදු කළ අතර, මෙලෙස රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට නියෝග කෙරුණේ මොහොමඩ් බසීර් මොහොමඩ් අජ්මීර් සහ මොහොමඩ් රිලා අහමඩ් රිස්නි නැමැති සැකකරුවන් දෙදෙනායි.

නීතිපතිවරයාගේ උපදෙස් විමසා විමර්ශන ප්‍රගතිය ඉදිරි දින අධිකරණයට දැනුම් දෙන ලෙස ද කොළඹ මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයට මහේස්ත්‍රාත්වරයා නියෝග කළේය.

### නෙයිනගෙ සුදුව...

මේ අතර මරදන එල්ෆින්ටන් රඟහලේ දී අද (5) රෝහණ බැද්දගේ නාට්‍ය නිර්මාණ 'රාළහාමි ' වේදිකා ගත වේ. හෙට (6) ධර්මසිරි බණ්ඩාරනායක නාට්‍ය නිර්මාණය 'ට්‍රෝජන් කාන්තාවෝ' වේදිකා ගත වෙයි.

සෑම නාට්‍යයක්ම පස්වරු 3.30ට සහ 6.30ට වේදිකා ගත කෙරේ.

### රාජපක්ෂවරුන්ට නඩු පැවරීමට...

දූෂණ විරෝධී කමිටුව නෛතික ආයතනයක් නොවන බවට රනිල් වික්‍රමසිංහ මහතාගේ සාක්ෂිය කැඳවීමෙන් පසුව කොමිසමේ සභාපති හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු උපාලි අබේරත්න මහතා මෙම නොතීසිය නිකුත් කළේය.

දූෂණ විරෝධී කමිටුව පිහිටු වූයේ පැමිණිලි ඉදිරිපත් කිරීමට නොව පැමිණිලි බාර ගැනීමේ හා අදාළ අංශවලට යොමු කිරීමේ ක්‍රියාවලියට පමණක් බවට රනිල් වික්‍රමසිංහ මහතා සාක්ෂි ලබාදීමෙන් අනතුරුව මෙම නොතීසිය නිකුත් කළේය.

පුද්ගලයන්ට එරෙහිව පැමිණිලි ඉදිරිපත් කළ හැක්කේ ස්වභාවික පුද්ගලයකුට හෝ නෛතික භාවයක් හිමි ආයතනවලට පමණක් බවට ඊයේ කොමිසම හමුවේ සාක්ෂි ලබාදුන් රනිල් වික්‍රමසිංහ මහතා පිළිගත්තේය.

පුරා පැය දෙකකට ආසන්න කාලයක් වික්‍රමසිංහ මහතා සාක්ෂි ලබාදුන් අතර, දූෂණ විරෝධී කමිටුව පිහිටුවීමට තීරණය ගත් 'ජාතික විධායක සභාව' දේශපාලන සන්ධානයක් බවත්, දේශපාලන සංවිධාන පුද්ගලයන් ඊට ඇතුළත් බවත් සඳහන් කළේය.

ජාතික විධායක සභාව හා දූෂණ විරෝධී කමිටුව පිළිබඳ විමසීම සඳහා වික්‍රමසිංහ මහතා සාක්ෂියට කැඳවා තිබිණි.

### ඉකුත් මාස 15ට...

දැනට ඉතිරිව ඇති මත්ද්‍රව්‍ය නඩු 235ක් සම්බන්ධයෙන් ද නීතිපතිවරයාගේ අධීක්ෂණය යටතේ ලබන 5 හා 6 දිනයන්හි වැඩ අවසන් කිරීමට නීතිපති දෙපාර්තමේන්තුවේ මත්ද්‍රව්‍ය නඩු සම්බන්ධ අංශය කටයුතු කරන බව රජයේ නීතිඥ නිශාරා ජයරත්න මෙනෙවිය වැඩි දුරටත් පැවසුවාය .

එමෙන්ම කළුතර මීගමුව මහර හා හෝමාගම මහාධිකරණවලට අතිරේක අධිනීතිඥවරුන් යෙදවීමට නීතිපතිවරයා තීරණය කර ඇත.

මෙම මහාධිකරණවල නඩු 600කට වඩා ගොඩගැසී ඇති නිසා එම නඩු සංඛ්‍යාව අහවර කිරීම පිණිස නීතිපතිවරයා මෙම තීරණය ගත් බව නීතිපතිවරයාගේ සම්බන්ධීකරණ නිලධරිනිය පැවසුවාය.

### ශ්‍රී ලංකාවට...

කිසියම් තෙල් කාන්දුවක් සිදු වුවහොත් එය පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවට හැකියාව පවතින බව ද ඒ මහතා කීය.

ඉන්ධන රැගත් නිව් ඩයමන්ඩ් නෞකාව මේ වන විට ගොඩබිමට නාවික සැතපුම් 22ක් දුරින් ඇති බවත් එම මුහුදු සීමාවේ දියවැල් අනුව ශ්‍රී ලංකා වෙරළට සමාන්තරව දකුණු දෙසට පාවෙමින් පවතින බවත් ඔහු කියා සිටියේය.

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ එම්.අයි. 17 වර්ගයේ හෙලිකොප්ටර් යානා මගින් ජලය ලීටර් ලක්ෂයකට වඩා නැව මත පතිත කරමින් ගින්න පාලනය කිරීමට පියවර ගෙන ඇතැයි ද ඔහු කීය.

නෞකාව ගිනි ගන්නා විට එහි කාර්ය මණ්ඩලය 23ක් සිටි අතර ඉන් 19 ක් ශ්‍රී ලංකා නාවික හමුදාව සමග සිටින බවත් පිලිස්සුම් ලැබූ පුද්ගලයෙක් කල්මුණේ රෝහලට ඇතුළත් කර ඇති අතර, නැවේ බොයිලේරුවේ සිටි පිලිපීන ජාතික පුද්ගලයා එහි පිපුරුමත් සමග මරණයට පත්ව ඇති බවත් ඒ මහතා පැවසීය.

නෞකාවේ කපිතාන්වරයා ඉන්දීය වෙරළ ආරක්ෂක කණ්ඩායමත් සමග සිටිමින් ඔහුගේ දැනුම අනුව නැවේ ගින්න පාලනය කිරීමට කටයුතු කරන්නේ යැයි ද, ඉන්දියාව ඇතුළු ජාත්‍යන්තර රටවල් මෙම ව්‍යසනය මර්දනය කර ගැනීමට උපරිම සහාය ලබාදීමට එකගතාව පළ කර ඇතැයි ද ඔහු ප්‍රකාශ කළේය.

නැවේ යට කොටස අඩි 60ක් පමණ ගැඹුරට ඇති අතර නැව දෙකට කැඩී යාමේ අනතුරක් නොමැති බවත් නැවෙහි කිසියම් බිඳීයාමක් හේතුවෙන් බොරතෙල් කාන්දු වීමක් වුවහොත් එහි වටා බූම් එක යොද තෙල් කොටු කර ගැනීමේ හැකියාව පවතින් බවත් ඔහු කීය.

ඉන්දීය නාවික හමුදාවේ සහ ඉන්දීය වෙරළ ආරක්ෂක හමුදාවේ යාත්‍රා මගින් මෙම ගින්න පාලනය කිරීමට සහාය ලබා දී ඇති බවත් මෙම තත්ත්වය පාලනය කර ගැනීමට අවශ්‍ය උදව් වෙනත් රටවලින් ලබාදීමට එකගතාව පළ කර ඇති බවත් ඒ මහතා පැවැසුවේය.

නෞකාවේ ගින්න සම්පූර්ණයෙන් නිවා දැමීමෙන් පසුව වෙනත් නෞකාවක් ගෙනැවිත් එහි ඇති තෙල් අනෙක් නැවට මාරු කිරීමේ තාක්ෂණය ලෝකයේ පවතින බව ද ඔහු කීය.

මෙම අවස්ථාවට යුද හමුදාපති ශවේන්ද්‍ර සිල්වා, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ සභාපතිනි නීතිඥ දර්ශනී ලහඳපුර මහත්ම මහත්මීන් ඇතුළු නිලධාරීහු සහභාගී වූහ.

### මන්ත්‍රී ගැටලුව විසඳන්න...

ශ්‍රේෂ්ඨාධිකරණයෙන් සාධාරණයක් ඉෂ්ඨ වෙයි කියා බලාපොරොත්තු වන බව ප්‍රකාශ කළ සභාපතිවරයා පක්ෂයේ හිටපු මහ ලේකම් වේදෙනිගම විමලතිස්ස හිමියන් සම්බන්ධකර ගනිමින් අතුරලියේ රතන හිමියෝ මැතිවරණ කොමිසන් සභාවට ද බලපෑම් කරමින් ජාතික ලැයිස්තු මන්ත්‍රීධූරය කොල්ල කෑමේ උත්සාහයක නිරතව සිටින බව දැන ගැනීමට තිබෙන බව ප්‍රකාශ කළේය.

සභාපතිවරයා එසේ ප්‍රකාශ කළේ ඊයේ (4) කොළඹදී පැවැති මාධ්‍ය හමුවකට සහභාගී වෙමිණි.

රතන හිමිගේ භාරයේ විමලතිස්ස හිමි සිටින බවට තොරතුරු ඇතැයි ද සමන් පෙරේරා මහතා පැවසීය.

### ආනවිළුන්දාව අභය භූමිය...

එලෙස රක්ෂිත බන්ධනාගාරගත කෙරුණේ ආනවිළුන්දව අභය භූමියේ කොටසක් ඩෝසර් කර ඉස්සන් ගොවිපළක් සකස් කිරීම සඳහා අනුබල දුන් බව කියන ව්‍යාපාරිකයා සහ එම භූමිය සකස් කළ බැකෝ යන්ත්‍රකරුවා යන දෙදෙනායි.

## 01 වැනි පිටුවෙන්...

### ගිනි ගත් නැවෙන්...

සමුද්‍රිය, පරිසර හානි වැළැක්වීමට අවශ්‍ය උපරිම ක්රියාමාර්ග ගන්නා ලෙස නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වශයෙන් අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවට උපදෙස් දී තිබේ.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් සිරිනිමල් පෙරේරා මහතා ප්‍රමුඛ අදාළ බලධාරීන්ට අග්‍රාමාත්‍යවරයා ලබා දුන් උපදෙස් අනුව මේ වන විට ඒ සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කර තිබේ.

ඒ අනුව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා සහ අග්රාමාත්‍ය හා නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාගේ ඍජු උපදෙස් මත සමුද්‍රීය ආරක්ෂණ අධිකාරිය (MEPA) සමග තෙල් නෞකාවෙන් සමුද්‍රිය හා පරිසරයට විය හැකි හානි වළක්වා ගැනීමේ සියලු සම්බන්ධීකරණ කටයුතු මේ වන විටත් සිදු කරමින් පවතින බව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් සිරිනිමල් පෙරේරා මහතා කියයි.

දැනට නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යටතේ ඇති සමුද්‍රීය ආරක්ෂණ අධිකාරියේ මූලික මැදිහත් වීමෙන් (MEPA) හා සිද්ධි කළමනාකරණ කණ්ඩායම (IMT), වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, ශ්රී ලංකා නාවික හමුදාව, ශ්රී ලංකා ගුවන් හමුදාව, ශ්රී ලංකා වරාය අධිකාරිය, පරිසර අධිකාරිය, ධීවර දෙපාර්තමේන්තුව, ආපදා කළමනාකරණ දෙපාර්තමේන්තුව, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, වනජීවී දෙපාර්තමේන්තුව, ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව ඇතුළු ආයතන 15ක් ඒකාබද්ධව ආරක්ෂණ වැඩසටහනක්ද සිදුකරමින් පවතී.

### මනුෂට...

මනූෂ නානායක්කාර මහතා හරහා ජපානයේ රැකියාවකට යවන බව පවසා තරුණයන්ගෙන් මුදල් වංචා කිරීමට තැත් කිරීමක් සම්බන්ධයෙන් සැකකරුවකුට එරෙහිව පවරා තිබෙන නඩුවේ පැමිණිල්ලේ පළමුවන සාක්කිකරු ලෙස නම් කර සිටින

මන්ත්‍රීවරයා සාක්කි දීම සඳහා ඊයේ අධිකරණයේ පෙනී සිටීමට නියමිතව තිබුණි.

තංගල්ලේ තරුණයයකු දික්වැල්ලේ මිතුරෙකු සමග ජපන් භාෂාව හදාරා ඇති අතර, දික්වැල්ලේ මිතුරාගේ පියා තංගල්ලේ තරුණයාට ගාල්ල හපුගල පදිංචි වතු අධිකාරිවරයකු හඳුන්වා දී තිබේ. ඔහු මනූෂ නානායක්කාර මහතා මගින් ජපන් රටේ රැකියා ලබා දීමට හැකි බව පවසා ඇත.

ඒ අනුව ඔහු තංගල්ලේ තරුණයාට රුපියල් ලක්ෂ හතරක් මුදලක් අවශ්‍ය බව පවසා ඇත.

පසුව 2019 පෙබරවාරි 23 වැනි දින තරුණයා මුදල් ලබාදීමට ගාල්ලට පැමිණ ඇත. මෙදිනම රාගම තරුණයකු ද මුදල් ලබා දීමට පැමිණ ඇති බව පැමිණිල්ලේ සඳහන්වේ.

එම ස්ථානයට පැමිණි සැකකරු මන්ත්‍රීවරයා නොමැති බවත්, ජපානයට යැවීමට පළමුව රුපියල් ලක්ෂ

දෙක බැගින් ලබා දෙන ලෙසත් පවසා තිබේ.

එම අවස්ථාවේ සැකයක් ඇති වූ තරුණයා තම මිතුරෙකුට දුරකතන ඇමතුමක් දී මේ පිළිබඳ විමසීමේදී මෙය වංචාවක් බවත්, මුදල් ලබා නොදෙන බවත් දන්වා ඇත. පසුව තංගල්ලේ සිට පැමිණි තරුණයා පොලීසියට මේ පිළිබඳ පැමිණිලි කැ ඇත.

පොලීසිය සැකකරු අත්අඩංගුවට ගෙන ඇත.

ඔහුට විරුද්ධව ගොනු කළ නඩුවේ සාක්කිකරුවකු ලෙස මනූෂ නානායක්කාර මහතා ද නම් කර තිබිණි. වැඩිදුර නඩු විභාගය නොවැම්බර් 6 වැනි දිනට කල් තැබිණි.

ගාල්ල පොලීසියේ අපරාධ විමර්ශන අංශයේ උප පොලිස් පරීක්ෂක මහිලාල් මහතා සමග සැරයන් උදය කුමාර පැමිණිල්ල මෙහෙය වූහ.

දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත
35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341
වර්ෂ 2020ක් වූ සැප්තැම්බර් මස 05 වැනිදා සෙනසුරාදා

# මහජන දිනය!

රජය ගෙන ඇති වැදගත් තීරණ දෙකක් කෙරෙහි අද අපගේ අවධානය යොමු කරන්නට කැමැත්තෙමු. පළමු තීරණය වන්නේ මහජන දිනය ද සියලු ආයතනවල උසස් නිලධාරීන් ස්වකීය කාර්යාලවල රැඳී සිටිය යුතුය යන්නය. දෙවන තීරණය වන්නේ ආයතන සතු අබලන් වාහන අලුත්වැඩියා කොට ධාවනය කළ යුතුය යන්නය. මේ තීරණ දෙකෙන් ම පැහැදිලි වන්නේ නාස්තිය දුරුකොට වැඩ කරන රටක් බවට ශ්‍රී ලංකාව පරිවර්තනය කළ යුතු බවය. එහි වාසිය පෙරළා ලැබෙන්නේ ද මහජනයාටමය. රාජ්‍ය ආයතන මහජන මුදලින් නඩත්තු වෙයි. රාජ්‍ය නිලධාරියා ද මහජන මුදලින් නඩත්තු වෙයි. ජනාධිපතිවරයා මෙය නිතර අවධාරණය කරමින් නිලධාරියාගේ වගකීම සිහිපත් කරයි.

නිලධාරීන් මහජනයා නොසලකා හරින්නේද , ඔහු මග හැර සිටින්නේ ද ඉංග්‍රීසි ආණ්ඩු කාලයේ සිටය. ඉංග්‍රීසිකාරයාට යටත් විජිත ගැන ආදරණීය හැඟීමක් ඇති වන්නට හේතුවක් නැත. ඔවුන්ගේ ඉලක්කය වී තිබුණේ වැවිලි ආර්ථිකය ඔස්සේ ලාභ ලැබීම මිස රටේ ජනතාවට සේවා සැලැසීම නොවේ. එහෙත් ඉංග්‍රීසි ආණ්ඩුවෙන් පසු ස්ථාපිත වූ දේශීය රාජ්‍ය සේවාවට රට ගැන හැඟීමක් තිබිය යුතුය. රටේ ජනතාව ගැන හැඟීමක් ද තිබිය යුතුය. ගෙවී ගිය වසර හැත්තෑවකට වැඩි කාල සීමාවේ අපේ රාජ්‍ය සේවාව දෙස බලන විට එබඳු හැඟීමකින් කටයුතු කරන නිලධාරීන් හමු වී ඇත්තේ කලාතුරකින්ය. රාජ්‍ය සේවාවට ඇතුළුවීම භාග්‍යයක් කොට සලකන නිලධාරීහු තමන්ගේ ම වාසි ගැන පමණක් සිතා කටයුතු කළහ.

ඇතැම් ප්‍රදේශවල මහජන ඉල්ලීම් දෙස බලන විට පෙනී යන්නේ ඒවායින් බොහොමයක් පොදු ප්‍රශ්න වන අතර සරල ක්‍රමෝපාය මඟින් විසඳුම් දිය හැකි බවය. එහෙත් විසඳුම් ලැබෙන්නේ නැත. නිලධාරීන් තීරණ ගන්නේ නැත. ඇතැම් නිලධාරීන් මහජනයා හමුවන්නේ නැත. මහජනයාට ඇහුම්කන් දෙන්නේ නැත. මහජනයාගේ අභියාචනා කියවන්නේ නැත. එකම නිලධාරියකු හමුවීමට හත්-අට වරක් කාර්යාලයට යෑමට සිදු වේ. මහජන දිනයක් නම් කර තිබුණ ද නිලධාරීන් එම දිනයට කාර්යාල තුළ නැත. රැස්වීමක්, සම්මන්ත්‍රණයක්, සාකච්ඡාවක් කියමින් මහජනයා මග හැර සිටීමේ අවස්ථාව නිලධාරීන්ට තිබේ. මහජනයා රැස්වීම් ගැන දන්නේ නැත. සම්මන්ත්‍රණ ගැන දන්නේ නැත. දීර්ඝ කාලයක් පුරාවට නිලධාරීන් විසින් මහජනයා මුළාවේ දමනු ලැබේ.

සමාජවාදී ක්‍රමය යටතේ සෝවියට් දේශයේ නිලධාරි පැළැන්තිය අතිශය බලයක් අතට ගෙන ක්‍රියා කළේය. සාමාන්‍ය ජනතාවගේ දෛනික ජීවිතයේ කටයුතු පාලනය කරන තරමට නිලධාරී පන්තියේ බලය උත්සන්න විය. මෙහි අවසානය සටහන් වූයේ සෝවියට් ආර්ථිකය බිඳ වැටීමෙන්ය. නිෂ්පාදන ක්‍රියාවලිය, ගබඩා කිරීම, බෙදා හැරීම, වෙළෙඳපොළ යන්ත්‍රණය මුළුමනින්ම පාහේ නිලධාරීන් අත පැවැතිණි. නිලධාරී පන්තියේ වැඩි දෙනා දූෂිතයෝ වූහ. 1991 සෝවියට් දේශය බිඳ වැටීමෙන් පසු නිලධාරී පැළැන්තියේ ක්‍රියාකාරකම් විවේචනයට ලක් වුවද ඒ වන විට පෙරහර ගොස් අවසන්ය. නිලධාරීන්ට රටක් ඇති කළ හැකිය. රටක් නැති කළ හැකිය. පාලකයන් මේ බව වටහාගෙන නිලධාරී පන්තිය හැසිරවිය යුතුය.

දිවයිනේ සෑම පළාතකම ජනී-ජනයාගේ ප්‍රධාන ගැටලුවක් බවට ඉඩම් ප්‍රශ්නය පත් වී ඇත. අධිකරණවල ඇති ඉඩම් නඩුවල ප්‍රමාණයෙන් ද ඉඩම් ප්‍රශ්නයේ ස්වරූපය වටහා ගත හැකිය. අපේ රටවල මිනිසා සතු ප්‍රධාන සම්පත ඉඩම් යැයි කියන්නට පුළුවන. එහි වටිනාකම දිනෙන්-දින ඉහළට යයි. ගැටලුව ඇත්තේ තමා ජීවත් වන භූමියේ නීත්‍යානුකූල අයිතිය පවා ඇතැමුන්ට අහිමි වී තිබීමය. නීති පාඨවලට අනුව නිශ්චිත කාලයක් ජීවත් වූ භූමිය අදාළ පුද්ගලයාට හෝ පවුලට හෝ අයිති විය යුතුය. එහෙත් එබඳු ක්‍රමයක් ප්‍රායෝගික ලෙස ක්‍රියාත්මක වන්නේ නැත. අගමැතිවරයා මෑතකදී පෙන්වා දුන්නේ ග්‍රාමීය අංශයේ බරපතළ ගැටලුවක් හැටියට ඉඩම් ප්‍රශ්නය පවතින බවය. මේවා විසඳීමේ උපාය මාර්ග නිලධාරීන් සතු විය යුතුය. රාජ්‍ය සේවය පවතින්නේ එබඳු ගැටලු විසඳීම සඳහා ය.

ප්‍රේමදාස මහතාගේ ආණ්ඩු සමයේ ජනපති ජංගම සේවය නමින් වැඩසටහනක් ක්‍රියාත්මක විය. එහි අරමුණු ලෙස සටහන් වී තිබුණේ රජයේ ආයතන වෙතින් ලබා ගත යුතු සේවය එකම දිනයකදී ක්ෂණිකව ලබා දීමය. ජනපති ජංගම සේවා පැවැත්වීම සඳහා ප්‍රේමදාස රජය විශාල මුදලක් යට කළේය. රාජ්‍ය ආයතනවල නිලධාරීන් අවංක සේවයක යෙදුණේ නම්; ජනපති ජංගම සේවා පැවැත්වීමේ අවශ්‍යතාවක් නැත. නිලධාරිවාදය පවතින කිසිදු රාජ්‍යයක් දියුණු වන්නේ නැත. මැලේසියාව ගොඩනැගූ මහතීර් බොහොමඩ් මහතා පළමුව බලයට පත් වූ අවස්ථාවේ රාජ්‍ය සේවය නිවැරැදි තැනකට ගෙන ආවේය. ඉතා දූෂිතව පැවැති මැලේසියානු රාජ්‍ය සේවය පසුව ලෝකයේ කාර්යක්ෂම රාජ්‍ය සේවාවක් බවට පත් විය. ඒ රටේ දියුණුවේ පදනම ද එයම විය.

රාජ්‍ය ආයතනවලට අයත් වාහන පත්දහස් ගණනක් ආයතන පරිශ්‍ර තුළ දිරාපත් වෙමින් පවතින බව වාර්තා වී ඇත. මේ වාහනවලින් බොහොමයක ඇත්තේ සුළු අඩුපාඩුය. තවත් වාහන හොඳ අලුත් වැඩියාවකින් පසු ධාවනය කළ හැකිය. රජය මේ සම්බන්ධයෙන් ගෙන ඇති තීරණයට අනුව වාහන භාරදහස් ගණනක් අලුත්වැඩියා කිරීමට නියමිතය. අලුත් වැඩියාවට අවශ්‍ය මුදල් ගෙවීමේ හැකියාව නැති ආයතන තිබෙන්නට පුළුවන. එම ආයතනවල වාහන අලුත් වැඩියාව සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව මුදල් සපයයි. මෙලෙස අලුත්වැඩියා කරන වාහන විවිධ ආයතනවල සේවා සඳහා යොදා ගැනීමට ද නියමිතය. මෙය ඉතා කාලෝචිත පියවරක් වන්නා සේම බුද්ධිමය පියවරක් ද වන්නේය. රාජ්‍ය ආයතන වාහන සඳහා වැය කරන නාස්තිකාර වියදම් නැවැත්විය යුතුය. එය රට ගොඩනැගීමට අදාළ උපාය මාර්ගයකි.

දූෂණය, නාස්තිය, වංචාව තුරන් කළ හොත් රාජ්‍ය ආයතන බොහොමයක් ලාභ ලබන තැනකට ගෙන යා හැකිය. මේ ආයතනවල නිලධාරීන් අවංක රාජ්‍ය සේවයක නිරත වන්නේ නම්; රටේ සංවර්ධනයට බලවත් ශක්තියක් ඒ ඔස්සේ ගොඩනැගෙනු ඇත. රටක් දියුණු කිරීම සාමූහික ක්‍රියාවලියකි. රටේ නායකයන්, දේශපාලකයන්, ආයතන ප්‍රධානීන් පමණක් නොව; මහජනයා පවා සාමූහික ක්‍රියාවලියට එක් විය යුතුය. මේ අපෙ රට යන්න ද අප රට වෙනුවෙන් යමක් කළ යුතුයි යන්න ද මන්ත්‍රයක් සේ ජප කළ යුතු කාලය එළැඹ තිබේ.

### දිල්රුගෙ සීපද

වඩු වැඩෙන් දිවි රකින පිරිසට පහසුකම් සලසනු සිතා
දැව ප්‍රවාහන නීති ලිහිලක් වීම නම් සුදුසුය ඉතා
ඒත් මිනිසුන් හුස්ම ගන්නේ ගස් කොළන් හින්දයි සිතා
දෙකම සමබර කළ යුතුයි අපි හැමෝගෙම යහපත පතා



# ලෝකය අඩපණ කරන කොවිඩ් තවමත් නිදැල්ලේ

අමෙරිකා ජනාධිපතිවරණයේ උණුසුම මැද කැලිෆෝනියා ප්‍රාන්තයේ කොවිඩ් ආසාදිතයන් සංඛ්‍යාව 700,000 ඉක්මවිය. එරට බොහෝ ප්‍රාන්තවල ආසාදිතයන් සංඛ්‍යාව අඩුවෙමින් තිබියදී ඩැකෝටා ප්‍රාන්තයෙන් ද වාර්තාගත නව ආසාදිතයන් සංඛ්‍යාවක් වාර්තා වේ. අගෝස්තු මැදදී කැලිෆෝනියාවෙන් දෛනිකව වාර්තා වූ ආසාදිතයන් ගණන 9000 ඉක්මවිය. අගෝස්තු අග වන විට එය 5500ට ආසන්න සංඛ්‍යාවකි. කෙසේ වුවද අගෝස්තු මැදදී කැලිෆෝනියා ප්‍රාන්තයෙන් වාර්තා වූ ආසාදිතයන් ගණන 600,000ක් පමණ වේ. දෙසතියක කාලසීමාවක් තුළ එම සංඛ්‍යාව 100,000කින් වැඩි වී ඇති අයුරු මේ සංඛ්‍යාලේඛන මඟින් දිස් වේ.

### ඉන්දියාවට බරපතළයි

අමෙරිකාවේ සමස්ත ආසාදිතයන් සංඛ්‍යාව හැටලක්ෂය ඉක්මවා ඇති අතර, ඉන් සුවය ලබා ඇති සංඛ්‍යාව විසිදෙලක්ෂයක් පමණ වේ. එරට කොවිඩ් මරණ සංඛ්‍යාව 185,000 ඉක්මවා ඇත. මේ වන විට කොරෝනා ව්‍යාප්තියේ කේන්ද්‍රය බවට පත් වී ඇති බව පෙනෙන ඉන්දියාවේ සමස්ත ආසාදිතයන් ගණන හතළිස් ලක්ෂයකට ආසන්නය. සුවය ලබා ඇති සංඛ්‍යාව තිස්ලක්ෂයක් පමණ වේ. මරණ සංඛ්‍යාව 67,000 ඉක්මවා ඇත. එරටින් පළමු රෝගියා වාර්තා වූයේ පෙබරවාරි මැදදීය. දෙමසක් පමණ ගත වන තුරු ඒකාකාරව සාමාන්‍ය වර්ධනයක් පෙන්වමින් ඇති වූ තත්ත්වය මැයි මස අග සිට ක්‍රමයෙන් ඉහළ ගිය අතර, ජූලි මස මැද සිට ශීඝ්‍රයෙන් ඉහළ ගියේය. මේ වන විට දෛනිකව වාර්තා වන ආසාදිතයන් ගණන ලක්ෂයකට ආසන්නය. දස දිනකදී ආසාදිතයන් මිලියනයක් පමණ වාර්තා වන තරමටම තත්ත්වය බරපතළ වී තිබේ. හිටපු ඉන්දීය ජනාධිපති ප්‍රණාබ් මුඛර්ජී ද කොරෝනා වයිරසයේ ගොදුරක් වී ජීවිතයෙන් සමු ගත්තේය.

ගෝලීය තත්ත්වය සලකන විට සමස්ත ආසාදිතයන් ගණන දෙකෝටි පනස්ලක්ෂය ඉක්මවා තිබේ. ඉන් සුවය ලබා ඇති පිරිස එක්කෝටි හැත්තෑ පන්ලක්ෂයකට ආසන්නය. ලොව පුරා වාර්තා වන මරණ සංඛ්‍යාව 850,000 ඉක්මවා ඇත.

මිලියන ගණනින් ආසාදිතයන් සංඛ්‍යාව වාර්තා වී ඇත්තේ රටවල් 4කය. ලෝකයේ වැඩිම ආසාදිතයන් ගණන ආමෙරිකා එක්සත් ජනපදයෙන් වාර්තා වන අතර, දෙවැනි තැන සිටින්නේ බ්‍රසීලයයි. එරට ආසාදිත ගණන හතළිස් ලක්ෂයක් පමණ වේ. තෙවැනි තැන සිටින ඉන්දියාව ද ඊට ආසන්නව සිටියදී සිව්වැනි තැන සිටින රුසියාවේ ආසාදිතයන් ගණන දසලක්ෂයක් පමණ වේ.

### ආර්ථිකයේ කඩාවැටීම

වයිරස ව්‍යාප්තිය ආරම්භ වූ චීනයේ මෙතෙක් වාර්තා වී ඇත්තේ ආසාදිතයන් 90,000 ට ආසන්න සංඛ්‍යාවකි. ඉන් 80,000ක් පමණ සුවය ලබා ඇති අතර, මරණ සංඛ්‍යාව 4700ක් පමණ වේ.

ලෝක ආර්ථිකයට කොවිඩ් 19 මගින් එල්ල කළ බලපෑම බරපතළය. සංචාරක ව්‍යාපාරය දරුණු ලෙස කඩා වැටිණි. ලෝක ආර්ථික බලවතා වන අමෙරිකාවේ ඉතා අයහපත්ම බලපෑම සහිත කාර්තුව වාර්තා වන්නේ ඉතිහාසයේ වාර්තාගත පසුබෑමක් ද සහිතවය. විරැකියාව දරුණු අන්දමින් ඉහළ ගොස් ඇත්තේ මිලියන ගණනක් රැකියා වියුක්තිකයන් බවට පත් කරමිනි. මේ තත්ත්වය ඉන්දියාවේ ද අයහපත්ය. ජූනි මාසයෙන් අවසන් වූ කාර්තුවේදී වාර්ෂික වර්ධනය 24%කින් පමණ පසුබා ඇති බව පැහැදිලි විය. වසර කිහිපයක් තිස්සේ අඛණ්ඩව මන්දගාමී වූ එරට ආර්ථිකය මේ වසරේ පළමු කාර්තුව අවසන් වන විට පෙන්වූයේ ද 3%ක පමණ වර්ධනයකි. එරට ආයෝජන 47%කින් පමණ ඇනහිට තිබේ. කෙසේ වුවද ලොක්ඩවුන් සමයේදී ද කෘෂිකාර්මික කටයුතු කරගෙන යාමට අවසර හිමි වූ බැවින් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ 3.4%ක වර්ධනයක් පෙන්නුම් කර ඇත.

ඉන්දියානු ආර්ථිකයේ මෙවැනි බරපතළ පසුබෑමක් ඇති වී ඇත්තේ එරට කාර්තුමය දත්ත නිකුත් කිරීම ඇරැඹූ 1996න් පසු පළමු වතාවටය. මීට පෙර අවසන්වරට එරට ආර්ථිකයේ දරුණු බිඳ වැටීමක් ඇති වූයේ 1980 දී වන අතර එය නිදහසින් පසු ඉන්දියාව මුහුණ දුන් දරුණුම අවපාතයයි. කොවිඩ් 19 හේතුවෙන් මෙතෙක් ආර්ථික අවපාතයක් ගැන වාර්තා නොවුණ ද ආර්ථික විශේෂඥයන් බිය පළකරන්නේ මීළඟ කාර්තුවේදී ද මෙවැනිම පසුබෑමක් ඇති වුව හොත් එරට ආර්ථිකය අවපාතයක් කරා ගමන් කරනු ඇතිය යන්න ය.

### කඩාවැටෙන සංචාරක කර්මාන්තය

කොරෝනා ගෝලීය වසංගතය හමුවේ බරපතළ අන්දමින් කඩා වැටීමට ලක් වූ ක්ෂේත්‍ර අතර, සංචාරක කර්මාන්තය ද තිබේ. එය අනපේක්ෂිත ප්‍රපාතයකි. මේ වසරේ මුල් කාර්තුවේදී එම පසුබෑම එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානය (UNWTO) මඟින් ගණන් බලා ඇත්තේ 22%ක් වශයෙනි. මාර්තු මාසයේදී සංචාරක පැමිණීම් 57%කින් අඩාල විය. එය සෘණ අගයකි. එම ප්‍රතිශතය අන්තර්ජාතික වශයෙන් සංචාරක පැමිණීම් මිලියන 67ක අඩු වීමකි. එම ආර්ථික



**කොරෝනා ගෝලීය වසංගතය හමුවේ බරපතළ අන්දමින් කඩා වැටීමට ලක් වූ ක්ෂේත්‍ර අතර, සංචාරක කර්මාන්තය ද තිබේ. එය අනපේක්ෂිත ප්‍රපාතයකි. මේ වසරේ මුල් කාර්තුවේදී එම පසුබෑම එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානය (UNWTO) මඟින් ගණන් බලා ඇත්තේ 22%ක් වශයෙනි.**

හානිය ඇ. ඩො. බිලියන 80ක් පමණ වේ. වර්තමාන ගෝලීය සන්දර්භය යටතේ ජාත්‍යන්තර වශයෙන් සංචාරකයන්ගේ පැමිණීම් 58% - 78% අතර අගයකින් මන්දගාමී වනු ඇතැයි UNWTO පුරෝකථන කර තිබේ.

එම වාර්තා අනුව මේ වසරේ අප්‍රේල් වන විට ලොව සංචාරක ගමනාන්ත 100%කින්ම වසා දමා තිබිණි. රටවල් 97ක් එනම්, 45%ක් මුළුමනින්ම හෝ අර්ධ වශයෙන් සිය ගුවන් තොටුපොළ වසා දැමීය. රටවල් 65 ක් එනම්, 30%ක් මුළුමනින්ම හෝ අර්ධ වශයෙන් ජාත්‍යන්තර ගුවන් ගමන් පැමිණීම් අත්හිටුවීය. රටවල් 39ක් සිය දේශ සීමා වසා දැමුවේ එම ප්‍රතිශතය 18%ක් ලෙස සටහන් කරමිනි.

2020 පළමු කාර්තුවේදී ආසියා - ශාන්තිකර කලාපයේ පමණක් එනම්, කොවිඩ් 19 හේතුවෙන් ලොව පළමුවෙන් බලපෑමට ලක්වූ කලාපයේ සංචාරක පැමිණීම්වල අඩාලවීම 35%කි.

මැයි - ජූනි මාසවල පටන් එතෙක් සෘණ අගයක්ව පැවැති සංචාරක පැමිණීම් කෙමෙන් කෙමෙන් වර්ධනය වීමට පටන් ගත්තේ ලොක්ඩවුන් තත්ත්වයේ තිබූ රටවල් ක්‍රමයෙන් නිදහස් වීමත් සමගය. මැයි - ජූනි එම වර්ධනය 3%ක් වූ අතර, ජූලි - සැප්තැම්බර් 24% වනු ඇතැයි අපේක්ෂිතය. 2021 වසරේදී ද එය ඉහළ යනු ඇත්තේ 39% දක්වා පමණ යැයි පුරෝකථන කෙරී තිබේ. කෙසේ වුවද විදේශීය රටවල සංචාරයේ යෙදීම වෙනුවට දේශීය සංචාරක ව්‍යාපාරයේ පැහැදිලි වර්ධනයක් ඇති වී තිබේ. මැයි - ජූනි මාසවල 14%ක් වූ එය ජූලි - සැප්තැම්බර් 45% දක්වා ඉහළ යන තත්ත්වයක් තිබේ. නැවතත් මේ වසරේ අවසන් කාර්තුවේදී දේශීය සංචාරකයන් අභිබවා විදේශීය සංචාරකයන් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### කොවිඩ් එන්නත

මෙහිදී යුරෝපයෙන් යළිත් නව ආසාදිතයන් වාර්තා වීම ගැන අවධානය යොමු කර තිබීම වැනි කාරණා ද සැලකිල්ලට ගැනීමට සිදු වේ. යම් හෙයකින් යළිත් වරක් ගුවන් ගමන් සීමා වුවහොත් එය සංචාරකයන්ගේ පැමිණීම් තවදුරටත් අඩාල කිරීමට හේතු වනු ඇත.

ගෝලීය වශයෙන් සංචාරක කර්මාන්තයට ඇති වූ මෙම බලපෑම ඉතිහාසයේ එබඳු දරුණුම බලපෑම බව පෙනෙන්නේ ගුවන් ගමන් පැමිණීම් බිලියනයක් පමණ මෙම ගෝලීය වසංගතය හේතුවෙන් අවලංගු වූ බැවිනි. මෙම ආර්ථික අලාභය ඇ. ඩො. ට්‍රිලියනය ඉක්මවා තිබේ. සංචාරක කර්මාන්තය මුහුණ දුන් මෙම කඩාවැටීම තුළ එය ආශ්‍රිත සෘජු රැකියා මිලියන 100 - 120ක් අතර ප්‍රමාණයක් අවදානමට ලක්ව ඇත.


21 වැනි සියවසේදී ලෝකයම මුහුණ දුන් දරුණුම වසංගත තත්ත්වය හමුවේ අපේක්ෂා දල්වා සිටින්නේ කොවිඩ් 19 ට එරෙහි එන්නතක් සම්බන්ධයෙනි. ලෝක සෞඛ්‍ය සංවිධානය මෙන්ම අමෙරිකාව, රුසියාව ඇතුළු රටවල් ගණනාවක් එවැනි එන්නතක් සොයා ගැනීමේ යෙදී සිටියහ. මීට සති කිහිපයකට පෙර වාර්තා වූ සුබ පණිවිඩය වූයේ රුසියාව කොවිඩ් 19ට එරෙහි එන්නතක් සාර්ථකව අත්හදා බලා ඇති බවයි. එන්නත පිළිබඳ විශ්වාසය තහවුරු කිරීම වෙනුවෙන් එය ජනාධිපති ව්ලැදිමීර් පුටින්ගේ දියණියට ලබා දුන් පුවත ද වාර්තා විය. එරට සෞඛ්‍ය අමාත්‍ය මිහායිල් මුරෂොකෝ ඉකුත් සඳුදා කියා සිටියේ මෙම එන්නත මේ මාසයේ පටන් තොග වශයෙන් බෙදාහැරීම අරඹන බවයි. Sputnik-v වශයෙන් එය නම් කර තිබේ. ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන රුසියානුවන් අතර, එය ලබන මාසයේ පටන් දීමට නියමිතය. එහිදී සෞඛ්‍ය සේවකයන්ට හා ගුරුවරුන්ට ප්‍රමුඛත්වයක් ලබා දෙනු ඇතැයි සඳහන් වේ. මේ වන විටත් 3 වැනි අදියරේ පරීක්ෂණ කටයුතු සඳහා ඉදිරිපත් වූ රුසියානුවන් 40,000ක් අතරින් 2500 ක් තෝරාගෙන ඇත. තවත් ප්‍රතිශක්තිකරණ එන්නත් ලියාපදිංචියේ ඇති අතර, නොවැම්බර් - දෙසැම්බර් වන විට උපරිම ධාරිතාව කරා ළඟා වීමට හැකි වෙතැයි සෞඛ්‍ය ඇමැතිවරයා විශ්වාසය පළ කරයි. දැනටමත් රටවල් 20 කට වැඩි ගණනකින් රුසියාවට ඇණවුම් ලැබී තිබේ.

### වැරදුණු තැන්

අමෙරිකාව ද තමන් හඳුන්වා දුන් එන්නත නොවැම්බර් 1 වැනිදා සිට බෙදාහැරීමට සූදානම් වන්නැයි ප්‍රාන්ත බලධාරීන්ගෙන් ඉල්ලීමක් කරයි. අගෝස්තු 27 දිනැතිව එරට රෝග පාලන හා වැළැක්වීමේ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ රොබට් රෙඩ් ෆීල්ඩ්ගේ අත්සනින් ප්‍රාන්ත වෙත යොමු කළ ලිපියකින් මේ බව දන්වා තිබේ. මේ සඳහා සහාය වන ලෙසට ද ඉන් ඉල්ලා ඇත.

මේ සියල්ලෙන් පෙනෙන්නේ ලෝකය තවමත් කොවිඩ් 19 පරාජය කිරීම සඳහා සටනේ යෙදී සිටින බවය. කොවිඩ් වසංගතයෙන් පසු ලෝකය පිවිස සිටින්නේ පශ්චාත් කොවිඩ් නව සාමාන්‍ය යුගයට (Post Covid new normal era) බව කියැවේ. මෙම නව තත්ත්වය යටතේ සමස්ත ලෝකයටම තමන්ට වැරදුණු තැන් පිළිබඳ සාවධානව සිතා බැලීමට සිදුව ඇත. මිහිතලය යනු මිනිසාට පමණක් අයත් සම්පතක් නොවන බව වැදගත්ම කාරණයයි. මිනිසාගේ පැවැත්ම මහ පොළොවට දරාගත හැකි එකක් නොවීම මෙවැනි වසංගත හෝ අනෙකුත් ස්වභාවික ආපදා මඟින් ඇතිකරන බලපෑම් වඩාත් වේදනාකාරී මීමට හේතු වී තිබේ. එහි වරද සොබාදහම මත පැටවීමට ලෝකයට නොහැකිය.

**ධම්මික සෙනෙවිරත්න**



# ජනපතිගේ නිවැරැදි නායකත්වයෙන් ජනතාවගේ ජීවිත බේරුණා

## ඇමැතිනී පවිත්‍රා වන්නිආරච්චි

**බොරලැස්ගමුව සමූහ - සෙනෙවිරත්න කහටපිටිය**

ලෝකයේ රටවල් අතුරින් කොවිඩ්-19 සමාජයෙන් සම්පූර්ණයෙන් මර්දනය කළ එකම රට ශ්‍රී ලංකාව බවත්, ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ නිර්භීත ඍජු තීරණ ගැනීමේ නායකත්වය යටතේ අපේ රජය කණ්ඩායමක් වශයෙන් සාමූහිකව ක්‍රියා කළ නිසා ශ්‍රී ලාංකික ජනතාවගේ සෞඛ්‍ය රැකගෙන දිවි ගලවා ගැනීමට හැකිවූ බවත් සෞඛ්‍ය ඇමැතිනී පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය ප්‍රකාශ කළාය.

ඇමැතිවරිය මේ අදහස් ප්‍රකාශ කළේ පසුගියද (03) කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල වේරහැර රෝහලේ නව රුධිර කාන්දු පෙරණ ඒකකය විවෘත කිරීමෙන් අනතුරුව පැවති උත්සවය අමතමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරිය මෙසේ ද කීවාය.

'කොවිඩ්-19 නිසා දැනට ලක්ෂ දහයකට අධික සංඛ්‍යාවක් මරණයට පත්ව තිබෙනවා. ඒත් අපේ රටේ එම රෝගයෙන් මරණයට පත් වූ සංඛ්‍යාව ඉතාම සුළු පිරිසක්. එසේ වූයේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ කාලෝචිත සැලසුම් නිසයි. ජනාධිපතිවරයා ක්‍රියා කළේ මේ රටේ ජනතාව මේ වසංගතයෙන් කෙසේ හෝ බේරා ගන්නවා කියන තිර අධිෂ්ඨානයෙනුයි.

ගෝඨාභය රාජපක්ෂ මහතා ආරක්ෂක ලේකම් වශයෙන් කටයුතු කරන කාලයේදී ආරම්භ කළ මේ රෝහල කලාපයේ හොඳම රෝහල බවට පත් කිරීමේ අධිෂ්ඨානයෙන් ක්‍රියා කළා. මේ කෙටි කාලයේ මේ රෝහල සියලුම අංගවලින් සම්පූර්ණ රෝහලක් බවට පත් කර තිබෙනවා. සියලුම ගොඩනැඟිලි පහසුකම්වලින් සම්පූර්ණ වුවත් මානව සම්පත අතින් හිඟයක් පවතිනවා. අලුතින් පත්වීම් ලබන වෛද්‍යවරුන් ද මේ රෝහලට ලබා දෙනවා. රෝහලේ සංවර්ධන කටයුතු සැලසුම් කිරීමට අමාත්‍යාංශයේ ලේකම්වරුන් සහ හමුදා අංශයේ නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත් කර එම කමිටුවේ මා ද කටයුතු කිරීමට බලාපොරොත්තු වෙනවා.'

**රෝහල් අධ්‍යක්ෂ නාමල් විජේසිංහ මහතා**

'මේ කොතලාවල ආරක්ෂක රෝහල දැනට සෑම අතින්ම අංග සම්පූර්ණයි. වකුගඩු සායන අංශයට විශාල අඩුපාඩුවක් වූ රුධිර කාන්දුකරණ ඒකකය අද විවෘත කිරීමෙන් මේ රටේ දුප්පත් ජනතාවට විශාල සහනයක් සැලසෙනවා.'



# පොල් වගාකරුවන් දැනුම්වත් කිරීමේ වැඩසටහනක් 8 දා අගලවත්ත පිඹුරදී

**පී. එම්. පත්මසූරිය - අගලවත්ත සමූහ**

අන්තර්ජාතික පොල් දිනයට සමගාමීව දීප ව්‍යාප්තව ක්‍රියාත්මක වූ පොල් සතියේ අවසන් දිනය වන මේ මස 08 වැනි දින පෙ. ව. 9.00ට පොල් වගාව සහ පොල් අස්වනු දියුණු කරගැනීමේ ක්‍රමෝපායන් පිළිබඳ වගාකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහනක් අගලවත්ත පිඹුරදී පැවැත්වීමට කටයුතු යොදා තිබේ.

පොල් වගා කිරීමේ මණ්ඩලයේ ව්‍යාප්ති සඳහා වෙන් කළ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වන මේ වැඩසටහන අගලවත්ත පොල් සංවර්ධන නිලධාරී ඩී. එස්. විතාන මහත්මියගේ මූලිකත්වයෙන් සංවිධාන කෙරේ.

පොල් වගාව පිළිබඳව උනන්දුව ඇති සියලු දෙනාට මේ සඳහා සහභාගී විය හැකිය.

මෙහිදී පවතින පොල් වගාවල අස්වනු වැඩි කරගැනීම, නව වගා ඇරැඹීමේදී සැලකිලිමත් විය යුතු කරුණු, රෝග නිවාරණය ඇතුළු පොල් වගාකරුවන්ට අවශ්‍ය විශේෂ කරුණු පිළිබඳ දැනුවත් කිරීම සහ ප්‍රායෝගික ක්‍රියාකරකම් සිදු කෙරේ.

මේ වැඩසටහනට පොල් වගා කිරීමේ මණ්ඩලයේ කළුතර කාර්යාලීය නිලධාරීහු සහ පිඹුර කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන නිලධාරීහු සහභාගී වෙති.

# හම්බන්තොටට සරසවියක් ලුණුගම්වෙහෙරට ජාතික පාසලක් ලබා දෙනවා

## ඇමැති චමල් රාජපක්ෂ

**ෂෙල්ටන් ජයසිංහ - තිස්සමහාරාම සමූහ**

හම්බන්තොට දිස්ත්‍රික්කයට විශ්වවිද්‍යාලයක් සහ ලුණුගම්වෙහෙර අධ්‍යාපන කොට්ඨාසයට ජාතික පාසලක් ලබා දෙන බව වාරිමාර්ග ඇමැති, අභ්‍යන්තර ආරක්ෂක ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය ඇමැති චමල් රාජපක්ෂ මහතා පවසයි.

ඇමැතිවරයා මේ බව සඳහන් කළේ තිස්සමහාරාම, දෙබරවැව ජාතික පාසලේ අලුතින් ඉදි කරන ලද පානීය ජල යෝජනා ක්‍රමය සිසු අයිතියට පත් කිරීමේ උත්සවයට සහභාගී වෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා මෙසේ ද කීය.

'දෙබරවැව ජාතික පාසලේ දෙදහසකට ආසන්න සිසු පිරිසක් ඉගෙනුම ලබනවා. ඔවුන්ට පිරිසිදු පානීය ජලය ලබා ගැනීම පසුගිය කාලයේ බලවත් ගැටලුවක් වුණා. ඒ විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයේ කොළඹ ශාඛාවේ සාමාජිකයන් විසින් විදුහල වෙත ලබාදී තිබූ ජල පෙරණ ඒකකය අක්‍රිය වීමයි. මේ ගැටලුව පිළිබඳව පාසල් දරුවකුගේ පියකු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා දැනුවත් කළා. ඒ මහ මැතිවරණ සමයේ ජනාධිපතිවරයාගේ තිස්සමහාරාම සංචාරය අතරතුරදී. එවෙලේම මේ ගැටලුවට විසඳුමක් ලබා දෙන ලෙස ජනාධිපතිවරයා නාවික හමුදා නිලධාරීන්ට දැනුම්දීමේ ප්‍රතිඵලයක් ලෙස ජල පෙරණ සහිත පානීය ජල ඒකකය විදුහල වෙත ලබාදීමට කටයුතු කළා. නාවික හමුදවේ දක්ෂිණ විධානයේ ආඥපති කොමදෝරු ප්‍රියන්ත පෙරේරා මහතාගේ මග පෙන්වීම යටතේ ගිනිකොණ විධානයේ ලුතිනන් කමාන්ඩර් ඩී. පී. ගමගේ මහතා ඇතුළු පාතම නාවික හමුදා නිලධාරීන් මේ ජල පෙරණ ඒකකය දින 12ක් වැනි කෙටි කාලයකින් ඉදි කළා.

ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ ලුණුගම්වෙහර ඉදි කරනු ලබන පානීය ජල ව්‍යාපෘතියෙන් තිස්සමහාරාම, තණමල්විල සහ ලුණුගම්වෙහෙර අවට සියලු ජනතාවගේ පානීය ජල අවශ්‍යතාව සම්පූර්ණ කරනවා. එසේ ම වැව් 300කට පමණ ජලය සැපයෙන උමා ඔයේ ජලය ලබන වසරේදී ලුණුගම්වෙහෙරට ලබා දෙනවා.

නාවික හමුදාවෙන් මේ වන විට මෙවැනි ජල පෙරණ ඒකක 768ක් ශ්‍රී ලංකාව පුරා ඉදි කර තිබෙනවා. දක්ෂිණ විධානයෙන් ස්ථාපිත කරන ලද 25 වන ඒකකය දෙබරවැව මධ්‍ය මහා විද්‍යාලයේ ඉදි කළා. අලුතින් ළිඳක් ඉදි කර දිනකට ජලය ලීටර 1000ක් පිරිපහදු කර ලබා දිය හැකි මේ ජල ඒකකයේ නඩත්තු කටයුතු ද නාවික හමුදවෙන් සිදු කරනවා.'

දෙබරවැව මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පති ආර්. ඒ. සමරවික්‍රම මහතා පිළිගැනීමේ කතාව සිදු කළේය.

පාසල් සංවර්ධන සමිතියේ නිලධාරීන්, ආදි ශිෂ්‍ය සංගමයේ නිලධාරීන්, ගුරුභවතුන් ඇතුළු පාසලේ ශිෂ්‍ය ශිෂ්‍යාවෝ මේ උත්සවයට සහභාගී වී සිටියහ.



# සපරගමු මහ සමන් දේවාලයේ ඇසළ පෙරහරට මුද්දරයක්

**මානෙල් පුෂ්පකුමාරි**

ඓතිහාසික සපරගමු මහ සමන් දේවාලයේ ඇසළ පෙරහර නිමිත්තෙන් තැපැල් දෙපාර්තමේන්තුවේ මුද්දර කාර්යාංශයෙන් තැපැල් මුද්දරයක් නිකුත් කිරීම පසුගියද (02) රත්නපුර සමන් දේවාල භූමියේදී සිදු විය.

රජය විසින් ඓතිහාසික සපරගමු මහ සමන් දේවාලයේ ඇසළ පෙරහර ජාතික උත්සවයක් ලෙස නම් කිරීමෙන් අනතුරුව ප්‍රථම වරට පැවති මෙවර පෙරහර සෞඛ්‍ය උපදෙස් අනුව චාම්ව, චාරිත්‍ර වාරිත්‍ර සහ සංස්කෘතික වටිනාකම්වලට මුල්තැන දෙමින් පැවැත්විණි.

මෙවර එම ඇසළ පෙරහර පවත්වනු ලැබුවේ 795 වැනි වරටයි. පසුගිය 02 වැනිදා නිකුත් කළ මුල්ම තැපැල් මුද්දරය තැපැල්පති රංජිත් ආරියරත්න මහතා විසින් සපරගමුව පළාත් ආණ්ඩුකාර ටිකිරි කොබ්බෑකඩුව මහතා වෙත ප්‍රදානය කරනු ලැබීය.

සපරගමුව ඓතිහාසික මහ සමන් දේවාලයේ පෙරහර අවස්ථා මේ මුද්දරයේ මුද්‍රණය කර ඇති අතර එහි වටිනාකම රුපියල් 15.00කි.

මෙහිදී සපරගමුව පළාත් ආණ්ඩුකාර ටිකිරි කොබ්බෑකඩුව මහතා විසින් සමන් දේවාලයේ මාලිගාවේ ඉහළ මළුවේ තැන්පත් කර ඇති සමන් දේව ප්‍රතිමාව ඇතුළු ආභරණ සඳහා දිනපතා සමන් පිච්ච මල් පූජා කිරීමට රිදී බන්දේසියක් බස්නායක නිලමේ මිගාර ජයසුන්දර මහතාට ප්‍රදානය කරනු ලැබීය.

ශ්‍රී පාද ස්ථානාධිපති බෙංගමුවේ ධම්මදින්න, කෝම්පිටියේ ශ්‍රී සුසීල නාහිමිවරු ද, රත්නපුර නගරාධිපති ටිරෝන් අත්තනායක, සබරගමු පළාත් මහ ලේකම් රංජනී ජයකොඩි, තැපැල් සහ ජනමාධ්‍ය වෘත්තීයවේදී සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් එස්. සේනානායක, රත්නපුර දිසාපති මාලනී ලොකුපෝතාගම, ආණ්ඩුකාර පෞද්ගලික ලේකම් මංජුලා ඉදිගහවෙල, නියෝජ්‍ය තැපැල්පතිවරුන් වන රාජිත කේ. රූපසිංහ සහ සෝභා තිලකරත්න, මුද්දර කාර්යාංශයේ අධ්‍යක්ෂ ශාන්ත කුමාර මීගම, රත්නපුර අතිරේක දිසාපති උදය කුමාරි මහත්ම මහත්මීහු මේ අවස්ථාවට එක්ව සිටියහ.



# ව්‍යාපාරික ලොව ජය ගැනීමට අත-හිත

## කොළඹ විදුලි උපකරණ වෙළෙඳ සංගමයේ නව සභාපති **ධම්මික සමරවික්‍රම**

**ජයසිරි මුණසිංහ**

ව්‍යාපාරික ලෝකය ජය ගැනීමට වෙර දරන නව පරපුරට ඒ සඳහා අවශ්‍ය දැනුම, දිරිගැන්වීම සහ නීති උපදෙස් ලබාදීමට කැප වන බව කොළඹ විදුලි උපකරණ වෙළෙඳ සංගමයේ නව සභාපති ධම්මික සමරවික්‍රම මහතා ප්‍රකාශ කළේය.

ඒ මහතා මේ බව පැවැසුවේ එම සංගමයේ තෙවැනි සංවත්සරික මහා සභාව කොළඹ ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හෝටලයේ පසුගියද පැවති අවස්ථාවේදීය.

නව වසරට (2020 - 2021) නිලධාරී මණ්ඩලයක් පත් වූ අතර දෙවැනි වතාවට එහි සභාපති ධුරයට ධම්මික සමරවික්‍රම මහතා වැඩි ඡන්දයෙන් පත් විය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ නව සභාපතිවරයා මෙසේ ද කීය.

'අපේ සංගමයේ සාමාජිකයන්ගේ දූ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු ඉහළ නැංවීමට අවශ්‍ය පාසල් උපකරණ, පොත් පත් නොමිලේ ලබාදීමේ වැඩසටහනට අමතරව තවදුරටත් ඔවුන් දිරිගැන්වීමට ශිෂ්‍යත්ව ක්‍රමයක් ඇරැඹීමට ද කටයුතු කරනවා.'

සංගමයේ ආරම්භක සාමාජිකයන් වන එච්. ජී. පියසිරි, ජයරත්න උක්වත්ත, ජිනදාස රණසිංහ, ආර්. පී. විලියම් අයට ගෞරවණීය සාමාජිකත්වය පිරිනැමිණි. සංගමයේ ප්‍රධාන ලේකම්වරයා ලෙස ජී. සේකර් සහ භාණ්ඩාගාරික ලෙස ජී. ගුර්ජිනාදන් මහත්වරු තේරී පත් වූහ.



# මහවැලි කලාපවල ජනතාවගේ ඉඩම් හිමිකම් ගැටලුවලට තිරසර විසඳුම්

## රාජ්‍ය ඇමැති සිරිපාල ගම්ලත්

මහවැලි කලාපවල ජීවත් වන ජනතාවට වසර ගණනාවක සිට ගැටලුවක් වී තිබෙන ඉඩම් හිමිකම් ගැටලු විසඳීමට තමන් පියවර ගන්නා බව මහවැලි කලාප ආශ්‍රිත ඇළවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය ඇමැති සිරිපාල ගම්ලත් මහතා පැවැසීය.

රාජ්‍ය ඇමැතිවරයා මේ බව පැවැසුවේ පෙරේදා (03) අඟුණකොළපැලැස්ස නගර ශාලාවේදී පැවති මහවැලි අධිකාරියට අයත් වලව විශේෂ බල ප්‍රදේශයේ ජනතාවගේ ඉඩම් සම්බන්ධ ආරවුල් විසඳීමට සංවිධාන කළ ජංගම සේවයට එක් වෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ රාජ්‍ය ඇමැතිවරයා මෙසේ ද කීය.

'ඉඩමක උරුමය නොමැතිකමින් මහවැලි කලාපවල ජනපදිකයන් විශාල පිරිසක් සමාජීය ගැටලු රැසකට මුහුණදී සිටිනවා. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ සහ අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහත්වරුන්ගේ අපේක්ෂාව රටේ සෑම පවුලක්ම සතුටින් තැබීම. ඒ අනුව සෞභාග්‍යයේ දැක්ම වැඩපිළිවෙළ යටතේ ජනතාවගේ ජීවිත නගාසිටුවීම දේශපාලන නායකත්වයේ මෙන්ම රාජ්‍ය පරිපාලන සේවයේ සියලු දෙනාගේ ද ප්‍රමුඛ වගකීමක්.

මහවැලි කලාප ජනපදිකයන් බොහෝ පිරිසකට තවමත් ඉඩමක උරුමය තහවුරු කෙරෙන ඔප්පුව අහිමි වී තිබෙනවා. ඒ නිසා ඔවුන් සමාජයේ පිළිගත් පිරිසක් ලෙස ජීවත් වෙනවා දැකීම අපට අවශ්‍යයි. අද ජනතාවට ඉඩමක හිමිකම නොමැතිකමින් වරප්‍රසාද රැසක් අහිමි වී තිබෙනවා. විශේෂයෙන් ඉඩම් ඔප්පු මෙතෙක් ලැබී නැති මහවැලි කලාපවල ජනතාවගේ ඉඩම් ආරාවුල් කඩිනමින් විසඳ ඔවුන්ට ඉඩම් ඔප්පු ප්‍රදානය කිරීමට වාරිමාර්ග ඇමැති චමල් රාජපක්ෂ මහතාගේ මග පෙන්වීම මත කටයුතු සූදානම් කර තිබෙනවා.

හම්බන්තොට දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී අජිත් රාජපක්ෂ, වාරිමාර්ග ඇමැති චමල් රාජපක්ෂගේ පෞද්ගලික ලේකම් ශමීන්ද්‍ර රාජපක්ෂ, අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාවේ සභාපති විර බද්දන, මහවැලි කලාප ආශ්‍රිත ඇළවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් ඉංජිනේරු ඩබ්ලිව්. බී. පළුගස්වැව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් ඉංජිනේරු සුනිල් එස්. පෙරේරා, අධ්‍යක්ෂ ඉඩම් මහවැලි අසන්ත ගුණසේකර, වලව විශේෂ කලාපයේ නේවාසික ව්‍යාපාර කළමනාකරු ඔස්මන් ද සිල්වා මහත්වරුන් ඇතුළු විශාල පිරිසක් මේ අවස්ථාවට සහභාගි වී සිටියහ.

# උතුරු නැ/හිරට රැකියා ලක්ෂයෙන් කොටසක් දෙන්න ජනපති-අගමැති පොරොන්දු වුණා

## ඇමැති ඩග්ලස් දේවානන්දා

රැකියා අවස්ථා ලක්ෂයක් ලබාදීමේ රජයේ වැඩපිළිවෙළේදී උතුරු නැගෙනහිර ජනතාවටත් එයින් කොටසක් ලබා දෙන බවට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ සහ අගමැති මහින්ද රාජපක්ෂ මහත්වරුන් පොරොන්දු වූ බව ධීවර ඇමැති ඩග්ලස් දේවානන්ද මහතා කියයි.

ඇමැතිවරයා මේ බව පැවැසුවේ පසුගියද පැවති කැබිනට් මණ්ඩල හමුවේදීය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා මෙසේ ද කීය.

'ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ උපදෙස් පරිදි දිළිඳු පවුල්වලින් 1,00,000කට වහාම නව රැකියා ලබාදීමේ ව්‍යාපෘතියෙන් උතුරු නැගෙනහිර ජනතාවට ද සහන අවශ්‍යයි.

මෙහිදී ජනාධිපතිවරයා සහ අගමැතිවරයා පැවැසුවේ මේ රට එක රටක් බවත්, එක නීතියක් බවත්, එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී රජය දැඩි ස්ථාවරයක පවතිමින් කටයුතු කරන බවත්, කිසිදු ආකාරයකින් ජාති, ආගම්, පළාත් භේද හිස එසවීමට අවස්ථාවක් ලබා නොදෙන බවත්ය.

දිළිඳු පවුල්වලට රැකියා ලක්ෂයක් ලබාදීමේ කටයුතු දැනට තාවකාලිකව උතුරු නැගෙනහිර පළාත්වල අත්හිටුවා තිබෙනවා. හැකි ඉක්මනින් එම පළාත්වලට නව රැකියා ලබාදීමට කටයුතු කරනවා. එම නිසා එම පළාත්වල ජනතාව අනවශ්‍ය ලෙස කලබලයට පත් නොවිය යුතුයි.'

# පින්නවල අලි පැටවුන්ට කිරි පෙවීමේ සන්දර්ශනය අත්හිටුවීමෙන් දෛනික ආදායම 50%කින් පහත වැටිලා

**අසේල ලියනගේ**

පින්නවල අලි අනාථාගාරයේ අලි පැටවුන්ට කිරි පෙවීමේ සන්දර්ශනය අත්හිටුවූ නිසා එහි දෛනික ආදායම සියයට 50කින් පමණ පහළ වැටී ඇති බව සමස්ත ලංකා සත්වෝද්‍යාන වෘත්තිය සමිති එකමුතුවේ කැඳවුම්කරු එම්. කේ. එස්. කරුණාතිලක මහතා ප්‍රකාශ කළේය.

ඒ මහතා මේ බව පැවැසුවේ ඊයේ (03) දිනමිණ වෙත අදහස් දක්වමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේ ද කීය.

'2018ට පෙර අලි පැටවුන්ට කිරි පෙවීමේ සන්දර්ශනය අලි අනාථාගාරයේ ප්‍රධාන අංගයක් බවට පත්ව තිබුණා. එම සිදු වීම සංචාරක ආකර්ෂණය අතින් ද ඉහළ මට්ටමක තිබුණා. අලි පැටවුන්ට කිරි පෙවීමේ සන්දර්ශනය පැවති කාලයේ දිනකට රුපියල් ලක්ෂ 20ක පමණ ආදායමක් ලැබුණා. එම සංදර්ශනය නැවැත්වූ පසු දෛනික ආදායම රුපියල් ලක්ෂ 10කින් පමණ පහළ ගියා.

වන ජීවී දෙපාර්තමේන්තුවෙන් අතරමං වූ අවුරුදු 03ත් 05ත් අතර කිරි පෙවීමට සුදුසු අලි පැටවුන් උඩවලව රක්ෂිතයටත්, පින්නවල අලි අනාථාගාරයටත් යොමු කරනවා. මේ කිරි පෙවීමේ සංදර්ශනය නැවත ආරම්භ කිරීමට පියවර ගන්නා ලෙස බලධාරීන්ගෙන් ඉල්ලා සිටිනවා.

පින්නවල අලි අනාථාගාරය අවට ඇති සියලු පෞද්ගලික අලි ගාල්වල මේ අලි පැටවුන්ට කිරි පෙවීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම නිසා දෙස් විදෙස් සංචාරකයන් එම ස්ථානවලට ඇදී යෑම සිදු වෙනවා. එම තත්ත්වය මැඩපවත්වා නව සන්දර්ශන ආරම්භ කර සංචාරක ආකර්ෂණය දිනාගැනීමට කටයුතු කිරීමට වෘත්තීය සමිති එකමුතුව පෙනී සිටිනවා.

අලි අනාථාගාරයේ අලි 60කට පමණ නවාතැන් පහසුකම් සඳහා ඉඩකඩ පැවතියත් එම සීමාව ඉක්මවා අලි 80ක් පමණ ගාල් කර තිබෙනවා. එය වෘත්තීය සමිතියක් ලෙස අනුමත කරන්න බෑ.

අධිකරණවල පවතින නඩු කටයුතුවලට සම්බන්ධ වන අලින් 20ක් පමණ තාවකාලිකව පින්නවල අලි අනාථාගාරයට යොමු කර තිබෙනවා. ඔවුන් නඩත්තු කිරීමට සිදුවී තිබෙන්නේ පින්නවල අලි අනාථාගාරයේ මුදල්වලින් නිසා ඔවුන්ට හැකි ඉක්මනින් ස්ථාවරත්වයක් ඇති කළ යුතුයි.

පින්නවල අලි අනාථාගාරයේ 2009 වර්ෂයෙන් පසු අලි පැටවකු බිහි වී නෑ. පෙර පැවති අලි ප්‍රජනන වැඩසටහන ක්‍රියාත්මක කර විවිධ කුලවලට අයත් අලි පැටව් බෝ කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍යයි.

# මකුළුගස්වැව පොලිස් මුරපොළ පොලිස් ස්ථානයක් කරන්න



මකුළුගස්වැව පොලිස් මුරපොළ පවත්වා ගෙන යන ස්ථානය

**මාතලේ දිස්ත්‍රික් සමූහ - ඒ. ඒ. එල්. ඩයස්**

**ප්‍රදේශවාසීහු ඉල්ලති**

මාතලේ සහ අනුරාධපුර දිස්ත්‍රික්කවලට මායිම්ව පිහිටි ශ්‍රී ලංකාවේ ප්‍රථම ගොවි ජනපදවලින් එකක් වන දේවහුවෙහි ප්‍රධාන නගරය බවට පත්ව ඇති මකුළුගස්වැව නගරයේ මීට දශක තුනකට පමණ පෙර ගලේවෙල පොලිසියට අනුයුක්තව ආරම්භ කරන ලද පොලිස් මුරපොළ දැනට වසර හයකට පෙර පොලිස් ස්ථානයක් ලෙස උසස් කිරීමට රජය විසින් ගැසට් කර ඇතත් එය මෙතෙක් ක්‍රියාත්මක නොවීම ප්‍රදේශවාසීන්ගේ මහත් අප්‍රසාදයට හේතුවී ඇත.

දැනට කුඩා කුලී ගොඩනැඟිල්ලකට සීමාවී ඇති මේ පොලීසියට නව ගොඩනැඟිලි සංකීර්ණයක් ඉදි කිරීමට සැලසුම් කර ඇතත් එය වචනයට පමණක් සීමා වීම නිසා දැඩි දුෂ්කරතා මධ්‍යයේ මෙහි සේවය කිරීමට මේ නිලධාරින්ට සිදුවී තිබේ.

එමෙන්ම මේ පොලිස් බල ප්‍රදේශයට ග්‍රාම සේවා කොට්ඨාස තිහකට අධික සංඛ්‍යාවක් අයත් වන බැවින් ප්‍රදේශයේ මහජන අවශ්‍යතා ඉටු කිරීමට දැනට මෙහි ඇති භෞතික මෙන්ම මානව සම්පත්ද කිසිසේත්ම ප්‍රමාණවත් නොවේ.

මේ වන විට මේ පොලිස් මුරපොළ ගලේවෙල පොලිස් මධ්‍යස්ථානය යටතේ පවතින නමුත් පොලිස් මූලස්ථානය විසින් නිකුත් කරනු ලබන සියලු චක්‍ර ලේඛයන් මෙන්ම වෙනත් නියෝග ද අනෙකුත් පොලිස් ස්ථානවලට මෙන්ම මකුළුගස්වැව පොලිස් මුරපොළට ද විධිමත් ලෙස ලැබෙන බව අනාවරණයවේ. එයින් හැඟී යන්නේ පොලිස් මූලස්ථානය විසින් මකුළුගස්වැව පොලිස් මුරපොළ මීට පෙර ගැසට් කර ඇති පරිදි පොලිස් ස්ථානයක් ලෙස පිළි ගෙන ඇති බවය.

මේ සම්බන්ධයෙන් ප්‍රදේශවාසීන් පවසන්නේ මකුළුගස්වැව පොලිස් මුරපොළ විවෘත කිරීමත් සමගම ප්‍රදේශයේ එතෙක් පැතිර පැවති බොහෝ නීති විරෝධී ක්‍රියා සම්පූර්ණයෙන්ම මර්දනයවී ඇති බවය.

එබැවින් රජය විසින් ගැසට් කර ඇති පරිදි මකුළුගස්වැව පොලිස් මුරපොළ පොලිස් ස්ථානයක් ලෙස ක්‍රියාත්මක කරන ලෙස මොවුහු රජයෙන් ඉල්ලා සිටිති.

**ඡායාරූපය - මාතලේ දිස්ත්‍රික් සමූහ**

# ප්‍රේමලාල් ජයසේකරට පාර්ලිමේන්තු රැස්වීම්වලට අවසර දෙනවාද? නැද්ද?

## අභියාචනාධිකරණ තීන්දුව සඳුදා

**නෙල්කා මැදගෙදර**

මිනී මැරුමක් කිරීම සම්බන්ධයෙන් මරණ දඬුවම නියමව, මන්ත්‍රීවරයකු ලෙස තේරී පත්වී සිටින ප්‍රේමලාල් ජයසේකර මහතාට පාර්ලිමේන්තු රැස්වීම්වලට සහභාගී වීම සඳහා අවසර දෙනවාද, නැද්ද යන්න පිළිබඳ තීරණය ලබන 07 වැනි සඳුදා ප්‍රකාශ කිරීමට අභියාචනාධිකරණය ඊයේ (04) තීරණය කළේය.

තමන්ට පාර්ලිමේන්තු රැස්වීම්වලට සහභාගී වීමට අවසර දෙන ලෙස බන්ධනාගාර කොමසාරිස් ජනරාල් තුෂාර උපුල්දෙණිය මහතා සහ වැලිකඩ බන්ධනාගාර අධිකාරිවරයාට නියෝග කරන ලෙස ඉල්ලා ප්‍රේමලාල් ජයසේකර මහතා ගොනු කළ රිට් පෙත්සමක් සලකා බැලූ අභියාචනාධිකරණය මේ බව ප්‍රකාශ කළේය.

පෙත්සමේ වගඋත්තරකරුවන්ට නොතීසි නිකුත් කරනවාද, නැද්ද යන්න පිළිබඳව ද එදින ප්‍රකාශ කිරීමට නියම විය.

අභියාචනාධිකරණ සභාපති විනිසුරු ඒ. එච්. එම්. ඩී. නවාස් සහ අභියාචනාධිකරණ විනිසුරු සෝභිත රාජකරුණා මහත්වරු හමුවේ මේ පෙත්සම කැඳවන ලදී.

එහිදී පෙත්සම්කාර ප්‍රේමලාල් ජයසේකර මහතා වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ රොමේෂ් ද සිල්වා මහතා සඳහන් කළේ ඉකුත් මැතිවරණයට තරග කළ පෙත්සම්කරු වැඩි මනාප ලබා ගනිමින් පාර්ලිමේන්තුවට තේරී පත් වූ බවය. ඔහු අධිකරණයෙන් වරදකරුවකු කර සිර දඬුවම් නියම කළ බව ජනතාව දැනුවත්ව සිටි අතර ඔවුන් සිය කැමැත්තෙන් ඔහු තෝරා පත් කරගත් බව හෙතෙම කීය.

එහෙත් පාර්ලිමේන්තු රැස්වීම්වලට සහභාගී වීමට ඔහුට අවසර දීමට බන්ධනාගාර බලධාරීන් කටයුතු නොකරන බව ඒ මහතා කීය. අධිකරණ ඇමැතිවරයා විසින් කළ විමසීමකට පිළිතුරු දෙමින් නීතිපතිවරයා ප්‍රේමලාල් ජයසේකර මහතාට පාර්ලිමේන්තු රැස්වීම්වලට සහභාගී වීමට තරම් නීතිමය ප්‍රතිපාදන නැතැයි දන්වා ඇති බව ද හෙතෙම සඳහන් කළේය. කෙසේ වුව ද ප්‍රේමලාල් ජයසේකර මහතා පාර්ලිමේන්තු රැස්වීම්වලට සහභාගී කරවන ලෙස කථානායකවරයා බන්ධනාගාර බලධාරීන්ට දැනුම් දී තිබෙන නමුත් ඔවුන් එය ඉටු නොකරන බව ජනාධිපති නීතිඥවරයා කීය.

මරණ දඬුවම නියම වූ සිරකරුවන් වෙනම සිර මැදිරියක රඳවා තබන නමුත් එම දඬුවමට එරෙහිව අභියාචනා කර ඇති අවස්ථාවක ඔහු රිමාන්ඩ් භාරයේ රඳවා තබන බව පෙන්වා දුන් ජනාධිපති නීතිඥවරයා, මේ පෙත්සම්කාර ප්‍රේමලාල් ජයසේකර මහතා මේ වන විට රිමාන්ඩ් භාරයේ සිටින රැඳවියකු පමණක් බව සඳහන් කළේය. මරණ දඬුවමට එරෙහිව අභියාචනා කර ඇති බැවින් ඔහු මරණ දඬුවම නියම වූ රැඳවියකු ලෙස සැලකිය නොහැකි බව ඒ මහතා කීය.

පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයට නුසුදුසු වන්නන් ලෙස දක්වා ඇත්තේ මරණ දඬුවම නියම වූවන් පමණක් බව හෙතෙම පෙන්වා දුන්නේය.

මහජන ඡන්දයෙන් පත් වූ පෙත්සම්කරුට පාර්ලිමේන්තුවට පැමිණීමට අවස්ථාව දිය යුතු බව හෙතෙම කීය.

මේ පෙත්සම්කරුට ඡන්දය දුන් ඡන්දදායකයන් පෙත්සම්කරු කවුරුන්ද යන්න පිළිබඳවත්, ඔහු කළ බව කියන වරද පිළිබඳවත්, ඔහුට නියම වූ දඬුවම පිළිබඳවත් හොඳින් දැන සිටි බව ජනාධිපති නීතිඥවරයා කීය. එසේ තිබියදීත් සිය ඡන්දය ලබාදීමෙන් පත් කළ මන්ත්‍රීවරයකු වන පෙත්සම්කරුට පාර්ලිමේන්තුවට යාමට අවස්ථාව දිය යුතු බව ඒ මහතා කීය. මෙරට ඉහළම නීතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් මරණ දඬුවමට යටත්ව සිටින්නකු පාර්ලිමේන්තුවේ සිටීමට නුසුදුසු බව පැහැදිලිවම දක්වා ඇති බැවින් එය ඉක්මවා යාමට කිසිවකුට නොහැකි බව ඔහු කීය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ව්‍යවස්ථාවන් සමඟ සම්බන්ධ වන මෙවැනි පෙත්සම් සලකා බැලීම හෝ අභියාචනාධිකරණය කටයුතු කළ යුතු නැතැයි ද එම වගන්ති පිළිබඳව අර්ථ නිරූපණයක් ගැනීමට නම් මෙය ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු කළ යුතු බව ද හෙතෙම කීය.

එබැවින් පෙත්සම්කරු ඉල්ලන සහන ලබාදිය යුතු නැතැයි හෙතෙම කීය.

මෙහිදී පෙත්සමේ වගඋත්තරකාර පාර්ලිමේන්තු මහ ලේකම්වරිය වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ උදිත ඉගලහේවා මහතා සඳහන් කළේ සිරකරුවකු මහජන ඡන්දයෙන් තේරී පත් වූ විට මන්ත්‍රීවරයකු ලෙස දිවුරුම් දීම සඳහා පාර්ලිමේන්තුවට යාමට බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා විසින් අවස්ථාව සලසා දිය යුතු බවය. සිරදඬුවම් නියම වූ දස දෙනකු මීට පෙර පාර්ලිමේන්තුවට තේරී පත්ව ඇතැයි ද ඔවුන් සියලු දෙනාට පාර්ලිමේන්තුවට යාමට අවස්ථාව ලැබී ඇති බව ද හෙතෙම කීය.

තමන්ට නියම වූ මරණ දඬුවමට එරෙහිව අභියාචනයක් ගොනු කළ විට ඇතිවන තත්ත්වය ඇප පනතෙහි දක්වා තිබෙන බව හෙතෙම කීය. මරණ දඬුවම ක්‍රියාත්මක වීම අත්හිටුවන අතර රිමාන්ඩ් භාරයේ එවැන්නකු රඳවා තැබිය හැකි බව ඔහු පෙන්වා දුන්නේය. රිමාන්ඩ් භාරයේ සිටින සිරකරුවකුට අයිතීන් කිහිපයක් හිමිවන අතර ඒ අනුව පෙත්සම්කරුට පාර්ලිමේන්තුවට ඇතුළුවීම, එහි අසුන් ගැනීම, ඡන්දය ප්‍රකාශ කිරීම කළ හැකි බව ඔහු කීය. ඒ සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89 (ඇ) වගන්තිය අදාළ නොවන බව ඒ මහතා කීය. අභියාචන පෙත්සමක් ගොනුකළ විට සිරදඬුවම සහ එම දඬුවම ක්‍රියාත්මක වීම අත්හිටුවන බව ඒ මහතා සඳහන් කළේය. අවසන් අධිකරණයකින් එම දඬුවම තහවුරු කළ විට පමණක් මුලින් නියම කළ දඬුවම බලාත්මක වන බව ඔහු කීය.

කරුණු සලකා බැලූ අධිකරණය පෙත්සම්කරු ඉල්ලන පරිදි පාර්ලිමේන්තුවට තමන් සහභාගී කරවන ලෙස වගඋත්තරකරුවන්ට නියම කරන අතුරු නියෝගයක් නිකුත් කරනවාද, නැද්ද යන්න පිළිබඳ තීරණය පසුවට ප්‍රකාශ කිරීමට තීරණය කළේය.

# 20න් ජනපතිගේ

## ධුර කාලය වෙනස් නොවේ

**සිතාරා සේනානි**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වැනි සංශෝධනයෙන් ඉවත් කර තිබූ ජනාධිපතිවරයා සතු විධායක බලතල 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත මගින් යළි ස්ථාපිත කර ඇති අතර, වසර හතර හමාරක් ගතවනතුරු පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට ජනාධිපතිවරයාට නොහැකි බවට වූ වගන්තිය ඉවත් කර, වසරක කාලයකින් පසු පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට ජනාධිපතිවරයාට හැකි වන සේ නව වගන්තියක්, එයට ඇතුළත් කර ඇත.

දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පාර්ලිමේන්තු සභාව ලෙස විසිවැනි ව්‍යවස්ථා සංශෝධනය මගින් නම් කර ඇත. පාර්ලිමේන්තු සභාවට පත්කෙරෙන සාමාජිකයන් සංඛ්‍යාව පස් දෙනකුගෙන් සමන්විතය.

විසිවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත ගැසට් මගින් පෙරේදා (03) ප්‍රකාශයට පත් කෙරිණි.

ජනාධිපතිවරයාට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගත නොහැකි වුවද, සිය කාර්යයන් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට වගකිවයුතු බව විසිවැනි සංශෝධනයට ඇතුළත් වේ.

යුද්ධය ප්‍රකාශ කිරීමට හෝ සාමය ප්‍රකාශ කිරීමට බලය ඇත්තේ ජනාධිපතිවරයාට බවද නව ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතට ඇතුළත් වෙයි.

තොරතුරු දැන ගැනීමේ අයිතිය, ජනාධිපතිවරයාට දෙවරකට වඩා ජනාධිපතිවරණයට තරග කළ නොහැකිවීම, ජනාධිපතිවරයාගේ සහ පාර්ලිමේන්තුවේ නිල කාලය වසර 05කට සීමා කිරීම විසිවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පතට ඇතුළත් කර ඇති දහනව වැනි සංශෝධනයෙන් ඉතිරිවූ කරුණු වේ. මේ කරුණු පමණක් විසිවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පතට ඇතුළත් කර ඇති අතර, අනෙකුත් කරුණු සියල්ලම අහෝසි කර තිබේ.

විසි වැනි සංශෝධන පනත් කෙටුම්පත අනුව අගවිනිසුරුවරයා, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිවරයා හා එහි විනිසුරුවරුන්, නීතිපති, පොලිස්පති, යුද, ගුවන්, නාවික හමුදපති, විගණකාධිපති, ඔම්බුඩ්ස්මන් ඇතුළු රජයේ ඉහළ නිලතලවලට පුද්ගලයන් පත්කිරීම මින් ඉදිරියට ජනාධිපතිවරයා යටතට පැවරේ.

ජනාධිපතිවරයාට මැතිවරණ කොමිසමේ සාමාජිකයන් තිදෙනා පත් කිරීමටත්, ඉන් එක් අයකු සභාපතිවරයා ලෙස පත්කිරීමටත් වගකීම පවරා තිබේ.

විසි වැනි සංශෝධන පනත් කෙටුම්පත අනුව ජනාධිපතිවරයා අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු මෙන්ම, එහි ප්‍රධානියා ද වන අතර, තමන් කැමති විෂයයක් හෝ කාර්යයක් පවරා ගැනීමට එමගින් ජනාධිපතිවරයා වෙත බලය පවරා ඇත.

ආණ්ඩුවේ අගමැතිවරයා ඇතුළු ඇමැති මණ්ඩලය පත් කිරීමේ බලය ජනාධිපතිවරයාට හිමිවනු ඇත.

අමාත්‍ය ධුර සංඛ්‍යාව සඳහා උපරිම සීමා පැනවීමක් නව සංශෝධන කෙටුම්පත මගින් සිදුකර නොමැති අතර, ජනාධිපතිවරයාගේ අභිමතය පරිදි අගමැතිවරයාගෙන් ද අදහස් විමසා කලින් කලට අමාත්‍යවරුන් වෙනත් අමාත්‍යවරුන් සහ නියෝජ්‍ය ඇමැතිවරුන් පත් කිරීමට ද බලය හිමිකර ඇත.

ද්විත්ව පුරවැසියන්ට ජනාධිපතිවරණයට සහ පාර්ලිමේන්තු මැතිවරණයට තරග කළ නොහැකි බවට වූ වගන්තිය ද මේ යටතේ අහෝසි වේ.

ජනාධිපතිවරයාට යම් විෂයයන් හෝ කාර්යයන් තමා යටතේ තබා ගැනීමට ද විසි වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පතෙන් යළි අවස්ථාව ලබා දී තිබේ.

දහනව වැනි ව්‍යවස්ථා සංශෝධනය මගින් බලාත්මක කැරුණු ස්වාධීන කොමිෂන් සභා නවයෙන් හතක් නව ව්‍යවස්ථා සංශෝධනය මගින් යෝජනා කර ඇත. විගණන සේවා කොමිෂන් සභාව සහ ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව ඉන් ඉවත් කර ඇත.

දහනව වැනි සංශෝධනය මගින් ගෙනා ද්විත්ව පුරවැසිභාවය සහිත පුද්ගලයකුට පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරය දැරීම තහනම් කෙරෙන වගන්තිය ද නව ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත මගින් ඉවත් කර ඇත.

පාර්ලිමේන්තුව විසුරුවා හැර නව පාර්ලිමේන්තුවක් පත් වන තෙක්, පැරැණි පාර්ලිමේන්තුවේ කථානායක සහ විපක්ෂ නායක ධුර අහෝසි නොවන බව නව සංශෝධනයේ සඳහන් වෙයි. රාජ්‍ය සේවා කොමිෂන් සභාව සඳහා ජනාධිපතිවරයා විසින් නවදෙනකුගෙන් සමන්විත සාමාජිකයන් සංඛ්‍යාවක් පත් කෙරෙන අතර, එම සාමාජිකයන් අතරින් තිදෙනකු අවුරුදු 15කට වැඩි පළපුරුද්දක් ඇති තැනැත්තන් විය යුතු බවත්, ඒ සාමාජිකයන්ගෙන් එක් සාමාජිකයකු ජනාධිපතිවරයා විසින් එහි සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතු බවටත්, විසිවැනි ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ සඳහන් වේ.

අධිකරණ සේවා කොමිෂන් සභාවෙ අග්‍රවිනිශ්චයකාරවරයාගේ සහ ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන ශ්‍රේෂ්ඨාධිකරණයේ වෙනත් විනිශ්චයකාරවරුන් දෙදෙනකුගෙන් සමන්විත විය යුතු අතර, අග්‍ර විනිශ්චයකාරවරයා කොමිෂන් සභාවේ සභාපතිවරයා විය යුතු බවද නව සංශෝධනයේ දක්වා ඇත.

## විදු අඹරේ පෑයු නොනිමි තාරකාව:

# කෑගල්ල ශාන්ත ජෝසප් බාලිකා විද්‍යාලය 110 සංවත්සරය අභිමානයෙන් සමරයි



නව සහශ්‍රයට විශිෂ්ට කාන්තා පරපුරක් බිහි කිරීම සිය දැක්ම වූ ද නව සහශ්‍රයේ අභියෝගවලට කාර්යක්ෂමව හා ඵලදායීව මුහුණ දිය හැකි රටට ජාතියට ආගමට ජීවය දෙන්නා වූ ද අප සංස්කෘතිය අනාගත පරපුරට දායාද කිරීමට කැප වූ ද විනය ගරුක නිර්මාණශීලී විශිෂ්ටයන් අතර විශිෂ්ට වූ කුසලතාවලින් පරිපූර්ණ පරිසර හිතකාමී වැඩ ලෝකයට උචිත වනිතාවන් බිහි කිරීම උදාර මෙහෙවර වූ ද අප පාසල මේ වසරේදී සිය අභිමානවත් 110 වන සංවත්සරය සමරනු ලබන්නීය.

මේ වසරේදී සිදු කිරීමට යොදාගත් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කොවිඩ්-19 මහත් අභියෝගයක් වුව ද "සිතුවොත් කළ නොහැක්කක් නොමැත" යන්න පවසමින් නිසි මඟ පෙන්වීම සිදු කරන විදුහල්පතිනි බී.ආර්.මල්ලිකා රණසිංහ මහත්මියගේ මඟ පෙන්වීම නිසා කිසිදු කාර්යයක් ක්‍රියාත්මක නොකර සිටීමට සිදු නොවීය. ඒ අතර නිසි කළමනාකාරීත්වයෙන් සෞඛ්‍ය ආරක්ෂිතව ඒ බව මොනවට පැහැදිලි කරමින් පාසල් ප්‍රජාව සමඟ තම දියණිවරුන්ගේ හපන්කම් සහ පාසලේ සංවර්ධනය කතා කිරීමට යොදාගත් අවස්ථාව සඳහන් නොකරම බැරිය.

මවුපියන් 3500 කට වැඩි පිරිසක් සම්බන්ධ කර ගනිමින් පැවැත් වූ මේ අවස්ථාවට ගෘහස්ථ ක්‍රීඩාංගණය හා පන්ති කාමර 148ක් යොදගන්නා ලදී. පැය දෙකක් වැනි කෙටි කාලයකින් තාක්ෂණය උපයෝගි කර ගනිමින් පාසල් ප්‍රජාව සමඟ නිබඳ සබඳකම් පවත්වමින් පැවැත් වූ හමුව ඉතා සාර්ථකව නිම විය. එය කාගේත් ප්‍රශංසාවට ලක්විය.

දියණිවරු අට දෙනෙකුගෙන් ආරම්භ කරන ලද කෑගල්ල ශාන්ත ජෝසප් බාලිකාව අද වන විට දියණිවරු 5000කට අධික පිරිසක් සිටින අන්තර්ජාතික මට්ටම දක්වා තම නාමය විහිද වූ සබරගමු පළාතට මහත් ආඩම්බරයක් ගෙන දෙන පාසලක් බවට පත් වී හමාරය.

ප්‍රෞඪත්වයෙන් යුතුව තම 110 වන සංවත්සරය සමරන මේ මොහොත වන විට කෑගල්ල ශාන්ත ජෝසප් බාලිකාවේ දියණියන්ගේ විශිෂ්ටතා පිළිබඳ බිඳක් හෝ සටහන් කළ යුතුව ඇත. 2019 වර්ෂයේ දියණියෝ 200ක් ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිට එම දියණිවරුන් 200 දෙනාම 70 ට වැඩි ලකුණු ප්‍රමාණයක් ඉක්මවා 100% ප්‍රතිඵල පෙන් වූ අතර කඩඉම් ලකුණු ලබාගෙන ජයග්‍රහණය කළ දියණියෝ 62 කි. අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටි දියණියන් 310 න් 303ක්ම උසස් පෙළ සඳහා සුදුසුකම් ලැබූ අතර A9 ගත් දියණියන් 69 කි. අ.පො.ස. උසස් පෙළට දියණියන් 920 ක් පෙනී සිට ඉන් 735ක් විශ්වවිද්‍යාල වරම් ලබා ඇත. විෂයන් තුනටම A සාමාර්ථ ලබාගත් දියණියන් 79 අතරින් දිස්ත්‍රික් කුසලතාවන් හිමි දියණියන් 21 දෙනෙකු සිටින අතර භෞතික විද්‍යා අංශයේ දිස්ත්‍රික් කුසලතා 1,5,6 ජීව විද්‍යා අංශයෙන් 6,8 වාණිජ අංශයෙන් 5,7 ලබාගත් දියණියන් ද ඒ අතර සිටිති.

අධ්‍යාපනික වශයෙන් විශිෂ්ටයන් අතර විශිෂ්ටයන් වන දියණියන් විෂය සමගාමී හා විෂය බාහිර කටයුතු කෙරෙහි ද දක්වන්නේ විශිෂ්ට දක්ෂතාවකි. ඒ අතර සමස්ත ලංකා ප්‍රථම ස්ථානය ලබාගනිමින් ද අන්තර්ජාතික වශයෙන් රිදී පදක්කම් ලබා ගනිමින් ද කෑගල්ල ශාන්ත ජෝසප් බාලිකා දියණියන් විශිෂ්ට වනිතාවන් ලෙස දැයට දයාද වේ. බංග්ලාදේශයේ ඩකා අගනුවර පැවැත් වූ පස්වෙනි දකුණු ආසියානු කරාටේ තරගාවලියේ 21 න් පහළ කාතා කුම්තේ තරග ඉසව්වට සහභාගි වූ පී.එම්.එල්. යමාෂි ඒකනායක දියණිය රිදී පදක්කමක් ලබා අන්තර්ජාතිකව තම විදු නාමය බැබළ වූ එක් දියණියක් පමණි.

මේ සියලු ජයග්‍රහණවලට විදුහල්පතිනි, නියෝජ්‍ය විදුහල්පතිනිය, සහකාර විදුහල්පතිනියන් සහ ඇදුරු මඬුල්ල යෝධ සෙවණැල්ලක් මෙන් නිබඳව මඟ පෙන්වා දෙති. දිනෙන් දින ඉදිරියට පැමිණි කෑගල්ල ශාන්ත ජෝසප් බාලිකා විද්‍යාලය ලබන වසර වන විට තවත් ජයග්‍රහණ ලබමින් දිවයිනේ ඉදිරියෙන්ම සිටින පාසලක් බවට පත්වනු නොඅනුමානය.

**-චතුරිකා අබේවික්‍රම**

# දේශීය නර්තන හා වාදන ක්ෂේත්‍රයේ පියසාර ශිල්පාධිපති ලකුණ



(ප්‍රවීණ නර්තන හා වාදන ශිල්පියකු, ගුරුවරයකු මෙන්ම නිර්මාණකරුවකු වූ ආචාර්ය පියසාර ශිල්පාධිපති ගුරු දේවයන් දැයෙන් සමුගෙන මේ මස 02 වැනි දිනට වසරක් පිරීම නිමිත්තෙනි.)

ශ්‍රී ලාංකේය නර්තන හා භේරි වාදන කලාව මතු පරපුරට උරුම කිරීමේ ජාතික කර්තව්‍යයට ඍජුව දායක වූ අප කථානායකයාණන් තත් ශිල්පයන් පාරම්පරිකව විශිෂ්ට ලෙස ප්‍රගුණ කළ ශිල්පියෙකි. වර්ෂ එක්දහස් නවසිය හතළිස් පහේ මාර්තු මස දහනව වන දින ශිල්පාධිපති සාරංගා හා සච්චාති යන දෙදෙනාට දාව පොල්ගහවෙලදී ජන්මලාබය ලැබූ පියසාර මහතා පොල්ගහවෙල ශාන්ත බර්නාදෙත් විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලැබූ අයෙකි.ප්‍රසිද්ධ නර්තන ශිල්පියකු වූ සයිමන් ශිල්පාධිපති හා තම සුලු පියා ශිල්පා ගුරු යටතේ ශිල්ප හදරා 1958 වසරේ දී තම කලඑළි මංගල්‍යය පොල්ගහවෙල වැලිගොඩ පිටිය විහාරස්ථානයේ දි පවත්වා ශිල්පාධිපති කලායතනයේ ගුරුවරයකු වශයෙන් අත්දැකීම් ලද පියසාර මහතා 1965 වසරේ දී ජර්මානු තානාපති නිවසේ පැවති සංදර්ශනයක් සඳහා චිත්‍රසේන මහතාගේ ඇරයුමින් පැමිණීම මොහුගේ ජීවිතයේ හැරවුම් ලක්ෂ්‍යය විය.

පසුකාලීනව චිත්‍රසේන වජිරා කලායතනයේ නිර්මාණයන්ට සම්බන්ධ වී නෘත්‍යාංජලී, නවාංජලි ආදී ප්‍රසංගයන්හි වාදකයකු ලෙස ද කරදිය ,කිංකිණි කෝලම අදි මුද්‍රාජ නාට්‍යන්හි නර්තන ශිල්පියකු ලෙස ද එම ආයතනයේ ගුරුවරයකු වශයෙන් ද ඇගයීමට පාත්‍ර වූ මෙතුමා පද්මභූෂණ වජිරා චිත්‍රසේන මහත්මිය සමඟ එම ආයතනයේ නිර්මාණ රාශියක් එළි දැක්වීමෙහිලා දායකත්වය ලබා දී ඇත.

1968 රජයේ ලලිත කලායතනයට ඇතුළත්ව, 1974 වසරේ සය අවුරුදු පාඨමාලාව නිම කොට 1974 වසරේදී කපිතාන් දෙල්වල මහතා රත්මලානේ පිහිට වූ නර්තන කණ්ඩායමේ පුහුණුවීම් පවත්වාගෙන ගිය මෙතුමා ඉන්පසු 1975 රාජ්‍ය නර්තන කණ්ඩායමේ ශිල්පියකු බවට පත්විය.1976 වසරේදී හොරණ ශ්‍රී පාලි කලායතනයේ නර්තන උපදේශවරයකු ලෙස පත්වීම් ලැබූ අප කථානායකයන් 1977 වසරේදී චන්ද්‍රකාන්ති නම් වූ තරුණ ශිල්පිණිය සමඟ යුගදිවි ආරම්භ කිරීම ශ්‍රී ලාංකේය කලා කෙත අස්වැද්දීමෙහිලා පසුබිමක් ගොඩනැගුණු මහඟු අවස්ථාවකි.මේ ගුරු දෙපළගේ එකම දියණිය වූ මාධවී තම මව මෙන්ම දක්ෂ ගායිකාවක ලෙස පසුකාලීනව තම පියාගේ නිර්මාණයන්ට දායක වී ඇත.

දේශීය වශයෙන් අප කථානායකයාණන් නර්තන මෙන්ම වාදන නිර්මාණ රාශියක් ජනගත කොට ඇති නිර්මාණකරුවෙකි. ඔහුගේ නිර්මාණයන්හි සම්ප්‍රදායික ගති ලක්ෂණ මනාව පිළිබිඹු කෙරෙන අතරම ප්‍රසාංගිකත්වණය ඉතා ඉහළ තලයක පැවතීම සුවිශේෂත්වයකි. ප්‍රසාංගික කලාව ආශ්‍රිත කුමන නිර්මාණයක දි වුවද නිර්මාණකරුවාගේ දෘෂ්ටිය හා ශික්ෂණය ඉතා වැදගත් වේ. එමෙන්ම නිර්මාණකරුවා තුළ ඇති මූලික විෂය ක්ෂේත්‍රය හා සම්බන්ධ පසුබිම්ගත ඥානය හා පරිකල්පනයන් එහි සාර්ථකත්වකය උදෙසා බලපානු ඇත. මෙනයින් බලන කල පියසාර නම් වූ නිර්මාණකරුවා මේ ඥානයෙන් සුපෝෂිත වූ අයෙකි. එබැවින් ඔහු සමාජගත කරනු ලැබූ සමූහ වාදන, සංධ්වනි නූතන නිර්මාණකරුවන් අතර ද නොනැසී පවතින්නේ මෙකී ඥානයන්ගෙන් ලැබූ පෝෂණය නිර්මාණගතව තිබීමේ හේතුවෙනි. 1994 "කලාශූරි" සම්මානයෙන් හා 2003 " දේශිය නර්තන කීර්ති ශ්‍රී " ජනාධිපති සම්මානයන්ගෙන් පුද ලබන්නේ දේශීය කලාව උදෙසා කරනු ලැබූ මෙකී සේවයට උපහාර වශයෙනි.

1978 කැලණිය විශ්ව විද්‍යාලයේ සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ උපදේශකවරයෙකු ලෙස පත් වූ පියසාර නම් වූ අග්‍රගණ්‍ය කලාකරුවා2005 වසරේදි සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය දක්වා ආ ගමන්මගේ නොමඳව ගෞරවයට පාත්‍ර වූ නිහතමානී ආචාර්යවරයා බව සඳහන් කරන්නේ ගෞරවයෙනි. සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය මෙතුමාට ආචාර්ය උපාධිය 2012 වසරේ පිරිනමනු ලබන්නේ කළ සේවයට උපහාර වශයෙනි.

පියසාර සූරින්ගේ දේශීය නර්තනය විදේශයන්හි ප්‍රචලිත කිරීමේ ආරම්භය 1967 අප්‍රේල් මස 28 වැනිදින දින චීන සංචාරයත් සමගිනි.ඒ වන විට අවුරුදු 22 ක තරුණයකු වූ මොහු 1999 වසර වන විට විදේශ සංචාර හැට පහක් ඉක්මවා සහභාගි වූ අයෙකි.CONTEMPERORY DANCE SCHOOL OF MODERN BALLET DAVID HIGH SCHOOL OF ARTBELMOST JUNIOR SCHOOLJANAKO ARTS CENTREALBERT MUSEUM ආයතනයන්හි දේශිය නර්තන හා වාදනය පිළිබඳ සංදර්ශන හා වැඩමුළු පවත්වා දේශීය නර්තනය හා වාදන කලාවට කීර්තියක් ලබාදීමත් බ්‍රිතාන්‍ය ජාතික ශබ්ද සංරක්ෂණාගාරය ( NATIONAL SOUND ARCHIVE) හි දේශීය බෙර වාදනයන් පටිගත කර තැබීමට සමත් වූ එකම ශිල්පියා වීමේ ගෞරවය හිමිවුයේ 1987 දී කරන ලද බ්‍රිතාන්‍ය සංචාරයෙනි.දේශීය භාණ්ඩ උපයෝගි කරගනිමින් විදේශීය ශිල්පීන් සමඟ යුගල වාදන ඉදිරිපත් කිරීම මේ කලාකරුගේ කැපී පෙනෙන දස්කමක් වූ අතර ,එයින් දෙස් විදෙස්හී මහත් කීර්තියට පත්වූ ශිල්පියකු ලෙස සඳහන් කළ හැකිය.

අමෙරිකාවේ මෙතුමා ශිල්ප දැක්වූ ආයතන අතර ,කැලිෆෝනියා විශ්ව විද්‍යාලය ලොස් ඇන්ජලීස් විශ්ව විද්‍යාලය, කැලිෆෝනියා ශාන්ත බාබරා විශ්ව විද්‍යාලය, ආසියාතික කෞතුකාගාරය, ගැමි කලා සහ අත්කම් පිළිබඳ කෞතුකාගාරය, කැලිෆෝනියා ලලිත කලායතනය, ඕටින් චිත්‍ර පාසල, උත්ලා විශ්ව විද්‍යාලය, වික්ටරි පාසල වැනි ආයතන ඉතා වැදගත් ස්ථාන සේ සඳහන් කළ හැකිය.

1991 දි " SOUND OF DRUMS " නමින් ශ්‍රී ලාංකීය බෙර වාදන ශිල්පය පිළිබඳ කැසට් පටයක් මොහු විසින් නිපදවන ලදී. ලාංකීය බෙරවාදන නුදුටු විදේශිකයන් සඳහා හඬ මගින් අවබෝධයක් ලබා ගැනීමට හැකි පරිදි නිපද වූ මෙය ඉංග්‍රීසි භාෂාවෙන් විස්තරාත්මකව ඉදිරිපත් වේ. " සිත්ග්ලංකා " ආයතනයේ ආරාධනය පරිදි සකස් වූ මෙකී කැසට්පටය ශ්‍රී ලංකාවේ නර්තන හා වාදන ක්ෂේත්‍රය තුළ පළමු වතාවට ඉංග්‍රීසි මාධ්‍යයෙන් බෙර වාදන අංක පිළිබඳ තොරතුරු සඳහන් කෙරෙන කැසට්පටය ලෙස සඳහන් කළ හැකිය. මේ කැසට් පටය ලෝකයේ රටවල් විශාල ප්‍රමාණයක බෙදා හැර ඇති අතර එතුළින් දේශිය බෙර වාදනය පිළිබඳ විදේශයන්හි අවධානය යොමු වී ඇත.

1999 ජූලි මස ඇමරිකාව සහ කැනඩාව යන රාජ්‍යතවල පියසාර ශිල්පාධිපති මහතා විසින් දේශීය නර්තනය සහ බෙර වාදනය ඉදිරිපත් කිරීමට කරන ලද සංචාරය මෙහි ලා වැදගත් වන අවස්ථාවකි. ඇමරිකාවේ ලොස් ඇන්ජලිස්හි නිර්මාණ ආයතනය (CENTER FOR THE STUDY OF SRI LANKAN CULTURE ) කැනඩාවේ ඔටාවා නගරයේ ඔඩිසි රඟහල පදනම ( ODYSSEY THEATRE ) යන ආයතන එක්ව කරන ලද ආරාධනය අනුව මෙකී සංචාරය සිදුකරන ලද අතර එම ආයතනයන්හි පරමාර්ථය වී ඇත්තේ එම රටවල උසස් අධ්‍යාපනය හදාරන සිසුන්ගේ අවශ්‍යතාව තකා එකී ආයතනවල දේශීය නැටුම් හා බෙර වාදන පිළිබඳ ප්‍රායෝගික දේශන හා වැඩමුළු පැවැත්වීමය.

මේ හැරුණු කොට 1999 මැයි 15 සහ මැයි 16 යන දිනයන්හිදි ලොස් ඇන්ජලීස් නගරයේ වෙසෙන ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් එහි සිංහල සංගමය මගින් සංවිධාන කර තිබූ නැටුම් පිළිබඳ වැඩමුළුව මෙහිලා වැදගත් වන්නේ එරටදී උපත ලද සිංහල දරුවන්ට අපගේ ජාතික උරුමයක් වන දේශිය කලාව පිළිබඳ හැඟීමක් ඇති කිරීමට හැකි වූ බැවිනි.1999 මැයි 19 වැනි දින ශාන්ත බාබරා විශ්ව විද්‍යාලයේ ආචාර්ය මණ්ඩලය හා සිසුන් වෙනුවෙන් දේශීය නර්තන ,ගායනය ,වාදන පිළිබඳ ප්‍රායෝගික දේශනයක් පැවැත් වීමෙන් විශ්ව සංගීතය හදාරණ ( WORLD MUSIC)උපාධි අපේක්ෂකයන්ට ශ්‍රී ලංකික කලාවන් පිළිබඳ අවබෝධයක් ලබාදුනි.නිදර්ශන සහිතව පැවැත්වුණු මේ වැඩමුළුව සාර්ථක කර ගැනීමෙහිලා කාන්ති ශිල්පාධිපති හා මාධවී ශිල්පාධිපති ශිල්පිනියන්ගේ සහභාගිත්වය ඉතා වැදගත් වූ බවට තොරතුරු ලැබේ.

ආචාර්ය පියසාර ශිල්පාධිපති නම් වූ අප කලාකරුවාණන් දෙස් විදෙස්හි පතල ප්‍රවීණයකු පමණක් නොව එකී ශිල්ප ඉගැන්වීමෙහි ලා අතිදක්ෂ ගුරුවරයෙකි.දේශීය අවනද්ධ භාණ්ඩ අතරට ගැවුල නම් වූ සුවිශේෂි බෙරයක් හඳුන්වා දී ඒ සඳහා වාදන ශෛලියක්ද හඳුන්වා දුන් අයෙකි.සාම්ප්‍රදායික තම්මැට්ටමට දඬු බෙරය එක් කර වාදනය කිරීමේ රටාව වත්මනට හඳුන්වාදීමද ශ්‍රේෂ්ඨ කර්තව්‍යයකි. මොහු විසින් දේශීය නර්තන හා වාදන කලාව පිළිබඳ ගවේශනාත්මක ලිපි පළ කිරීමත් සංදර්ශණාත්මක දේශණ පවත්වමින් දේශිය කලාවන් ජනගත කිරීමට ගත් උත්සාහය මෙහිලා කෘතවේදීව සඳහන් කළ යුතුය.

නර්තන වාදන කලාවේ සෞන්දර්යාත්මක සුලලිත වූ ප්‍රායෝගික ක්‍රියාවලියේ නවතම සොයාගැනීම් හා නවතම ප්‍රායෝගික භාවිතයන් හා වත්මන් පරපුරට දායාද කිරීමේ පුරෝගාමී මෙහෙවරක පෙරගමන් කරුවකු වන අප කතානායකයන් මානව දයාවෙන් පිරිපුන් ආචාර්යවරයකු ලෙස සටහන් තබන්නේ අප ලද දීර්ඝ කාලීන ගුරු ඇසුර පිළිබඳ ගෞරවයෙනි.

**මහාචාර්ය කරුණාරත්න බණ්ඩාර**
**සභාපති, නර්තන හා මුද්‍රා නාට්‍ය උපදේශක මණ්ඩලය**

# එජාප නායකත්වය රුවන් විජයවර්ධනට දෙන්න

## යොවුන් පෙරමුණ එජාප නායකත්වයෙන් ඉල්ලයි

**කොළඹ සමූහ - ආරියරත්න ගනේගොඩ**

යහපාලන රජයේ ජනමාධ්‍ය රාජ්‍ය ඇමැති ලෙස කටයුතු කළ රුවන් විජයවර්ධන මහතා මේ වන විට කැලණියේ එජාප ප්‍රධාන සංවිධායකයා ලෙස පත්ව සිටින අතර ඒ මහතාට එක්සත් ජාතික පක්ෂයේ නායකත්වය ලබාදෙන ලෙස වත්මන් ජාතික යොවුන් පෙරමුණ එජාප නායකත්වයෙන් ඉල්ලයි.

ජාතික යොවුන් පෙරමුණේ නායකයන්ගේ මෙහෙයවීමෙන් ගාලු මුවදොරට සමීප කාර්යාලයක පැවැති මාධ්‍ය හමුවකදී එහි ලේකම් දර්ශ බ්‍රාහ්මණ මහතා මේ ඉල්ලීම කළේය.

මෙහිදී ජාතික යොවුන් පෙරමුණේ ලේකම් දර්ශ බ්‍රාහ්මණ මහතා මෙසේද කීය.

දැන් ටික කාලයක සිට එක්සත් ජාතික පක්ෂයේ නායකත්වය තරුණ ජවයක් තිබෙන, මුහුකුරා ගිය දේශපාලන දැනුමක් ඇති, රටේ ජනතාවටත් රටටත් ආදරයක් තිබෙන කිසිම හොර වංචාවකට මැරකම්වලට සබඳකමක් නැති පුද්ගලයෙක් හැටියට රුවන් විජයවර්ධන මහතා එක්සත් ජාතික පක්ෂ නායකත්වයට ජාතික යොවුන් තරුණ පෙරමුණ මගින් යෝජනා කළ බව ද යොවුන් පෙරමුණේ ක්‍රියාකාරීන් 42 දෙනාගෙන් 32ක් රුවන් විජයවර්ධන මහතාට කැමැත්ත ප්‍රකාශ කළ බව ද ඒ මහතා පැවසීය.

පක්ෂයේ ඉදිරි පෙළ හා පසු පෙළ නායකයන් ලෙස අකිල විරාජ් කාරියවසම් , අර්ජුන රණතුංග , නවීන් දිසානායක, පාලිත රංගෙ බණ්ඩාර සමඟ රුවන් විජයවර්ධන නායකයන් එජාප නායකත්වයේ සිට පහළට පවතින තනතුරුවලට පත් කළ යුතු බව ද රටේ බහුතර ජනතාවගේ කැමැත්ත මේ වන විටත් ඒ සඳහා ලැබී තිබෙන බව ද ජාතික යොවුන් පෙරමුණේ ලේකම්වරයා සඳහන් කළේය.

එජාප නායක රනිල් වික්‍රමසිංහ මහතාගේ කාලයේ සිටම සජිත් ප්‍රේමදාස වත්මන් විපක්ෂ නායකවරයාගෙන් එජාපය බෙදීම ඇරඹිණි. ඉදිරි කාලයේදී ඔබ යෝජනා කරන එජාප නායකයා ලෙස පත්වුවහොත් සමගි ජන බලවේගය සමඟ එකතුවනවාදැයි මාධ්‍යවේදියකුගේ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් ජාතික යොවුන් පෙරමුණේ ලේකම් දර්ශ බ්‍රාහ්මණ මහතා කියා සිටියේ බොහෝ විට සමගි වී එකට ගමන් කිරීම සිදු විය හැකි බවයි.

එක්සත් ජාතික පක්ෂය හා සමගි ජනබලවේගය එකතු වී ඉදිරි මැතිවරණයකදී ගිය කාලයේ එජාපයට ඡන්දය පාවිච්චි නොකළ ජනතාවගේ ඡන්දය ලබාගැනීම හරහා විශාල ජයක් ලබන බව ද රුවන් විජයවර්ධන මහතා මේ වනවිටත් ඒ වෙනුවෙන් කැමැත්ත පළ කර ඇතැයි ද හෙතෙම සඳහන් කළේය.

ජාතික යොවුන් පෙරමුණේ සංවිධායක චාමර රුද්‍රිගෝ මහතා-

ජාතික යොවුන් පෙරමුණේ හිටපු නායකයා ලෙස කටයුතු කළ රුවන් විජයවර්ධන මහතාට එජාප නායකත්වය ලබා දෙනවාට ජනතාව තුළ විශාල කැමැත්තක් තිබෙනවා.එතුමා 2007 , 2008 විශාල සේවාවක් අප රටේ තරුණ තරුණියන්ටත් සිදු කළා. ඒ අවධියේදී සාර්ථක මැයි රැලියක් පැවැත්වීම පිළිබඳ ජාතික යොවුන් පෙරමුණ ජාත්‍යන්තර ප්‍රසාදයට ලක්ව තිබෙනවා.

රුවන් විජයවර්ධන මහතා වෛරී දේශපාලනයකින් තොරව කටයුතු කළ නිසා ගම්පහ දිස්ත්‍රික්කයේ පමණක් නොව ශ්‍රී ලංකාවේම විජයවර්ධන පවුල ඉතාමත් හොඳ පවුලක් ලෙස ජාත්‍යන්තර ප්‍රසාදයට ලක්ව තිබෙන බව ද චාමර රුද්‍රිගෝ මහතා පැවසීය.

එක්සත් ජාතික පක්ෂය ආරම්භයේදී මෙන් අනෙකුත් නිලතලවලට දෙමළ , මුස්ලිම් නායකයන්ද පසුව පත්කරන බව තවත් මාධ්‍යවේදියකුගේ පැනයකට පිළිතුරු දෙමින් චාමර රුද්‍රිගෝ මහතා පැවසීය.

කොළඹ මහ නගර සභාවේ නාගරික මන්ත්‍රී දුමින්ද ආටිගල, ජාතික යොවුන් පෙරමුණේ විධායක සභික පියුමාල් කාවින්ද මහත්වරු ද මේ අවස්ථාවට සහභාගී වූහ.



# දිනමිණ පුවතින් පසු
# පුලියන්කුලම මැස්සන්ගේ කරදරයට විසඳුම්

සතර දෙසින් pronews@lakehouse.lk පුවතක් පසුපස







## කුකුළු ගොවිපළේ අඩුපාඩු හදන්න දින 14ක්

**කේ. ප්‍රියංකර කළුපහන - වනාතවිල්ලුව සමූහ**

"කුකුළු ගොවිපළක් ගමක් වනසයි" යන මැයෙන් ඉකුත් මස (28) වැනි දින 'දිනමිණ' පුවත්පත ඔස්සේ සිදු කළ අනාවරණයත් සමග පෙරේදා (03) දින පුත්තලම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් කණ්ඩායමක් අදාළ ගොවිපළ නිරීක්ෂණය සඳහා එක්ව තිබිණි.

එහි පැමිණි මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ දැඩි අවධානයට යොමු වී තිබූ මහජන පීඩාකාරි ගැටලු කිහිපයක් පිළිබඳ කළ සොයා බැලීමේදී ගොවිපළේ තිබූ අඩුපාඩු කිහිපයක් පිළිබඳ කරුණු අනාවරණය වීමත් සමග අදාළ ගොවිපළේ පාලන අධිකාරිය ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරීන් වෙත එම අඩුපාඩු පිළිබඳව දීර්ඝ පැහැදිලි කිරීමක් සිදු කළ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් දින 14ක් ඇතුළත වහාම ක්‍රියාත්මක වන පරිදි එකී අඩුපාඩු සපුරා ගත යුතු බවත් ඒවා නැවත නිරීක්ෂණයට ලක්කළ යුතු බව පවසමින් අවවාද කිරීමට කටයුතු කෙරිණි.

වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් බණ්ඩාරනායකපුර, කාටුපුලියන්කුලම ගම්මානයේ අක්කර විසි පහකට ආසන්න පෞද්ගලික ඉඩමක වසර පහළොවක පමණ කාලයක සිට අක්‍රමත් ආකාරයෙන් පවත්වාගෙන යනු ලබන මෙම මහා පරිමාණ කුකුළු ගොවිපළ හේතුවෙන් උග්‍ර ලෙස ගෙමැස්සන් ගම්මානයක්ම ආක්‍රමණය කර ඇති බවට ගම්මු අදාළ වගකිව යුතු බලධාරීන්ට චෝදනා කර තිබිණි.

අදාළ ගොවිපළේ මරණයට පත් වන කුකුළන් හෝ සත්ත්ව කොටස් බැහැර කිරීම සඳහා සකස් කරන ලද මෝවරියක් හෝ එකී කොටස් විනාශ කිරීම සඳහා අදාළ ගොවිපළේ නිසි ක්‍රමවේදයක් නොමැතිකම පිළිබඳව අනාවරණය කිරීමත් සමග ඒ පිළිබඳව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සෘජු අවධානය යොමුව තිබිණි.

එහිදී මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු ගොවිපළේ පිහිටි මෝචරිය නිරීක්ෂණය කිරීම සඳහා පැමිණි අවස්ථාවේදී එය නිසි සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදයකට ඉදිකර නොමැති බවත් මිය යන කුකුළන් අදාළ මෝචරිවලට බහාලීමෙන් පසුව ක්ලෝරීන් හෝ විශබීජ නාශකයක් භාවිත කරන ලෙසත්, අදාළ මෝචරි වළ වසා තබන පියන නිසි ලෙස මුද්‍ර තබා සකස් කරන ලෙසයි. එසේ නොකරන්නේ නම් දින 14ක් ඇතුළත තමන්ට එරෙහිව අධිකරණ ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරන බවද කියා සිටියහ.

මේ සම්බන්ධයෙන් අප කළ විමසුකදී පුත්තලම පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක එන්. සුරේෂ් මහතා පවසා සිටියේ මෙවැන්නි අදහසකි,

'අපි පළමුවෙන්ම 'දිනමිණ පුවත් පතට ස්තුතිය පළ කරනවා. මොකද ජනතාවගේ ප්‍රශ්න පිළිබඳ සාකච්චා කිරීම හා ඒවාට අවශ්‍ය විසඳුම් ලබා දීමට දක්වන උනන්දුව පිළිබඳව. අපි මීට පෙර අවස්ථා කිහිපයක්ම මේ ගොවිපළ පිළිබඳ සොයා බැලීම සඳහා අපගේ වසම බාර මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා යොමු කරලා තියෙනවා. ඒ අවස්ථාවේදී මේ ගොවිපළෙන් මහජන පීඩාකාරි කටයුත්තක් වාර්තාවී නොමැති බවත්, මාධ්‍ය ඔස්සේ වාර්තා වීම හැර ප්‍රදේශයේ කිසිදු පුද්ගලයෙකු විසින් කිසිදු පැමිණිල්ලක් මේ වන තෙක් තිකුත් කර නොමැති බවත්, අද දින කළ නිරීක්ෂණයෙන් පසුව තමන් අදාළ ගොවිපළේ හිමිකරු ඇතුළු කාර්ය මණ්ඩලයේ සිටින සියලු දෙනාව මේ පිළිබඳව දැනුවත් කරලා තියෙන්නේ. අදාළ ගොවිපළේ පැවති අඩුපාඩු කිහිපයක් සම්බන්ධයෙන් තමන්ගේ අවධානයට යොමුව තිබීම නිසා එවැනි අඩුපාඩු දින 14ක් ඇතුළත සකස් කර නැවත පෙන්වන ලෙසත් එසේ පෙන්වීමට අපොහොසත් වූව හොත් තමන්ට එරෙහිව අධිකරණය ඔස්සේ අධිකරණ ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු සිදු කරන බවයි. එහිදී තමන් ඇතුළු අනෙක් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ද ගම්මානයේ නිරීක්ෂණ චාරිකාවකට එක්ව ජනතාව සමගද සාකච්ඡාවක් සිදු කළ බවයි.'

ගම්වාසී නිමල් මහතා අදහස් දක්වමින්,

'දිනමිණ' පත්තරේ අපට ලොකු සේවාවක් සපයලා දුන්නා ඒක අපට කියලා නිම කරන්න බැහැ. 'රජයේ පුවත්පතක් මේ වගේ දෙයක් කරයි කියලා අප හීනෙකින්වත් හිතුවේ නැහැ. අපි නොහිතපු ආකාරයේ විසඳුමක් අපිට ලැබුණා.'

## රැකියා විරහිත උපාධිධාරීන් 158කට නව පත්වීම්



**ආර්. ඥාණදාස - අම්බලන්ගොඩ සමූහ**

නව රජයේ සෞභාග්‍යයේ දැක්ම යටතේ අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල බලප්‍රදේශයේ පදිංචි රැකියා විරහිත උපාධිධාරීන් එකසිය පනස් අට දෙනකුට පත්වීම් ලිපි ප්‍රදානය කිරීමේ උත්සවයක් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ගාල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ෂාන් විජයලාල් සිල්වා මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා (02) සිදු කරනු ලැබීය.

මෙම අවස්ථාවට අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලෙකම් සරසි එස්. ගුණසේකර, අම්බලන්ගොඩ නගර සභාපති නීතිඥ අරුණ ප්‍රදීප්, අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාවේ උප සභාපති ඉන්ද්‍රජිත් සමන් කුමාර, අම්බලන්ගොඩ නගර සභා මන්ත්‍රීවරුන් වන ශ්‍රේෂන් කෙරමිණියගේ සහ ඩබ්ලිව්.එම්. නිලානි යන මහත්ම මහත්මීන් එක්ව සිටියහ. මෙහි දැක්වෙන්නේ පාර්මේන්තු මන්ත්‍රී ෂාන් විජයලාල් සිල්වා මහතා විසින් රැකියාලාභී උපාධිධාරිනියකට පත්වීම් ලිපිය බාර දුන් අවස්ථාවයි.

## පරිභෝජනයට නුසුදුසු හාල්මැස්සන් සහ සූදුරු

**සේන ඉදිරිසිංහ - වයඹ පළාත් සංචාරක**

පරිභෝජනයට නුසුදුසු හාල්මැස්සන් කිලෝ 3,000ක් හා සූදුරු තොගයක් පාරිභෝගික අධිකාරියේ කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලයේ විමර්ශන නිලධාරීන් විසින් වටලා තිබේ.

මීට අමතරව සත්ත්ව ආහාරය සඳහා තිබූ සහල් කිලෝ 3,000කට වැඩි ප්‍රමාණයක්ද වටලා ඇති බව පාරිභෝගික අධිකාරියේ වයඹ පළාත් සහකාර අධ්‍යක්ෂ එච්.ඒ. ගුණරත්න මහතා පැවැසීය.

උඩුබද්දාව බණ්ඩාර කොස්වත්ත හා පොල්පිතිගම යන ප්‍රදේශවලින් මෙම වැටලීම් සිදු කර තිබේ.

## ජන පොත

### සාම විනිසුරු පදවි ලබති

**ශ්‍යාමලී නිශාන්ති**



ගම්පොළ ගාමිණී අල්විර මහතා මහනුවර අධිකරණ කලාපය සඳහා සමාදාන විනිශ්යකාරවරයකු වශයෙන් පසුගියදා දිව්රුම් දෙනු ලැබිණි.

ශ්‍රී ලංකා යුද හමුදා නිත්‍ය බළසේනාවේ ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ විශ්‍රාම ලත් බලයලත් දෙවන පන්තියේ නිලධාරියකු වන ඒ මහතා මහනුවර ශාන්ත සිල්වෙස්ටර් විදුහලේ ආදී සිසුවෙකි.

හමුදා සේවයේදී උත්තම සේවා, දීර්ඝ සේවා, පූර්ණ භූමි, උතුරු මානුෂීය මෙහෙයුම්, නැගෙනහිර මානුෂීය මෙහෙයුම්, උතුරු නැගෙනහිර සංක්‍රාමික සේවා, රිවිරැස මෙහෙයුම්, යුද හමුදා 60 වැනි සංවත්සර සහ ස්වර්ණ ජයන්ති පදක්කම් ලාභියකු වන අල්විර මහතා වසර 22ක යුද හමුදා සේවයෙන් විශ්‍රාම ලැබූවෙකි.

---



ප්‍රවීන ජෝතිෂවේදී හපුආරච්චිලාගේ ප්‍රේමරත්න මහතා මුළු දිවයිනටම සාමදාන විනිශචයකාරවයරකු වශයෙන් පසුගියදා රත්නපුර පැල්මඩුල්ල මහේස්ත්‍රාත් ජේ.එන්.ආර්. පෙරේරා මහත්මිය ඉදිරියේ දිවුරුම් දුන්නේය.

රත්නපුර පේරලන්ද ප්‍රදේශයේ 1961 වර්ෂයේදී උපත ලැබූ ප්‍රේමරත්න මහතා ඉහළ හකමුව ර/ පේරලන්ඳ විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලැබූ අතර අනතුරුව අ.පො.ස සාමාන්‍ය පෙළ දක්වා ර/බටුගෙදර විද්‍යාලයෙන් අධ්‍යාපනය ලැබීය. දීර්ඝ කාලයක් සමාජ සේවාවන්වල යෙදුණු ඒ මහතා ජෝතීර්වේදී විද්‍යාව හදුරා ප්‍රවීණ ජෝතිෂවේදීයකු ලෙස කටයුතු කරයි.

---

**වින්සර් මුණුගොඩ - වඳුරඹ සමූහ**



ගාල්ල මැදකීඹිය හිරිගල්කැටිය පදිංචි ජගත් වික්‍රම වැලිවිටිගොඩ මහතා බද්දේගම මහේස්ත්‍රාත් දිසා විනිසුරු එච්. යූ. කේ. පැල්පොළ මහතා ඉදිරියේ 2020/08/26 වැනි දින ගාල්ල අධිකරණ කලාපය තුළ සාම විනිසුරුවරයකු වශයෙන් දිවුරුම් දුන්නේය.

ගා/ කීඹිය ගාමිණී මහා විද්‍යාලයේ ඉගෙනුම ලැබූ ඒ මහතා නැසීගිය ප්‍රකට සමාජ සේවක ඩී. පී. වැලිවිටිගොඩ මහතාගේ පුත්‍රයෙකි.

බද්දේගම, අඳුරත්විල සමෘද්ධි කලාපයේ හිටපු සමෘද්ධි සංවර්ධන නිලධාරියකු වන ඔහු ප්‍රසිද්ධ සමාජ සේවකයෙකි.

---

**ඒ.ඒ.එල්. ඩයස් - මාතලේ දිස්ත්‍රික් සමූහ**



කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 25, ඉහළගම, මඩාටුගම ලිපිනයෙහි පදිංචි සෙනෙවිරත්න ගෝමර මුදියන්සේලාගේ ප්‍රේමරත්න මහතා මුළු දිවයිනටම බලපාන පරිදි සමාදාන විනිශ්චයවරයකු ලෙස පසුගියදා කැකිරාව දිසා/ මහේස්ත්‍රාත් අධිකරණයේදී දිවුරුම් දෙන ලදී.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නිලධාරියකු ලෙස දිගු කලක් සේවය කළ ඒ මහතා සිය සේවයෙන් විශ්‍රාම ගැනීමෙන් පසු ප්‍රදේශයේ පොදු සේවාවල යෙදෙමින් විශාල සමාජ මෙහෙවරක යෙදී සිටියි.

මේ වන විට ප්‍රදේශයේ සමිති සමාගම් රැසකම විවිධ තිලතල උසුලමින් අඛණ්ඩ ජනතා මෙහෙවරක යෙදෙන ඒ මහතා මඩාටුගම, කොටාගල ඓතිහාසික කොටසර පියංගල රජමහ විහාරස්ථානයේ දායක සභාවේ ක්‍රියාකාරි සාමාජිකයකු ලෙස ද මේ වන විට කටයුතු කරයි.

### විශ්‍රාම ලබයි



**ඩී.ජ්. හේවාතිලක වතුරුගම සමූහ**

ගම්පහ, යක්කල, වික්‍රමාරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහලේ වසර 36, තිස්හයක රාජකාරී කාලයක් සම්පූර්ණ කළ ඩී.ජ්. හේවාතිලක මහතා පසුගිය දින සිය රාජකාරියෙන් විශ්‍රාම ලැබීය.

වික්‍රමාරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහල් තත්ත්වයට උසස් වීමට පෙර සිට වික්‍රමාරච්චි රෝහලේ බාහිර රෝගී අංශය විවිධ තනතුරු ගණනාවක්ම දරා ඇති ඒ මහතා විශ්‍රාම ලබා යන විට රෝහලේ බාහිර හා අභ්‍යන්තර පරිපාලන අංශයේ කටයුතු කළේය.

වික්‍රමාරච්චි ආයුර්වේද රෝහලේ මරණාධාර හා අන්‍යෝන්‍යාධාර සමිතිය භාණ්ඩාගාරික තනතුරත්, වික්‍රමාරච්චි විද්‍යාලයීය සුබ සාධක සමිතියේ නිල බලයෙන් නියෝජ්‍ය භාණ්ඩාගාරික තනතුරත් ඇතුළු වික්‍රමාරච්චි රෝහලේ පොදු සමිති සංවිධාන රැසකම විවිධ නිලතල හොබවා ඇත.

ඩී.ජ්. හේවාතිලක මහතා මේ වන විට විශ්‍රාම ලබා ගම්පහ වික්‍රමාරච්චි ඖෂධ පෞද්ගලික සමාගමේ කැඩුම් බිඳුම් වෛද්‍යවරයකු වශයෙන් සේවය කරයි.

# අලුත්

දිනමිණ

The Dinamina 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත தினமின

## සඳුදා සිට කියවන්න

සඳුදා ද්වාර
කාලතුයේ ඩිජිටල් දොරටුව

අඟහරුවාදා බද්දරමල්ල
සතියේ 'තුනපහ' මඩිස්සලේ

බදාදා පැළැස්ස
සාර භූමියේ හරිතානන්දය

බ්‍රහස්පතින්දා කතාරම

සිකුරාදා දේශවංශය

සෙනසුරාදා යොවුන් ජනතා

දිනපතා සුවිශේෂ අතිරේක 6ක් සමඟ

සමබර - හරබර - රසබර - දිනමිණ

ඔබේ පිටපත අදම වෙන් කරවා ගන්න

LAKE HOUSE ලේක්හවුස් ප්‍රකාශනයක්

# පාරිභෝගික ප්‍රජාව කෙරෙහි වෙළෙඳපොළ ඛණ්ඩනයේ බලපෑම

වෙළෙඳපොළ ඛණ්ඩනය යනු සමස්ත ඉලක්ක වෙළෙඳපොළ කුඩා කොටස්වලට බෙදා ඒ ඒ පාරිභෝගිකයන් සැලකිල්ලට ගනිමින් අදාළ නිෂ්පාදිත ඉදිරිපත් කිරීමයි. ව්‍යාපාරයක් සිය අලෙවිකරණ ප්‍රයත්න කෙරෙහි අවධානය යොමු කරන වෙළෙඳපොළක් තෝරාගන්නා විට ව්‍යාපාර ඉලක්ක කරගත් වෙළෙඳපොළක් හඳුනාගෙන තිබේ. ඉලක්ක වෙළෙඳපොළ තවදුරටත් කොටස්වලට බෙදා ඇති අතර අලෙවිකරණ ප්‍රයත්නයන්ට අදාළ වන විශේෂිත ගුණාංග බෙදාගන්නා පාරිභෝගිකයන්ගෙන් මේ වෙළෙඳපොළ කොටස් සමන්විත වේ.

අලෙවිකරණ උපායමාර්ගයක් ක්‍රියාකාරී සැලැස්මක් සහ විකල්ප කිහිපයක් අතරින් තෝරාගත් ක්‍රියාමාර්ගයකි. එමෙන්ම විවිධාකාර අලෙවිකරණ ක්‍රමෝපාය බොහෝ විට ද්විතීය අලෙවිකරණ උපාය මාර්ගයකට වඩා සෑමවිටම ඵලදායී වේ. ද්විතීය අලෙවිකරණ උපායමාර්ග වෙළෙඳපොළ අංශ අතර වෙනස සැලකිල්ලට නොගනී. එමෙන්ම ඉලක්කයේ ඇතුළත් කිරීමට අදහස් කරන සියලුම වෙළෙඳපොළට එකම අලෙවිකරණ මිශ්‍රණය භාවිත කරයි.

අලෙවිකරණ උපායමාර්ග ඉලක්කගත වෙළෙඳපොළ සහ අලෙවිකරණ මිශ්‍රණ එක් කරයි. අලෙවිකරණ මිශ්‍රණයක් පාරිභෝගිකයන් සමග හොඳම සම්බන්ධතාව නිර්මාණය කිරීම සඳහා කළ හැකි විචල්‍යයන්ගෙන් සමන්විත වේ. අලෙවිකරණ මිශ්‍රණයේ විචල්‍යයන් හතරක් ලෙස හැඳින්වේ. ඒවා නම්, නිෂ්පාදිතය, මිල, ස්ථානය, හා ප්‍රවර්ධනය යන ඒවායි.

**අද්විතීය අලෙවිකරණ උපායමාර්ග තීරණය කරන්නේ කෙසේද?**

විවිධාකාර අලෙවිකරණ උපායමාර්ගයේ ප්‍රතිලාභයක් වන්නේ විවිධ පාරිභෝගික කණ්ඩායම් මත උපායමාර්ගයේ ඵලදායීතාව පිළිබඳ වඩාත් සමීප විශ්ලේෂණයක් කිරීමයි. වෙළෙඳපොළ පර්යේෂණ විශ්ලේෂණ ශිල්පීය ක්‍රම භාවිත කිරීම, අලෙවිකරණ උපායමාර්ග සහ වෙළෙඳපොළ කොටස් අතර ගැළපෙන ගැඹුරු අවබෝධයක් විය හැකිය. මේ තොරතුරු සමග සන්නද්ධකරුවන් හා ව්‍යාපාරික තීරණ ගන්නන්, විවිධ පාරිභෝගිකයන් හා පාරිභෝගික කණ්ඩායම් සඳහා ප්‍රශස්ත උපායමාර්ගය තීරණය කළ හැකිය.

වෙළෙඳපොළ කාණ්ඩ පහත පරිදි විස්තර කළ හැකිය. පවත්වාගෙන යෑම සඳහා කාණ්ඩ, පරිවර්තනය කිරීම සඳහා කාණ්ඩ, වර්ධනය වන කොටස්, හා නොසළකා හරිනු ඇත යන්නයි. ඉලක්ක ගත වෙළෙඳපොළ බෙදීම් පිටුපස ඇති තර්කනය අනුව වෙළෙඳපොළේ සමස්ත විශ්වයම අලෙවිකරණ හා වෙළෙඳ ප්‍රචාරණ සීමිත සම්පත් මගින් විසඳිය නොහැකිය. සාර්ථකත්වයේ වැඩිම සම්භාවිතාව සහිත වෙළෙඳපොළ ඉලක්ක කිරීම අවශ්‍ය වන අතර ඉලක්ක ගත වෙළෙඳපොළවල ගුණාංග පිළිබඳ වෙළෙඳපොළ ඛණ්ඩනය පැහැදිලි කළ යුතුය. බිඳවැටීම මෙවැන්නක් විය යුතුය.

**නඩත්තු කිරීම** – මේ වෙළෙඳපොළ කොටස ප්‍රධාන පාරිභෝගිකයන්ගෙන් සමන්විත වේ. මේ වෙළෙඳපොළේ සිටින ගනුදෙනුකරුවන්ට පවතින අලෙවිකරණ මිශ්‍රණය සමග හොඳ තත්ත්වයේ පවතින බැවින් ව්‍යාපාරයට ආකර්ෂණීය වන අතර එම වෙළෙඳ නාමයට ඔවුන් සම්බන්ධ වීමට ඉතාම සුළු උත්සාහයක් දැරිය යුතුය. මෙය පාරිභෝගිකයන් තරගකරුවන්ගේ ප්‍රහාරවලින් ආරක්ෂා කිරීම සඳහා හොඳ උපායමාර්ගයකි.

**පරිවර්තනය කිරීම** – මේ වෙළෙඳපොළ කොටස නිෂ්පාදනයක් හෝ සේවාවක් සඳහා ආකර්ෂණය කළ හැකි පාරිභෝගිකයන්ගෙන් සමන්විත වේ. එහෙත් වර්තමානයේ එය අලෙවිකරණ මිශ්‍රණයෙන් උපරිම ඵල නෙළා නොගනී. ඵලදායී ඉලක්කයක් ලෙස මේ වෙළෙඳපොළ කොටස සඳහා යම් සම්පත් ප්‍රමාණයක් වැයකිරීම සාමාන්‍යයෙන් අදහස් වන්නේ අලෙවිකරණ මිශ්‍රණයේ යම් අංගයක් මෙහෙයවිය යුතු හෝ වැඩිදියුණු කළ යුතු බවයි.

**වර්ධනය** – මේ වෙළෙඳපොළ කොටස පාරිභෝගිකයන්ට සුළු පරිමාණ ව්‍යාපාරයකින් ලබාගත හැකි බැවින් පහසුවෙන් ඉලක්ක ගත හැකිය. සාමාන්‍යයෙන් මේ වෙළෙඳපොළ කොටස වර්තමාන මට්ටම්වල ලාභදායී නොවන අතර, පාරිභෝගිකයන් හා අලෙවිකරණ මිශ්‍රණය අතර ගැළපීම පරීක්ෂා කිරීමට කාලාන්තර සමාලෝචන අත්‍යවශ්‍ය වේ.

**නොසලකා හැරීම** – මේ වෙළෙඳපොළ කොටස සාමාන්‍යයෙන් ඉලක්ක ගත වෙළෙඳපොළ තීරණය කිරීමටත් වෙළෙඳපොළ පර්යේෂකයන් සහ අලෙවිකරුවන්ට ගැළපෙන පරිදි සොයා ගැනීමට පුහුණු කිරීමටත් වෙහෙස විය හැකිය.

එසේ නම් වෙළෙඳපොළ ඛණ්ඩනය ඉලක්ක වෙළෙඳපොළ මෙන්ම පාරිභෝගිකයන් කෙරෙහි කෙසේ බලපාන්නේද යන්න මෙයින් පැහැදිලි වන්නට ඇත.

**ඩී.එම්. හිරුණි අනුත්තරා දිසානායක**
**තෙවන වසර**
**වාණිජ හා කළමනාකරණ පීඨය**
**ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය**

රැකී රක්ෂා

ලුහුඬු දැන්වීම්




311

**ඇබෑර්තු**

තොරතුරු තාක්ෂණය

ග්‍රැෆික් ඩිසයිනර් - ෆොටෝෂොප්, කොරල් ඩ්‍රෝ සහ ඉලස්ට්‍රේටර් දන්නා සිංහල, ඉංග්‍රීසි ටයිප් සෙටින් කල හැකි ග්‍රැෆික් ඩිසයිනර් අවශ්‍යය. (බදුල්ල අවට අයට විශේෂිතයි) බ්‍රවුන්කී පුද්ගලික සමාගම, 264, කැප්පෙටිපොල පාර, බදුල්ල. 055-2224525 / 0765442142 email : brownkey@gmail.com 051039



312

**ඇබෑර්තු**

කාර්මික

3 Phase S/Phase මෝටර් ජෙනරේටර් වතුර පොම්ප නැවත ඔතන්නන් මනා පලපුරුද්ද ඉතා වැදගත් වැටුප් සාකච්ඡා කළ හැක. අතිකාල දීමනා වසර අවසාන බෝනස් ඉන්ෂුවරන්ස් ආදිය අමතන්න. 0722822805, 0771594967. ටොම්සන් ඇන්ඩ් සන්ස්, 20, මීගමු පාර, ඔලියමුල්ල, වත්තල. 052061



322

**ඇබෑර්තු**

මේසන්වරු/වඩුබාස්වරු

මේසන් බාස්වරු අවශ්‍යයි. කොළඹ, මහරගම. 072-2447916, 077-3053326 051777

සතර පෝදා එළිදකින සදහම් ප්‍රදීපය

බුදුසරණ

## සීමිත වගකීම් සමාගමක් සංස්ථාගත කිරීමක් පිළිබඳ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව කෙරෙනු ලබන දැන්වීමයි.

සමාගමේ නාමය : **මිනාමි ට්‍රේඩිං (පීවීටී) එල්ටීඩී**

සමාගමේ ලියාපදිංචි අංකය : **පී.වී. 131705**

ලියාපදිංචි ලිපිනය : **සීමාසහිත මාතර පේෂ කාර්මිකයන්ගේ සමුපකාර සමිතිය, මීරා පාර, ඉසදීන් නගරය, මාතර.**

**සමාගමේ ලේකම්වරු.**

## සීමාසහිත ශ්‍රී ජයවර්ධනපුර විවිධ සේවා සමුපකාර සමිතිය

## වටිනා උකස් රන් භාණ්ඩ වෙන්දේසිය

මහජන බැංකුවේ උකස් නියෝජිතයින් වන සී/ස ශ්‍රී ජයවර්ධනපුර විවිධ සේවා සමුපකාර සමිතියේ පහත සඳහන් ග්‍රාමීය බැංකු ශාඛා වෙත 2019-06-30 දින දක්වා උකස් තබන ලදුව, 2020-10-10 දින දක්වා බේරා නොගත් උකස් රන් භාණ්ඩ ඇතුල්කෝට්ටේ අංක 857 දරන ස්ථානයේ පිහිටි,

**සී/ස ශ්‍රී ජයවර්ධනපුර වි.සේ.ස සමිති ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ**
**2020-10-11 ඉරු දින පෙ.ව. 09.00 ට**
**ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.**

පිටකෝට්ටේ, නාවල, ඔබේසේකරපුර, ගංගොඩවිල, මිරිහාන, රාජගිරිය, කට්ටියහංදිය, මිරිහාන උතුර, නුගේගොඩ උතුර, ඇතුල්කෝට්ටේ.

**සාමාන්‍යාධිකාරී,**
**සී/ස ශ්‍රී ජයවර්ධනපුර වි.සේ.ස. සමිතිය,**
**අංක 857, ඇතුල්කෝට්ටේ, ශ්‍රී ජයවර්ධනපුර.**
**දුරකථන : 0112-863152, 011-4327843.**

## ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟළුම් ආයතනය

### කර්මාන්ත අමාත්‍යාංශය

### ආයතනයේ කාර්යය මණ්ඩලයට සහ ශිෂ්‍යයන් හට ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා

## මිල ගණන් කැඳවීම

අප ආයතනයේ කාර්යය මණ්ඩලයට සහ ශිෂ්‍යයන් හට ගාලු පාරේ සිට ආයතනය වෙත සහ ආයතනයේ සිට ගාලු පාර දක්වා ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

ආයතනයේ සිට ගාලු පාරට දුර ප්‍රමාණය කිලෝමීටර 2.5 – 03 ක් පමණ වෙයි.

- **බස් රථ - ආසන සංඛ්‍යාව 26 (ටාටා, ස්ටාර් වැනි)**

මිල ගණන් කැඳවීම 2020 සැප්තැම්බර් මස 18 වන දින ප.ව. 2.00 ට අවසන් වන අතර, එදිනම පස්වරු 3.00 ට මිල ගණන් විවෘත කරනු ලැබේ.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය,**
**කඳවල වත්ත, අංක 02,**
**සේනාධිපති ශ්‍රීමත් ජෝන් කොතලාවල පාර, රත්මලාන.**
**දු. අංකය : 0112632406 වෙබ් : www.slita.lk**

අනාගත සිහින සැබෑකර ගැනීමේ එකම මග

සිළුමිණ The Silumina

මංගල යෝජනා තීරයයි

## ලංසු කැඳවීමයි

### ක්‍රීඩා යෞවන කටයුතු, ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය

### දකුණු පළාත් සභාව

### උක්ත කරුණ මැයෙන් 2020 අගෝස්තු මස 20 දින පළ වූ ලංසු කැඳවීමේ දැන්වීම සංශෝධනය කිරීමයි.

**ඒ අනුව එම දැන්වීමේ පළමු (01) ඡේදය පහත පරිදි සංශෝධනය විය යුතු බව කාරුණිකව දන්වමි.**

01. ගාල්ල, ලබුදූව දක්ෂිණපාය 3 වන මහලේ පිහිටි දකුණු පළාත් ක්‍රීඩා යෞවන කටයුතු, ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් යෝග්‍ය හා සුදුසුකම්ලත් දකුණු පළාත තුළ ලියාපදිංචි ලංසුකරුවන්ගෙන් **"හික්කඩුව - නාරිගම බහු කාර්ය සේවා මධ්‍යස්ථානයේ වහළ ඉදිකිරීම"** ව්‍යාපෘතිය සඳහා මුද්‍රා තබන ලද ලංසුපත් භාරගනු ලැබේ.

02. තවද එම දැන්වීමේ අනෙකුත් කරුණු එලෙසම පවතින බවද වැඩිදුරටත් සඳහන් කර සිටිමි.

**රංජිත් යාපා,**
**ලේකම්, ක්‍රීඩා යෞවන කටයුතු, ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය,**
**3 වන මහළ, දක්ෂිණපාය, ලබුදූව, ගාල්ල.**

## ප්‍රසම්පාදන දැන්වීමයි

## කටුනායක සීදූව නගර සභාව

කටුනායක සීදූව නගර සභාව සඳහා අවශ්‍ය පහත උපලේඛනයේ සඳහන් ටයර් හා ටියුබ් මිලදී ගැනීම සඳහා 2020.09.25 දින ප.ව. 2.00 දක්වා මා විසින් මුද්‍රිත මිල ගණන් කැඳවනු ලැබේ.

එම මිල ගණන් 2020.09.25 දින ප.ව. 2.00 ට පෙර **"සභාපති, කටුනායක සීදූව නගර සභාව, සීදූව"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් නගර සභා කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමෙන් ඉදිරිපත් කරන ලෙස දන්වමි.

මිල ගණන් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"ටයර් හා ටියුබ් සඳහා මිල ගණන් 2020"** යන්න සඳහන් කළ යුතුය.

මිල ගණන් විවෘත කරන අවස්ථාවට මිල ගණන්කරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැක.

**උපලේඛනය**

| අනු අංකය | අයිතමය | PR අගය | වර්ගය | නිෂ්පාදිත රට | වටිනාකම (ඒකක මිල) |
|---|---|---|---|---|---|
| 01. | 450x10 ටයර් | | | | |
| 02. | 450x10 ටියුබ් | | | | |
| 03. | 11x28 ටයර් | | | | |
| 04. | 11x28 ටියුබ් | | | | |
| 05. | 700x16 ටයර් | | | | |
| 06. | 700x16 ටියුබ් | | | | |
| 07. | 750x16 ටයර් | | | | |
| 08. | 750x16 ටියුබ් | | | | |
| 09. | 12 1/2 / 80 - 18 (බැකෝ රථයේ ඉදිරිපස ටයර්) | | | | |
| 10. | 12 1/2 / 80 - 18 (බැකෝ රථයේ ඉදිරිපස ටියුබ්) | | | | |
| 11. | 750x16 රිම් කොලර් | | | | |

**2020.09.02 දින,**
**කටුනායක සීදූව නගර සභා කාර්යාලයේ දී.**

**ඩබ්ලිව්. සරත් පීරිස්,**
**සභාපති,**
**කටුනායක සීදූව නගර සභාව, සීදූව.**

## පිස්කල් වෙන්දේසියේ විකිණීමේ දැන්වීමයි.

### මාතර දිසා අධිකරණයේදීය

1983 අංක 32 හා 1992 අංක 11 දරන පනත් වලින් සංශෝධිත 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 59 (01) (ආ)යටතේ පවරන ලද නඩුකරයයි

නඩු අංකය : MS 1248 (මාතර දිසා අධිකරණය)
ස්වභාවය : ලඝු
වටිනාකම : රු. 333009.00
ඇස්කිසි අංකය : 18/20

චන්ද්‍රිකා වික්‍රමසිංහ සමුපකාර සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. දකුණු පළාත

**පැමිණිලිකරු**

**එදිරිව**

අබේසිරි කෝදගොඩ,පාඩගලේවත්ත,අලහේන්පිට,කිරින්ද පුහුල්වැල්ල

**විත්තිකරු**

ඉහත අංක දරන නඩුවේ වර්ෂ 2019 ක්වූ නොවැම්බර් මස 01 වන දින මාතර දිසා අධිකරණයේ නියෝගය අනුව පැමිණිලිකරු වෙත රුපියල් 333009.00 ක මුදල හා නඩු ගාස්තු අය කර ගැනීම පිණිස ඉහත නම් සඳහන් විත්තිකරුවන් විසින් ගෙවිය යුතු බවට නියෝග කොට තීන්දු ප්‍රකාශ කොට ඇත.

එකී තීන්දු ප්‍රකාශය අනුව විත්තිකරු විසින් ඇපයට උකස් කරන ලද මාතර ප්‍රසිද්ධ නොතාරිස් කංකානම් ගමගේ ගයනා කෘශාන්ති මහත්මිය විසින් 2011.06.27 දින ලියා සහතික කළ අංක 751 දරන ණය උකස්කරයට අදාළව අය විය යුතුව ඇති මුදල් විත්තිකරු විසින් ගෙවීම පැහැර හැර හෝ අපොහොසත් වී ඇති බැවින් ඉහත නම් සඳහන් විත්තිකරුට එරෙහිව නිකුත් කර ඇති ඇස්කිසිය ප්‍රකාරව 2019 ක්වූ නොවැම්බර් මස 01 දින දිසා අධිකරණයේ නියෝගය අනුව මාතර දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර් / නියෝජ්‍ය පිස්කල් විසින් තහනමට ගනු ලැබූ විත්තිකරුගේ පහත උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළවල සියලුම අයිතිවාසිකම් හා හිමිකම

වර්ෂ 2020 ක්වූ 10 මස 14 වන දින ප.ව. 1.00 ට එම දේපළ පිහිටි පාඩගලේවත්ත, අලහේන් පිට, කිරින්ද පුහුල්වැල්ලදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්නට යෙදෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**ඉහත කී උපලේඛනය**

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ ගඟබඩ පත්තුවේ ඕවිටිගමුවේ පිහිටි පාඩ ගලයා වත්තේහේන නමැති ඉඩම සම්බන්ධයෙන් මාතර දිස්ත්‍රික් උසාවියේ පැවති පී 15321 දරන බෙදුම් නඩුවේ අවසාන තීන්දුව ප්‍රකාරව එකී නඩුවට ගොනුකර ඇති බලයලත් මිනින්දෝරු ඒ.ඩබ්.පී.ගුණතිලක මහතා විසින් මැන සම්පාදිත අංක 564ඒ සහ 2001.12.22 දින දරන පිඹුර ප්‍රකාරව බෙද වෙන් කරන ලද කැබලි අංක 12 දරන උතුරට; මෙම ඉඩමේ මැන බෙද වෙන් කළ අංක 20 සහ අංක 11 දරන කැබලිද, නැගෙනහිරට මෙම ඉඩම් මැන බෙද වෙන් කළ අංක 15 දරන කැබැල්ල සහ මුවතුරු වෙහේනේ දෙල ද,දකුණට : මෙම ඉඩමේ මැන බෙද වෙන් කළ අංක 15 දරන කැබැල්ලද. බස්නාහිරට: මෙම ඉඩමේ මැන බෙද වෙන් කළ අංක 19 දරන කැබැල්ලද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් තිහයි දශම අටයි බින්දුව (අක්:00, රූ:00, පර්: 30.80)ක් විශාල ඉඩමේ සියලු ගහ කොළ පළතුරු සමග බිමද එහි පිහිටි ගොඩනැගිලි ඇතුළු සියලු දේද වේ.

ඉහත කී ඕවිටිගමුවේ පිහිටි පාඩගලයා වත්ත සහ පාඩගලයාවත්තේ හේන නමැති ඉඩම සඳහා මාතර දිස්ත්‍රික් උසාවියේ පැවති පී 15321 දරන බෙදුම් නඩුවේ අවසාන තීන්දුව ප්‍රකාරව එකී නඩුවට ගොනුකර ඇති බලයලත් මිනින්දෝරු ඒ.ඩබ්.පී. ගුණතිලක මහතා විසින් මැන සම්පාදිත අංක 564ඒ සහ 2001.12.22 : දින දරන පිඹුර ප්‍රකාරව බෙද වෙන් කරන ලද කැබලි අංක 13 දරන උතුරට: මෙම ඉඩමේ මැන බෙද

වෙන් කළ අංක 10 දරන කැබැල්ලද, **නැගෙනහිරට**: මෙම ඉඩමේ මැන බෙද වෙන් කළ අංක 19 සහ අංක 14 දරන කැබැලිද, **දකුණට** : මෙම ඉඩමේ මැන බෙද වෙන් කළ අංක 14 දරන කැබැල්ලද. **බස්නාහිරට** : අ.ග.පි. 572 හි. 52 වැනි කැබැල්ලද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් හතයි දශම හතයි එක (අක්:00, රූ:00, පර් : 7.71)ක් විශාල ඉඩමේ සියලු ගහ කොළ පළතුරු සමග බිමද එහි පිහිටි ගොඩනැගිලි ඇතුළු සියලු දේද වේ.

තව ද ඉහත කී අංක 564 ඒ දරන පිඹුර ප්‍රකාරව බෙද වෙන් කළ අංක 19, 20, 21 කැබලි සියලුම කටයුතු සඳහා පාරක් ලෙස භාවිතා කිරීමේ මාර්ග පරවශ්‍යතා අයිතියද වේ.

**සමන්තිකා විතානගේ**
**දිසා අධිකරණය - මාතර.**

**වර්ෂ 2020 ක් වූ 08 මස 24 වන දින දීය.**

## පිස්කල් වෙන්දේසියේ විකිණීමේ දැන්වීමයි.

### මාතර දිසා අධිකරණයේදීය

1983 අංක 32 හා 1992 අංක 11 දරන පනත් වලින් සංශෝධිත 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 59 (01)(ආ)යටතේ පවරන ලද නඩුකරයයි

නඩු අංකය : MS 1227 (මාතර දිසා අධිකරණය)
ස්වභාවය : ලඝු
වටිනාකම : රු: 956790.00
ඇස්කිසි අංකය : 101/19

අනුරසිරි මුතුමාල, සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්, සමුපකාර සංවර්ධන කොමසාරිස් කාර්යාලය මාතර ,

**පැමිණිලිකරු**

**එදිරිව**

1. එදිරිසිංහ මුදිය ස්ලාගේ චින්තිකා චාන්දනී කුමාරි එදිරිසිංහ නව ලිපිනය – නිල් අහස, පරදූව, අකුරැස්ස, – නො: 18, වෙන්න වත්ත, වැල්ලම්පිටිය
2. හේවා කොට්ටගේ තුෂාර කුලසිරි – 198/2, කෝට්ටේ ගෙදර,තාවලගොඩ, මලිදූව, අකුරැස්ස
3. ඔලිගස්ස කෝරලගේ උදය බන්දු සිල්වා – නො: 145, මාතර පාර, අමලගොඩ, අකුරැස්ස

**විත්තිකරුවන්**

ඉහත අංක දරන නඩුවේ වර්ෂ 2019 ක් වූ මාර්තු මස විසි හත් වන නියෝගය අනුව පැමිණිලිකරු වෙත රුපියල් 956790.00 ක මුදල හා නඩු ගාස්තු ද අය කර ගැනීම පිණිස ඉහත නම් සඳහන් විත්තිකරුවන් විසින් ගෙවිය යුතු බවට නියෝග කොට තීන්දු ප්‍රකාශ කොට ඇත.

එකී තීන්දු ප්‍රකාශය අනුව 01 වන විත්තිකරු විසින් ඇපයට උකස් කරන ලද මාතර ප්‍රසිද්ධ නොතාරිස් ආරියසේන මහතා විසින් 2012.01.30 දින ලියා සහතික කළ අංක 6214 දරන ණය උකස්කරයට අදාළව අය විය යුතුව ඇති මුදල් 01 වන විත්තිකරු විසින් ගෙවීම් පැහැර හැර හෝ අපොහොසත් වී ඇති බැවින් ඉහත නම් සඳහන් විත්තිකරුවන්ට එරෙහිව නිකුත් කර ඇති ඇස්කිසිය ප්‍රකාරව 2019.03.27 ක්වූ දින මාතර දිසා අධිකරණයේ නියෝගය අනුව මාතර දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර් / නියෝජ්‍ය පිස්කල් විසින් තහනමට ගනු ලැබූ 01 වන විත්තිකරුගේ පහත උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළවල සියලුම අයිතිවාසිකම් හා හිමිකම් වර්ෂ 2020 ක්වූ 10 මස 13 වන දින ප.ව. 1.00 ට එම දේපල පිහිටි නිල් අහස, පරදූව, අකුරැස්ස යන ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්නට යෙදෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**ඉහත කී උපලේඛණය**

1. දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ වැලිගම් කෝරළ යේ අකුරැස්ස ප්‍රාදේශීය සභා සීමාවේ අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පරදූව දකුණ ග්‍රාම නිලධාරී වසමේ පරදූව ගමේ පිහිටි කාඩාව නැමැති ඉඩමේ බෙද වෙන් කළ අංක 08 දරන කැබැල්ල නැවත බෙද වෙන් කරන ලද අංක 02 දරන කැබැල්ලට මායිම් උතුරට : මෙම ඉඩමේ මැන බෙදූ අංක 1 දරන කැබැල්ලද , නැගෙනහිරට: මාතර සිට අකුරැස්ස දක්වා දිවෙන මහ පාර ද, දකුණට: මෙම ඉඩමේ මැන බෙදූ අංක 03 දරන කැබැල්ලද, බස්නාහිරට: මුල් ඉඩමේ අංක 09 දරන කැබැල්ලද මායිම් වූ මේ තුළ පර්චස් හයයි දශම බින්දුවයි හයයි පහ (අ: 0,රූ: 0, පර්:6.065) ක් විශාල ඉඩමේ සියලු ගසකොළ පලතුරු සමග බිම ද එහි පිහිටි ගොඩනැගිලි ඇතුළු සියලු දේද වේ.
2. දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ වැලිගම් කෝරළයේ අකුරැස්ස ප්‍රාදේශීය සභා සීමාවේ අකුරැස්ස. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පරදූව දකුණ ග්‍රාම නිලධාරී වසමේ පරදූව ගමේ පිහිටි කාඩාව නැමැති ඉඩමේ බෙද වෙන් කළ අංක 08 දරන කැබැල්ලට බලයලත් මිනින්දෝරු ඩී.යූ. අබේගුණවර්දණ මහතා විසින් මැන සකස් කළ අංක 2094 සහ 1999.104.11 දින දරන සැලැස්මේ ප්‍රකාර මැන බෙදූ අංක 03 දරන කැබැලට මායිම් උතුරට: මෙම ඉඩමේ මැන බෙදූ අංක 2 දරන කැබැල්ලද, නැගෙනහිරට: මාතර සිට අකුරැස්ස දක්වා දිවෙන මහ පාර ද, දකුණට: මෙම ඉඩමේ මැන බෙදූ අංක 04 දරන කැබැල්ලද, බස්නාහිරට : මුල් ඉඩමේ අංක 09 දරන කැබැල්ලද මායිම් වූ මේ තුළ පර්චස් හයයි දශම බින්දුවයි හයයි පහ (අ.0, රූ. 0, පර්. 6.065) ක් විශාල ඉඩමේ සියලු ගසකොළ පලතුරු සමග බිම ද එහි පිහිටි ගොඩනැගිලි ඇතුළු සියලු දේද වේ.

**සමන්තිකා විතානගේ**
**රෙජිස්ට්‍රාර්**
**දිසා අධිකරණය - මාතර.**

**වර්ෂ 2020 ක් වූ 08 මස 24 වන දින දීය.**

## වැවිලි කර්මාන්ත හා අපනයන කෘෂිකර්ම අමාත්‍යාංශය

## හලාවත වැවිලි සමාගම

### වියළි කජු ඇට සහ පොල්ලෙලි අලෙවි කිරීම සඳහා මිල ගණන් කැඳවීම

| වත්ත | අලෙවි කරන | | ප්‍රසම්පාදනය විවෘත කරන | | |
|---|---|---|---|---|---|
| | ද්‍රව්‍ය | ප්‍රමාණය | දිනය | වේලාව | ස්ථානය |
| මාදම්පේ | පොල් ලෙලි | 125,230 | 2020-09-09 | පෙ.ව. 10.30 | මාදම්පේ වතු කොට්ඨාසය, ගල්මුරුව. |
| තම්බපණ්ණි | වියළි කජු ඇට (කිලෝ ග්‍රෑම්) | 12,000 | 2020-09-08 | පෙ.ව. 10.30 | හලාවත වැවිලි සමාගම, අංක 165, පුත්තලම් පාර, හලාවත. |
| මංගලඑළිය | | 10,000 | | | |
| පලුගස්වැව | පොල් ලෙලි | 213,627 | 2020-09-14 | පෙ.ව. 10.30 | හලාවත වැවිලි සමාගම, අංක 165, පුත්තලම් පාර, හලාවත. |

01. අදාළ ප්‍රසම්පාදනපත් රුපියල් 500/– ක ගාස්තුවක් ගෙවා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා සහ ප්‍රසම්පාදනපත් විවෘත කරන දිනයේ පෙ.ව. 10.15 දක්වා ඉහත සඳහන් ස්ථානවලින් ලබා ගත හැක.

02. වැඩි විස්තර සඳහා දුරකථන අංක 032-5768398 මංගලඑළිය, 032-5741263 තම්බපණ්ණි, 032-5741266 මාදම්පේ සහ 032-5678050 පලුගස්වැව යන වතු අධිකාරීවරුන් අමතන්න.

**සභාපති - ප්‍රසම්පාදන කමිටුව, හලාවත වැවිලි සමාගම, 165, පුත්තලම් පාර, හලාවත.**

# ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

## ප්‍රසම්පාදන දැන්වීම

පහත සඳහන් ප්‍රසම්පාදනය සඳහා ලංසු කැඳවීමේ දැන්වීම 2020 සැප්තැම්බර් මස 03 සහ 05 දෙදින "ඩේලි නිවුස්" (Daily News) පුවත්පතේ පළ කර ඇත.

**SUPPLY, INSTALLATION, COMMISSIONING AND MAINTENANCE OF CCTV CAMERA SYSTEM TO COVER THE AREA OF ADMIN BUILDING AND MAIN ENTRANCE BUILDING AT SEETHAWAKA EXPORT PROCESSING ZONE**

**CONTRACT NO. BOI/SEPZ/ES/2020/23.09.041**

ඉහත ප්‍රසම්පාදනය සඳහා අදාළ ටෙන්ඩර්පත් ඉංග්‍රීසි භාෂාවෙන් පිළියෙල කර ඇති අතර, ලංසු ඉදිරිපත් කිරීමට උනන්දුවක් දක්වන කොන්ත්‍රාත්කරුවන්හට 2020 සැප්තැම්බර් මස 03 සහ 05 දෙදින "ඩේලි නිවුස්" පුවත්පතේ අදාළ දැන්වීමට අනුව කටයුතු කරන ලෙස මෙයින් දැනුම් දෙමු.

**සභාපති,**
**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය**

## භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
## මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

## කුලියට හෝ බද්දට කාර්යාලය සඳහා ඉඩ පහසුකම් ලබා ගැනීම මාතර ප්‍රාදේශීය කාර්යාලය

මෙම කාර්යාංශයේ මාතර ප්‍රාදේශීය කාර්යාලය පවත්වාගෙන යාම සඳහා ගොඩනැගිල්ලක් කුලියට හෝ බද්දට ලබා ගැනීමට අවශ්‍ය වී ඇත. එම ගොඩනැගිල්ල පහත අවශ්‍යතාවයන් සපුරා තිබිය යුතුය.

- ➢ අදාළ පළාත් පාලන ආයතනයෙන් නිසි අනුමැතිය ලබාගත් ගොඩනැගිල්ලක් විය යුතුයි.
- ➢ ගොඩනැගිල්ලේ විශාලත්වය වර්ග අඩි ප්‍රමාණය 2500ට වඩා වැඩි විය යුතුයි.
- ➢ කාමර සංඛ්‍යාව අවම වශයෙන් 04 ක් විය යුතුයි.
- ➢ අභ්‍යන්තර වැසිකිළි 02 සහ අවම වශයෙන් පිටත වැසිකිළි 01 ක් පැවතිය යුතුයි.
- ➢ නළ ජල පහසුකම් හා විදුලිය පැවතිය යුතුයි.
- ➢ මාතර නගර සීමාවේ සිට පොදු ප්‍රවාහන සේවා ක්‍රියාත්මක වන ප්‍රධාන මාර්ගයකට මුහුණලා කිලෝමීටර් 02 ක් (දෙකක්) සීමාවේ පැවතිය යුතුය.
- ➢ ගේට්ටුවක් සහිතව ආරක්ෂිත වැට හෝ තාප්පය පැවතිය යුතුයි.
- ➢ අවම වශයෙන් වාහන 03 ක් හෝ නවතා තැබීමට ඉඩ පහසුකම් පැවතිය යුතුයි.
- ➢ කාර්යාලය වෙනුවෙන් වෙන් කරනු ලබන බිම් කොටස සම්පූර්ණයෙන්ම කාර්යාංශය වෙනුවෙන් වෙන් කළ යුතු අතර, වෙනත් අවශ්‍යතාවයක් වෙනුවෙන් ලබා ගත නොහැක.

**"මාතර ප්‍රාදේශීය කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් කුලියට හෝ බද්දට ගැනීම සඳහා මිල ගණන්"** යන්න කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි සඳහන් කොට, අදාළ ස්ථානයෙහි ඔප්පු පිටපත සහ පිඹුරු පිටපතක් ද, ගොඩනැගිලි හිමිකරුවා සම්බන්ධ කර ගත හැකි දුරකථන අංක ද සහිතව **2020.09.18 දින ප.ව.2.00** ට හෝ ඊට පෙර සිය මිල ගණන් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ ප්‍රධාන කාර්යාලයේ පරිපාලන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කළ යුතුය. මෙම ටෙන්ඩරය විවෘත කරන අවස්ථාවට ටෙන්ඩර්කරුට ඔහුගේ බලයලත් නියෝජිතවරයෙකුට සහභාගි විය හැක.

**සැලකිය යුතුයි**


1. අයදුම්පත් අතරින් තෝරාගනු ලබන ගොඩනැගිල්ල කාර්යාංශය සඳහා බදු හෝ කුලී පදනම මත ලබාදෙන විට එම ගොඩනැගිල්ල ගිනි / සොර සතුරු හා ආපද සඳහා රක්ෂණය කිරීම අයිතිකරුගේ වගකීම වේ.
2. ගොඩනැගිලි හිමිකරුවන් විසින් ඉදිරිපත් කරන මිල ගණන් නැවත රජයේ තක්සේරුවට ඉදිරිපත් කරනු ලැබේ.

**සභාපති,**
**ප්‍රසම්පාදන කමිටුව,**
**භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය,**
**අංක 569, එපිටමුල්ල පාර,**
**පිටකෝට්ටේ.**

රජයේ ගැසට් පත්‍රය
සැප්තැම්බර් 06 වනදා සිට
සිළුමිණ The Silumina
පුවත්පත සමඟ
නොමිලේ

ගම්පහ කුමාරතුංග මාවතේ අංක 98/1A, දරන නිවසේ පදිංචි මාතරච්චාරි තැකතිගේ කිත්සිරි තිලරත්න වන මා මාතර ආරච්චි කිත්සිරි තිලරත්න යනුවෙන් පෙනී සිටින බව මහජනතාවට දන්වා සිටිමි.

අනාගත සිහින සැබෑකර ගැනීමේ එකම මග
සිළුමිණ The Silumina
මංගල යෝජනා තීරයයි



21 වැනි සියවසට එළඹෙන යෞවනයට නිරවුල් ගමන් මග
බුදුසරණ

# ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

## භාවිතයෙන් ඉවත් කරන ලද වාහන විකිණීම සඳහා ලංසු කැඳවීම

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් පාවිච්චියෙන් ඉවත් කරන ලද පහත සඳහන් වාහන මිලදීගෙන ඉවත් කරගෙන යාම සඳහා මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

| ලොට් අංකය | විස්තරය | ඩීසල් / පෙට්‍රල් | ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තු රු. | ආපසු ගෙවනු ලබන තැන්පතු මුදල රු. |
|---|---|---|---|---|
| 01 | වාහන අංකය GE - 8942 මිට්සුබිෂි ඩබල් කැබ් - 2000 | ඩීසල් | 1000/- | 10,000/- |
| 02 | වාහන අංකය 61 - 6620 ටොයොටා ජීප් රථය - 1993 | ඩීසල් | 1000/- | 10,000/- |
| 03 | වාහන අංකය PB - 8059 මයික්‍රෝ ජීප් රථය - 2009 | ඩීසල් | 1000/- | 10,000/- |

01. එක් අයෙකුට ලොට් අංක තුනටම ලංසු ඉදිරිපත් කළ හැකි අතර, ඉහත වගුවේ සඳහන් පරිදි ආපසු නොගෙවන මුදලක් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ සරප් වෙත මුදලින් ගෙවා ලංසු ලියවිලි 2020.09.07 දින සිට 2020.09.11 දින දක්වා රාජකාරී දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාලය තුළ ලබාගත හැකිය. ධීවර හා ජලජ සම්පත් සංවර්ධන දෙපාර්තමේන්තු පරිශ්‍රයේ තබා ඇති ඉහත සඳහන් වාහන 2020.09.07 දින සිට 2020.09.11 දින දක්වා රාජකාරී දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාලය තුළ පරීක්ෂා කර බැලිය හැක.
02. ඉහත වගුවේ සඳහන් පරිදි ආපසු ගෙවන මුදල් තැන්පතුවක් මෙම දෙපාර්තමේන්තුවේ සරප් වෙත මුදලින් ගෙවා ලදුපතේ පිටපතක් ලංසු සමග ඉදිරිපත් කළ යුතුය.
03. ලංසු භාරගැනීම 2020.09.15 දින පෙ.ව. 10.00 ට අවසන් වේ. නියමිත වේලාවට පෙර ඔබගේ මිල ගණන් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ 3 වන මහලේ ගණකාධිකාරී (සැපයීම්) කාමරයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. ලංසු ඉදිරිපත් කරන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ වාහන අංකය සඳහන් කරන්න.

**මිල ගණන් ඉදිරිපත් කළ යුතු ලිපිනය :** **අධ්‍යක්ෂ ජනරාල්,**
**03 වන මහළ,**
**ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව,**
**මාළිගාවත්ත, කොළඹ 10.**

2020.09.15 දින පෙ.ව. 10.00 ට මිල ගණන් විවෘත කරන අතර, එම අවස්ථාවට ලංසුකරුවන් හට හෝ බලයලත් තැනැත්තෙකුට සහභාගී විය හැක. වාහන මිලදී ගැනීමට සුදුසුකම් ලබන ලංසුකරුවන් එදිනම ප්‍රකාශයට පත්කරන අතර, ඔවුන් වාහනයේ ලංසු වටිනාකමින් 25% ක් එදිනම දෙපාර්තමේන්තුවේ සරප් වෙත මුදලින් ගෙවිය යුතු වන අතර, ඉතිරි මුදල දින 07 ක් තුළ දෙපාර්තමේන්තුව වෙත මුදලින් ගෙවා වාහනය ඉවත් කර ගත යුතුය.

මේ සම්බන්ධයෙන් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ.

මේ පිළිබඳ වැඩි විස්තර සඳහා මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී - **දුරකථන අංකය : 0112438291** ඇමතිය හැක.

**ගිනිගේ ප්‍රසන්න ජනක කුමාර,**
**අධ්‍යක්ෂ ජනරාල්.**

# ටෙන්ඩර් දැන්වීමයි

## වවුනියා උතුර ප්‍රාදේශීය සභාව, නෙඩුංකේර්නි

## මාර්ග කර්මාන්ත සඳහා ගල් විකිණීම සඳහා ටෙන්ඩර් කැඳවීමයි

01. නෙඩුංකේර්නි, වවුනියා උතුර ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් වෙතින් පහත දක්වා ඇති උපලේඛනයේ විස්තර කොට ඇති නයිනාමඩුව, කුරුප්පුකුත්ති මාර්ගයේ ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගවල කර්මාන්ත සඳහා ඇති ගල් විකිණීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් කැඳවනු ලැබේ.
02. ජාතික තරගකාරී ලංසුකරණ පරිපාටිය මගින් ලංසු මෙහෙයවනු ලැබේ.
03. ටෙන්ඩර් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට, සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවූ අයෙකු විය යුතුය.
04. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් වැඩිදුර තොරතුරු නෙඩුංකේර්නි වවුනියා උතුර ප්‍රාදේශීය සභාවේ සභාපති වෙතින් (දුරකථනය : 024-2053014. විද්‍යුත් තැපැල : vnpsnk@gmail.com) ලබාගත හැකිය.
05. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් සම්පූර්ණ ටෙන්ඩර් ලිපිලේඛන කට්ටලයක් **"සභාපති, වවුනියා උතුර ප්‍රාදේශීය සභාව, නෙඩුංකේර්නි"** යන ලිපිනයට ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් 2020-09-07 වෙනි දිනයේ සිට 2020-09-21 වෙනි දින දක්වා පෙ.ව .9.00 හා ප.ව. 2.00 අතර, පහත සඳහන් එක් අමුද්‍රව්‍යයක් ලබා ගැනීම සඳහා රු. 1,000.00 ක් හා සියලු අමුද්‍රව්‍යයන් ලබා ගැනීම සඳහා රු. 2,000.00 ක (බදු රහිතව) ආපසු ගෙවනු නොලබන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව ලබාගත හැකිය. ගෙවීම් මුදලින් සිදු කළ යුතුය.
06. පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් 2020-09-21 වෙනි දින ප.ව .2.30 ට පෙර ලැබෙන පරිදි **"සභාපති, වවුනියා උතුර ප්‍රාදේශීය සභාව, නෙඩුංකේර්නි"** යන ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් එවීමට හෝ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට හැකිය. ප්‍රමාද වී ලැබෙන ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ටෙන්ඩර් භාර ගැනීමේ වේලාව අවසන් වූ වහාම එම අවස්ථාවට පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් හෝ ලිඛිතව බලය පවරන ලද ටෙන්ඩර්කරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.
07. තෝරාගනු ලබන ටෙන්ඩර්කරු පළමු දිනයේ සිට දින 30 ක් (මාසයක්) ඇතුළත සියලු භාණ්ඩ තමන්ගේ වාහනයේ පටවාගෙන යා යුතුයි. තවද ගිවිසුම් මුදලින් 50% අත්තිකාරම් මුදලක් (මුදලින්) ලෙස පළමු දිනයේ සිට දින හතක් (07) ඇතුළත ගෙවිය යුතුය. ඉතිරි මුදලින් 35% ක් ඉතිරි දින හත (07) ඇතුළත ගෙවිය යුතුය. ඉතිරි 15% ක මුදල මුළු ප්‍රමානය ගණනය කිරීමෙන් පසු දින හතක් (07) ඇතුළත ගෙවිය යුතුය.
08. අමුද්‍රව්‍යවල මුළු ප්‍රමාණය තක්සේරු කොට ඇතත් පවතින ස්වභාවයෙන් භාණ්ඩ පටවන විටදී ප්‍රාදේශීය සභාවේ කාර්මික නිලධාරීන් සහ උ/ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ කාර්මික නිලධාරීන් පෙ.ව 9.00 සිට ප.ව. 4.00 දක්වා එම පරිශ්‍රයේ සිටිමින් භාණ්ඩවල මුළු ප්‍රමාණය තක්සේරු කරනු ඇත.
09. ටෙන්ඩර් සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් වෙනස් කිරීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට ප්‍රාදේශීය සභාවට සම්පූර්ණ බලය ඇත.
10. ටෙන්ඩරය, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේ අවසාන දිනයේ සිට දින 43 ක් (හතලිත් තුනක්) එනම් 2020-11-03 වෙනි දින දක්වා වලංගු විය යුතුය.
11. ටෙන්ඩර් ඇපකරය පහත උපලේඛනයේ සඳහන් පරිදි වේ.
12. වැඩිදුර විස්තර අවශ්‍යවේ නම්, කාර්යාලයෙන් ලබා ගත හැක.

| ටෙන්ඩර් අංකය | ටෙන්ඩරයේ විස්තර | ප්‍රමාණය | කොන්ත්‍රාත් වටිනාකම | කොන්ත්‍රාත් කාලය | අවශ්‍ය ටෙන්ඩර් ඇපකරය | |
|---|---|---|---|---|---|---|
| | | | | | ඇපකරයේ වටිනාකම | වලංගු කාලය |
| 1. COUNCIL/ MATERIALS/ VNPS/2020/01 | 2" කළු ගල් අමුද්‍රව්‍ය විකිණීම | වර්ග මීටර් 613.42 | මිලියන 1.47 ක් | මාසයක් | 15,000.00 | 2020-12-01 |
| 2. COUNCIL/ MATERIALS/ VNPS/2020/02 | 4" කළු ගල් අමුද්‍රව්‍ය විකිණීම | වර්ග මීටර් 1014 | මිලියන 1.54 ක් | | 15,500.00 | |

13. පූර්ව ලංසු රැස්වීමක් 2020-09-14 වෙනි දින 14.30 පැයේදී වවුනියා උතුර ප්‍රාදේශීය සභා කාර්යාලයේදී පැවැත්වේ.

තවද, එකී දිනයේ පෙ.ව 9.00 සිට ප.ව 1.30 දක්වා වැඩ බිම් පරීක්ෂාව පැවැත්වේ. උනන්දුවක් දක්වන ලංසුකරුවන් තම වියදමින් සහභාගි විය හැකිය.

**සභාපති,**
**ප්‍රසම්පාදන කමිටුව,**
**වවුනියා උතුර ප්‍රාදේශීය සභාව, නෙඩුංකේර්නි.**
2020-09-04



# ක්‍රීඩා ඇමැති උපදෙසින් අමාත්‍යාංශ ලොක්කෝ පස් අවුරුදු සැලැස්මක් හදන්න අද මීගමුවට රැස් වෙති

**ප්‍රින්ස් ගුණසේකර**

ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ඇති සියලු ආයතන හා දෙපාර්තමේන්තු එක්ව ක්‍රීඩාවේ දියුණුව උදෙසා පස් අවුරුදු සැලස්මක් සකසා ඉක්මනින් තමන් වෙත ලබා දෙන ලෙස ක්‍රීඩා ඇමැති නාමල් රාජපක්ෂ මහතා උපදෙස් දෙයි.

ඒ අනුව අද පෙරවරුවේ මීගමුව ඇවන් ඩ්‍රයිව් හෝටලයේදී මේ සම්බන්ධ මූලික සාකච්ඡාවක් පැවැත්වීමට ආයතන හා දෙපාර්තමේන්තු ප්‍රධානීහු හා අදාළ නිලධාරීහු රැස් වෙති.

මෙහිදී සකස් කිරීමට යෝජිත පස් අවුරුදු සැලස්මේ ව්‍යුහය පිළිබඳ සාකච්ඡා කෙරෙන අතර, මූලික කෙටුම්පතක් ද සකස් කිරීමට බලාපොරොත්තු වේ. එමෙන්ම මේ සම්බන්ධ ආයතන හා දෙපාර්තමේන්තු මට්ටමින් පුළුල් දැනුමක් ලබාදීමට ද අදහස් කෙරෙන බව නියෝජ්‍ය ක්‍රීඩා අධ්‍යක්ෂ ජෙනරාල් නීතිඥ අමල් එදිරිසූරිය මහතා පැවැසීය. මෙය ක්‍රීඩා අමාත්‍යාංශයේ අනුදැනුම මත සංවිධාන වන කටයුත්තක් බැවින් ඉදිරියේ දී වැඩිදුර තොරතුරු ඉදිරිපත් කළ හැකි බව ද ඒ මහතා පැවැසීය.

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව, ජාතික ක්‍රීඩා විද්‍යායතනය, ක්‍රීඩා වෛද්‍ය ආයතනය, සුගතදාස ක්‍රීඩා අධිකාරිය, ජාතික තහනම් උත්තේජක මර්දන නියෝජිතායතනය හා ජාතික ක්‍රීඩා කෞතුකාගාරය වැනි ආයතන හා දෙපාර්තමේන්තුවල ප්‍රධානීහු අද පැවැත්වෙන සාකච්ඡාවට සහභාගී වෙති.

නිදහසින් පසු දශක ගණනාවක් තිස්සේ මෙරට ක්‍රීඩාව දියුණු කිරීම සඳහා නිශ්චිත ජාතික සැලැස්මක් ක්‍රියාත්මක නොවීමේ අඩුපාඩුව මග හරවමින් ක්‍රීඩාවේ දියුණු කළ යුතු සෑම ක්ෂේත්‍රයක්ම අධ්‍යයනය කර කෙටිකාලීන, මධ්‍යකාලීන හා දිගුකාලීන වැඩපිළිවෙළක් යටතේ මේ පස් අවුරුදු සැලස්ම සකස් වනු ඇත.

පසුගිය කාලවලදී ක්‍රීඩා අමාත්‍යාංශය මඟින් ආරම්භ කර ඇති ජාතික වැඩසටහන් වන ක්‍රීඩා ශක්ති වැඩ සටහන, පුහුණුකරුවන් ලියාපදිංචි කිරීම, ජාතික ක්‍රීඩා සංගම් කටයුතු විධිමත් කිරීම, ජාතික සංචිත පවත්වා ගෙන යෑම, විදේශ පුහුණුකරුවන් ගෙන්වා ගැනීම, ක්‍රීඩාව ගමට ගෙන යෑම, ක්‍රීඩා සංස්කෘතියක් හා ක්‍රීඩා ආර්ථිකයක් බිහි කිරීම යන ඉලක්කයන් සමාලෝචනය කොට නව දැක්මක් ඉදිරිපත් කිරීම ද සිදු වනු ඇතැයි පැවැසේ.

පාසල් ක්‍රීඩාවේ සිට ජාතික ක්‍රීඩාව දක්වා ක්‍රීඩාව විධිමත්ව පවත්වාගෙන යෑමේ මූලික වැඩ සටහනක් කෙරෙහි අවධානය යොමු කරමින් සෑම පාසල් දරුවෙක්ම ක්‍රීඩකයෙක් බවට පත් කිරීම හා දකුණු ආසියාතික, ආසියාතික, පොදු රාජ්‍ය මණ්ඩලයීය හා ඔලිම්පික් ක්‍රීඩා ඉලක්ක කර ගෙන ක්‍රීඩා ඉසවු දියුණු කිරීම සඳහා උපරිම සම්පත් දීමට කටයුතු කළ යුත්තේ කෙසේ ද යන්න මේ ඉදිරි සැලස්මේ අනිවාර්ය සඳහනක් වනු ඇතැයි බලාපොරොත්තු වේ.



# බීපීඑල් කාන්තා තරගාවලිය ඔක්. 25 සිට

ඔස්ට්‍රේලියාවේ පැවැත්වෙන බිග්බෑෂ් ලීග් විස්සයි20 කාන්තා තරගාවලිය ලබන ඔක්තෝබර් මස 25 වැනිදා ආරම්භ කිරීමට සැලසුම් කෙරේ.

කොරෝනා දෙවැනි රැල්ල හේතුවෙන් ඔස්ට්‍රේලියාව තුළ පනවා ඇති සංචාරක සීමා කිරීම් නිසා මෙවර තරගාවලිය සිඩ්නි නගරය පමණක් කේන්ද්‍ර කර ගනිමින් පැවැත්වීමට ඔස්ට්‍රේලියානු ක්‍රිකට් ආයතනය බලාපොරොත්තු වෙයි.

ඒ අනුව කණ්ඩායම් 8ක් එක් වන තරගාවලියට ඇතුළත් තරග 59 උතුරු සිඩ්නි ඕවල්, හර්ස්ට්විල් ඕවල් සහ බ්ලැක්ටවුන් ජාත්‍යන්තර ක්‍රීඩා උද්‍යානය යන ක්‍රීඩාංගණවලදී පැවැත්වෙනු ඇත.

බිග් බෑෂ් ලීග් ප්‍රධානී ඇලිස්ටෙයාර් ඩොබ්සන් පවසන්නේ විදේශීය ක්‍රීඩිකාවන්ට මේ තරගාවලියට සහභාගී වීමට අවස්ථාව ලබාදී ඇති බවයි. සිඩ්නි නුවරදී මේ තරගාවලිය පැවැත්වීමට එක්ව කටයුතු කිරීමට කැමැත්ත පළ කිරීම සම්බන්ධයෙන් නිව් සවුත් වේල්ස් රජයට ස්තුතිය පිරිනමන බව ද ඔහු පවසයි.

මෙවර තරගාවලිය පැවැත්වෙන්නේ 6 වැනි වරටය. පසුගිය වසරේ පැවැති තරගාවලියේදී බ්‍රිස්බේන් හීට් කණ්ඩායම පිට පිට දෙවැනි වරටත් ශූරතාව දිනාගත් අතර, සිඩ්නි සික්සර්ස් පිල ද දෙවරක් ශූරතාව දිනා ගෙන තිබේ.

# සභාපති කුසලාන තරගාවලිය මෙරටදී මා දුටු හොඳම පාපන්දු තරගාවලියයි

## මූල්‍ය කමිටු සභාපති පුවනේන්ද්‍රන්

ප්‍රින්ස් ගුණසේකර



වැන්ටේජ් සභාපති කුසලාන තරගාවලිය තම පාපන්දු ජීවිතයේ මෙරටදී දුටු හොඳම පාපන්දු තරගාවලිය බව ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ මූල්‍ය කමිටු සභාපති හා සිටි ලීග් පාපන්දු සභාපති ආර්. පුවනේන්ද්‍රන් මහතා පවසයි.

කොරෝනා වයිරස ව්‍යාප්තිය හේතුවෙන් ඇනහිටි ක්‍රීඩාව යළිත් නඟාසිටුවීමේ අරමුණින් ප්‍රබලතම කණ්ඩායම් 20ක් අතර, පැවැති මේ ආරාධිත පාපන්දු තරගාවලිය වෙනුවෙන් ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය රුපියල් මිලියන 30ක් වැය කළ අතර, මෑත කාලයේ ක්‍රීඩාව වෙනුවෙන් සිදු වූ යහපත් ආයෝජනයක් බව මූල්‍ය කමිටු සභාපතිවරයා පැවැසීය. ශ්‍රී ලංකා පාපන්දු පිලේ ප්‍රධාන පුහුණුකරු හා තාක්ෂණික අධ්‍යක්ෂ අමීර් ඇලජික් මහතා මුලුමනින්ම මේ තරගාවලිය නිරීක්ෂණය කොට නව සංචිතයක් නිර්මාණය කිරීමට කටයුතු යෙදීම ඉදිරි පාපන්දු ක්‍රීඩාවේ සුබ පෙර නිමිත්තක් වනු ඇතැයි පුවනේන්ද්‍රන් මහතා පැවැසීය.

මාසයක් තුළ තරග 40ක් පවත්වා අවසන් කිරීමට කටයුතු සංවිධාන කිරීමට ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ සභාපතිවරයා හා ලේකම්වරයා ඇතුළු පරිපාලනය ගත් මෙහෙවර ප්‍රශංසනීය එකක් බවද ඒ මහතා පැවැසීය.

"ඉතාම සාර්ථක තරගාවලියක්. සියලුම ක්‍රීඩා සමාජවලට මුදල් හා අනෙකුත් පහසුකම් දීමෙන් ඔවුන් හොඳ ධෛර්යයකින් තරගාවලියට මුහුණ දුන්නා. මා නියෝජනය කරන සිටි පාපන්දු ලීගයේ කොළඹ පාපන්දු සමාජය ශූරතාව දිනා ගැනීමත් අවසන් වටයට ජාවාලේන් පිල පැමිණීමත් සතුටට කරුණක්. සෑම වසරකම මෙවැනි තරගාවලි පැවැත්වීම ශ්‍රී ලංකා පාපන්දු ක්‍රීඩාව දියුණු කිරීමට හේතුවක් වෙනවා. අප නිතරම ක්‍රීඩා සමාජ ධෛර්යයමත් කළ යුතුයි" පුවනේන්ද්‍රන් මහතා සඳහන් කළේය.

මේ සියලු තරග කොළඹ සුගතදාස හා රේස් මාවත තුරඟ තරග ක්‍රීඩාංගණවලදී පමණක් පැවැත්වීමට කටයුතු යොදා තිබීමෙන් තරගවල ප්‍රමිතියද උසස් මට්ටමකින් පවත්වා ගැනීමට හැකියාව ලැබී තිබුණි. පසුගිය වසරේ සිදු වූ පාස්කු ඉරිදා ප්‍රහාරයත්, ඒ සමගම පැවැති අයහපත් කාලගුණික තත්ත්වයත් අනතුරුව හදිසියේම පැමිණි කොරෝනා වසංගතය ඇතුළු විවිධ බාධක හේතුවෙන් ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයට ඔවුන්ගේ දින දර්ශනය නියම ලෙස පැවැත්වීමට අසීරු විය. කොරෝනා වසංගතයත් සමඟ ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයට ලෝක සම්මේලනයෙන් ලබා දුන් ආධාර මේ තරගාවලිය පැවැත්වීමට විශාල රුකුලක් විය.

# ගාල්ල ග්ලැඩියේටර්ස් ප්‍රධාන ක්‍රීඩකයා අෆ්රිඩි

එළැඹෙන නොවැම්බර් මස 14 වැනිදා ආරම්භ වීමට නියමිත ලංකා ප්‍රිමියර් ලීග් විස්සයි20 ක්‍රිකට් තරගාවලියට එක් වන ගාල්ල ග්ලැඩියේටර්ස් කණ්ඩායම නිල වශයෙන් එළි දැක්වීම පසුගියදා පාකිස්තානයේදී සිදු කෙරිණි.

පාකිස්තාන සමාගමක් විසින් මේ කණ්ඩායම මිලදී ගෙන ඇති අතර, එහි හිමිකරු වන්නේ නදීම් ඕමාර් ය. ඔහු පාකිස්තාන සුපර් ලීග් තරගාවලියට ක්‍රීඩා කරන ක්වේටා ග්ලැඩියේටර්ස් කණ්ඩායමේ හිමිකරු ද වෙයි.

පාකිස්තානයේ හිටපු තුන් ඉරියව් ක්‍රීඩක ශහීඩ් අෆ්රිඩි මේ කණ්ඩායමේ ප්‍රධාන ක්‍රීඩකයා ලෙස (icon player) නම් කර ඇති අතර, කණ්ඩායමේ පුහුණුකරු තනතුරට මොයීන් ඛාන් පත් කර තිබේ. පාකිස්තාන කණ්ඩායමේ හිටපු නායක සර්ෆ්‍රාස් අහමඩ් ද මේ කණ්ඩායමට එක්වීමට නියමිත බව වාර්තා වෙයි.

කෙසේ වෙතත් මේ තරගාවලියේ මුල් තරග සඳහා පාකිස්තාන ක්‍රීඩකයන්ගේ සහභාගිත්වය අවිනිශ්චිත බව ද පාකිස්තාන මාධ්‍ය වාර්තා කරයි.

ඒ, කොරෝනා වසංගතයට පෙර පැවැති පාකිස්තාන සුපර් ලීග් තරගාවලියේ ඉතිරි තරග 5 නොවැම්බර් 14 වැනිද සිට 17 වැනිද දක්වා ලාහෝර්හිදී පැවැත්වීමට කටයුතු යොද තිබෙන බැවිනි. ලංකා ප්‍රිමියර් ලීග් තරගාවලිය ක්‍රියාත්මක වන්නේ නොවැම්බර් 14 වැනිද සිට දෙසැම්බර් මස 6 වැනිද දක්වාය. මීට අමතරව නොවැම්බර් 18 වැනිද සිට අබුඩාබි ටී10 තරගාවලිය පැවැත්වෙන අතර, ඊට ලාහෝර් ක්ලන්දර්ස් ලීගයේ කණ්ඩායමක් ද එක් වීමට නියමිතය.

# ගයානා දිනයි

කැරිබියන් ප්‍රිමියර් ලීග් ක්‍රිකට් තරගාවලියේ බාබඩෝස් ට්‍රයිඩන්ට්ස් පිල සමඟ පැවැති 26 වැනි තරගයෙන් කඩුලු 6ක පහසු ජයක් අත් කර ගැනීමට ගයානා ඇමසන් වොරියර්ස් කණ්ඩායම සමත් විය.

ට්‍රිනිඩෑඩ්හිදී පැවැති තරගයේ පළමුව පන්දුවට පහර දුන් බාබඩෝස් පිල ලකුණු 89කට සීමා කළ ගයානා ක්‍රීඩකයෝ ඕවර 14.2කදී ජයග්‍රාහී ඉලක්කය පසු කළේ කඩුලු 4ක් පමණක් අහිමි කර ගනිමිනි.

සිම්රන් හෙට්මයර් නොදැවී ලකුණු 32ක් සහ චන්ද්‍රපෝල් හේම්රාජ් ලකුණු 29ක් රැස් කරමින් ගයානා පිල ජයග්‍රහණය කරා ගෙන ගියහ. සිම්රන් පන්දු 33කදී හතරේ පහර 2ක් එල්ල කළ අතර, පන්දු 22කට මුහුණ දුන් හේම්රාජ් හතරේ පහර 3ක් සහ හයේ පහර 2ක් ඉනිමට එක් කර ගත්තේය.



# චෙස් සම්මේලන සභාපති ලක්ෂ්මන් විජේසූරිය

ශ්‍රී ලංකා චෙස් සම්මේලනයේ නව සභාපතිවරයා ලෙස ලක්ෂ්මන් විජේසූරිය මහතා ඒකමතිකව තේරී පත් විය.

චෙස් සම්මේලන මූලස්ථානයේදී පසුගියද පැවැති වාර්ෂික මහා සභා රැස්වීම සහ නිලවරණයේදී මේ පත්වීම සිදු කෙරිණි. නිලවරණ කමිටුවේ සභාපති උපාලි ගුණසේකර මහතා සමග එහි සාමාජික අරුණ ද සිල්වා සහ නදීකා පෙරේරා මහත්ම මහත්මීන්ගේ මූලිකත්වයෙන් නිලවරණය පැවැති අතර, ශ්‍රී ලංකා යුද හමුදාවේ මලිත් අකලංක මහතා ලේකම් තනතුරටත්, හිටපු ජාතික ක්‍රීඩක දීප්ති හේවාගීගන මහතා නියෝජ්‍ය සභාපති ධූරයටත් තේරී පත් වූහ. විධායක කමිටුවේ තනතුරු 19ක් සඳහා එක් පුද්ගලයකු බැගින් පත් කරනු ලැබූ අතර, සෑම තනතුරකටම අමතර නාම යෝජනා නොතිබීම විශේෂත්වයකි.

සභාපති ධූරයට පත් වූ ලක්ෂ්මන් විජේසූරිය මහතා වසර 1996 සහ 2000 දී ජාතික චෙස් ශූරයා ද වේ. හෙතෙම 1983 සිට 2008 දක්වා වසර 25 ක් ජාතික මට්ටමෙන් ශ්‍රී ලංකාව නියෝජනය කර ඇති අතර, 1995 වසරේ සිංගප්පූරුවේ පැවැති ආසියානු කණ්ඩායම් ශූරතාවලියේදී රන් පදක්කමක් දිනා ගත්තේය. ජාත්‍යන්තර චෙස් තරග විනිසුරුවරයකු ද වන ඔහු, ලෝක චෙස් ඔලිම්පියාඩ්, කාන්තා චෙස් ලෝක කුසලානය සහ ලෝක චෙස් කාන්තා පිරිමි ගෝන් ප්‍රී වැනි බොහෝ ලෝක චෙස් සම්මේලන ඉසව්වල තරග විනිසුරුවයකු ලෙස කටයුතු කර ඇත.

ක්‍රීඩාවෙන් විශ්‍රාම යෑමෙන් පසු චෙස් ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් විශාල කාර්යභාරයක් ඉටු කළ විජේසූරිය මහතා, දකුණු ආසියානු චෙස් කවුන්සිලයේ සහ පොදු රාජ්‍ය මණ්ඩලයීය චෙස් සංගමයේ ප්‍රධාන ලේකම් ලෙස ද කටයුතු කරයි. ඔහු ආසියානු චෙස් සම්මේලනයේ ද උපසභාපතිවරයෙකි.

චෙස් සම්මේලනයේ නව නිලධාරි මඬුල්ල මෙසේය. සභාපති - ලක්ෂ්මන් විජේසූරිය, නියෝජ්‍ය සභාපති - දීප්ති හේවාගීගන, උපසභාපතිවරු - දයාල් සිරිවර්ධන, දර්ශන හේවාවසම්, රජීන්ද්‍ර කලුගම්පිටිය, සන්ධ්‍යා කුමාරි අවිරුප්පොල, බුද්ධි පනාගොඩ, බුද්ධි අලහකෝන්, තුෂාන් වික්‍රමාරච්චි, රංජිත් තිලකරත්න (පාසල් චෙස් සංගමය විසින් තෝරාගත්) ලේකම් - මලිත් අකලංක, භාණ්ඩාගාරික - ඉරෝෂ් ජයසිංහ, තරග ලේකම් - ජගත් කෙටලවල, උප ලේකම් - සුමල් හොරවලවිතාන, විධායක කමිටුව - චින්තක වීරසිංහ, විදුර කොග්ගල, බුද්ධිනී වාකිෂ්ඨ, අකිල ප්‍රනාන්දු, කනිෂ්ක වැලිපිටිය, ජූඩ් ඩොරිසන්, රංජිත් වික්‍රමරත්න (පාසල් චෙස් සංගමය විසින් තෝරාගත්)





# සෙරීනා දෙවැනි වටයත් ජය ගනී

හය වරක් අමෙරිකානු විවෘත ටෙනිස් ශූරතාව දිනා ගෙන සිටින අමෙරිකානු ක්‍රීඩිකා සෙරීනා විලියම්ස් මෙවර තරගාවලියේ තෙවැනි වටයට පිවිසීමට සමත් වූවාය.

නිව්යෝක් නුවරදී පැවැති දෙවැනි වටයේ තරගයෙන් සෙරීනා හමුවේ ලෝක ශ්‍රේණිගත කිරීම්වල 117 වැනි ස්ථානයේ පසු වන 26 හැවිරිදි රුසියානු ක්‍රීඩිකා මාගරිටා ගැස්පාර්යාන් වට 2-0කින් පරාජයට පත් වූවාය. එහි ලකුණු තත්ත්වය වූයේ 6-2ක් සහ 6-4ක් ලෙසිනි.

සෙරීනාගේ 103 වැනි කේවල ජයග්‍රහණය මෙය වන අතර, ඇයගේ උත්සාහය වී ඇත්තේ ලොව වැඩිම ග්‍රෑන්ඩ් ස්ලෑම් කේවල ශූරතා දිනා ගත් ඔස්ට්‍රේලියාවේ හිටපු ක්‍රීඩිකා මාග්‍රට් කෝට්ගේ ශූරතා වාර්තාව සම කිරීමටය. ඇය මේ වන විට ශූරතා 24ක් දිනා ගෙන ඇති අතර, සෙරීනා සතුව ඇති ශූරතා සංඛ්‍යාව 23කි.

අවසන් වරට 2014දී එක්සත් ජනපද විවෘත ශූරතාව දිනා ගත් 38 හැවිරිදි සෙරීනා තරගාවලියේ තෙවැනි වටයේදී 2017 වසරේ ශූරිය වූ ස්ලෝන් ස්ටීවන්ස් සමඟ තරග වැදීමට නියමිතය. ඇය තෙවැනි වටයට පිවිසියේ ඔල්ගා ගොවර්ට්සෝවා ලකුණු 6-2ක් සහ 6-2ක් ලෙස පරාජය කරමිනි.

දෙවැනි වටයේ තවත් තරගයකදී ලෝක ශ්‍රේණිගත කිරීම්වල 27 වැනි ස්ථානයේ පසු වන බෙලරුස්හී වික්ටෝරි අසරෙන්කා 2-0 (6-1, 6-3) ක ජයක් හිමි කර ගත්තේ එම රටේම යොවුන් ක්‍රීඩිකා ආර්යානා සබලෙන්කා පරාජයට පත් කරමිනි. සබලෙන්කා ලෝක ශ්‍රේණිගත කිරීම්වල පසු වන්නේ 11 වැනි ස්ථානයේයි.

මේ අතර, තියුණු තරගයකින් පසු තරගාවලියේ පළමු වටය ජය ගත් එංගලන්ත ක්‍රීඩක ඇන්ඩි මරේට තරගාවලියෙන් ඉවත් වීමට සිදු වූයේ දෙවැනි වටයේ තරගයේදී කැනේඩියානු ක්‍රීඩක ෆීලික්ස් ඔගර් අලියාසයිම් හමුවේ වට 3-0කින් පරාජයට පත් වීම හේතුවෙනි. එහි ලකුණු තත්ත්වය සටහන් වූයේ 6-2, 6-3ක් සහ 6-4ක් ලෙසිනි.

SINCE 1978 42nd OBSERVER MOBITEL SCHOOL CRICKETER OF THE YEAR 2020
Recognizing talent, inspiring greatness.
Sri Lanka Telecom Mobitel
ඔබ සමගයි. සැමදා.

## 42 වන ඔබ්සවර් - මොබිටෙල් වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව - 2020

ඔබේ ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයාට / ක්‍රීඩිකාවට මනාපය පළ කර ඔහුව / ඇයව වසරේ ඔබ්සවර් - මොබිටෙල් වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව කිරුළ දක්වා රැගෙන යන්න.

☐ **වඩාත්ම ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා 2020**

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මගින් පවත්වනු ලබන 2019/2020 වයස අවු. 19 න් පහළ "පළමු, දෙවන සහ තෙවන කාණ්ඩ" අන්තර් පාඨශාලයීය තරඟාවලීන්හි දී තරඟ වදින ක්‍රිකට් ක්‍රීඩකයින්, මනාප ලැබීමට සුදුසු වේ.

☐ **වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩිකාව 2020**

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මගින් පවත්වනු ලබන 2019/20 වයස අවු. 19 න් පහළ "සමස්ත ලංකා අංශයේ" අන්තර් පාඨශාලයීය තරඟාවලීන්හි දී තරග වදින ක්‍රිකට් ක්‍රීඩිකාවන් මනාප ලැබීමට සුදුසු වේ.

ඔබේ ක්‍රීඩකයා : ..................

අංශය: පළමු කාණ්ඩය ☐ දෙවන කාණ්ඩය ☐ තෙවන කාණ්ඩය ☐

සමස්ත ලංකා ක්‍රීඩිකාව: ..................

**(එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංගු වේ)**

පාසල : ..................

ඔබේ නම : ..................

ලිපිනය : ..................

ජංගම දුරකථන අංකය : ..................

SUNDAY OBSERVER

vote.schoolcricketer.lk වෙත පිවිසීමෙන්ද ඔබගේ මනාපය ප්‍රකාශ කළ හැක.

**කූපන්පත් එවා සතිපතා ත්‍යාග දිනාගන්න.**

**ප්‍රථම ත්‍යාගය** : Mobitel 4G Wi-Fi router **දෙවන ත්‍යාගය** : රු. 2,500/-
**තෙවන ත්‍යාගය** : රු. 1,500/- **හතරවන ත්‍යාගය** : රු. 1,000/-

42 වන ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව නම් කිරීමේ තරඟාවලිය දැන් ආරම්භ කර ඇත. සම්පූර්ණ කරනලද ඉහත කූපනය ක්‍රීඩා සංස්කාරක, සන්ඩේ ඔබ්සවර්, ලේක්හවුස්, කොළඹ 10 වෙත තැපැල් කරන්න.

**කොන්දේසි :**

1) එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංගු වේ.
2) ලේක්හවුස් හෝ මොබිටෙල් ආයතනයේ සේවක / සේවිකාවන්ගේ දූ දරුවන්ට තරගයට සහභාගි විය නොහැක.
3) ජයග්‍රහණය කරනු ලබන අයට මුදල් / කුසලාන හා සහතිකපත් හිමි වේ. සෑම කූපනයකම එක් ක්‍රීඩකයෙකු පමණක් නම් කළ හැකි අතර, එය එක් තරඟ වාරයක් සඳහා පමණක් වලංගු වේ. තරඟාවලියේ අවසාන තීරණය සන්ඩේ ඔබ්සවර් ක්‍රීඩා සංස්කාරක සතු වේ.

**දිනය** 2020-09-05 **අංකය** 26

UNLIMITED
Facebook Instagram Twitter LinkedIn
රු. 99 + බදු අදාළ වේ
සක්‍රිය කිරීමට අමතන්න #170#
මොබිටෙල් 4G සමග සුපිරි අන්ලිමිටඩ් අත්දැකීමක්
4G LTE
Sri Lanka Telecom Mobitel

වර්ෂ 2020ක් වූ සැප්තැම්බර් මස 05 වැනිදා සෙනසුරාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.